

ISSN 2357-2973

# ජාතික පුස්තකාල විමර්ශන
# தேசிய நூலக நோக்குரு
# NATIONAL LIBRARY REVIEW

NATIONAL LIBRARY
NLSL OF SRI LANKA

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
**National Library & Documentation Services Board**

# ජාතික පුස්තකාල විමර්ශන

## தேசிய நூலக நோக்கு

# National Library Review

# ජාතික පුස්තකාල විමර්ශන

## தேசிய நூலக நோக்கு

# National Library Review

වෙළුම 04, කලාපය 01/02 ජනවාරි - ජුනි /ජූලි - දෙසැම්බර් 2022
தொகுதி 04,இலக்கம் 01/02 ஜனவரி –ஜூன் / ஜூலை – டிசம்பர் 2022
Vol. 04, No. 01/02 January - June / July - December 2022

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
**National Library & Documentation Services Board**

# National Library Review

Vol. 04 01/02 January - June / July - December 2022

ISSN 2357-2973



**Advisory Committee**

| | |
|---|---|
| Prof. W. A. Weerasooriya | Senior Professor, Department of Library & Information Science, University of Kelaniya |
| Dr. Champa Alahakoon | Deputy Librarian, University of Peradeniya |

**Editorial Advice**

| | |
|---|---|
| Prof. Nanda Darmarathna | Chairman, NLDSB |
| W. Sunil | Director General, NLDSB |

**Review of Articles**

| | |
|---|---|
| Mrs. A. M. S. Angammana | Senior Assistant Librarian University of Sri Jayawardanapura |
| Mr. J. J. G. Arachchige | Senior Assistant Librarian University of Colombo |
| Dr. G. D. Amarasiri | Former Director, NLDSB |

**Editorial Commettee**

| | |
|---|---|
| Senani Bandara | Director, (Library Promotion, Standardization and Publication)NLDSB |
| Malik Chaminda Dharmawardhana | Assistant Director Publication Division, NLDSB |
| Sajanthi Bopitiya | Publication Officer, NLDSB |

**Layout & Cover page Designed by**

| | |
|---|---|
| Thanuja Rangika | Management Assistant, NLDSB |



**Published by**

National Library and Documentation Services Board
No. 14, Independence Avenue, Colombo 07, Sri Lanka
Telephone : 011-2687583, 011-2698847-248 Fax : 011-2687583
Email : pub@mail.natlib.lk Web site : www.natlib.lk


***Authors are Responsible for the content their Articles Published in this Journal***

# Editor's Note

Library and Information Science (LIS) is an interdisciplinary field of study that centers on the documentation that records our stories, memory, history and knowledge. LIS professionals serve as custodians of printed materials, records, photographs, audio visual materials and ephemera, in both analog and digital form. Librarians and other information professionals collect, organize, preserve and provide access to these materials and are the stewards of the knowledge that they contain. We connect people to the resources that they need to understand their histories, communities and the world around them. We advocate for free and open access to these recourse and train folks to use these materials to better themselves and society as life-long learners.

Today, the role of the librarian has transformed into that of an information specialist. Also, at a time when the habit of reading is decreasing, libraries have a special responsibility in creating a reading society with knowledgeable people. The contribution that such journals can make for this is immense.

The Library Review Journal would also be an ideal platform for networking and sharing knowledge for professionals, researchers, academics and students in the relevant field locally and internationally. And it will generate a new knowledge in the field of LIS and Social Science field as well.

As the editor it is my pleasure to work with such accomplished authors and my great gratitude is extended to each author and specially I thank all the article reviewers of this journal.

# පටුන

පිටු අංකය


ඉන්දියාවේ මහජන පුස්තකාල සැලසුම්කරණය හා ව්‍යවස්ථා සම්පාදනය සඳහා එස්. ආර්. රංගනාදන්ගේ කාර්යභාරය 1-17

ආචාර්ය එම්. පි. සතිජා
පරිවර්තනය - ආචාර්ය ජී. ඩී. අමරසිරි

---

සංවෘත හා විවෘත ප්‍රවේශයිය ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනය හා තත් විෂයෙහි කූට ප්‍රකාශකයන්ගේ සම්ප්‍රාප්තිය : ශාස්ත්‍රීය සමාලෝචනයක 19-41

**Controlled and Open Access Scholarly Journal Publishing and Predatory Publishing (a Review)**

ලලිත් වික්‍රමනායක

---

**Evaluation of Library Resources and Services Provided by the Ayurvedic Medical Libraries in Sri Lanka** 43-65

Dr.(Mrs.) C.K.Gamage

---

ශ්‍රී ලංකාවේ සිංහල භාෂාමය සිනමා සාහිත්‍යය පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් (1947-2016 දක්වා පළ වූ ප්‍රකාශන ඇසුරින්) 67-81

උදිත අලහකෝන්

---

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල කළමනාකරණ පීඨ සිසුන්ගේ වාර සඟරා භාවිතය : කැලණිය විශ්වවිද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඇසුරින් 83-98

**Use of journalis by Management faculty Students in Sri lanka : A Study Based on University of Kelaniya and Sri Jayawardenepura**

පී. ඒ. අයි. පීරිස්

---

පාඨක තොරතුරු අවශ්‍යතා සාධනයේ දී මහජන පුස්තකාලවලින් ලැබෙන පිටිවහල පිළිබඳ අධ්‍යයනයක් (ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ සහ මඩකලපුව දිස්ත්‍රික්ක ඇසුරෙනි) 99-115

බී. ජී. රංගනී සහ ඒ. පී. ආර්. පී. කුමාර

# Library and Information Science

# ඉන්දියාවේ මහජන පුස්තකාල සැලසුම්කරණය හා ව්‍යවස්ථා සම්පාදනය සඳහා එස්. ආර්. රංගනාදන්ගේ කාර්යභාරය


**ආචාර්ය එම්. පි. සතිජා**

පරිවර්තනය - ආචාර්ය ජී. ඩී. අමරසිරි
හිටපු අධ්‍යක්ෂ
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
amarasirigd@gmail.com



The role played by Dr. S. R. Ranganathan for the public library legislation in various states in India has been discussed in this article. Dr Ranganathan is mainly responsible for planning, preparation and initiating library bills. He made a tremendous contribution for the promotion and development of libraries in India. He specially contributed for the improvement of libraries in poor and rural areas. This article also discusses about various committees and commissions for library development headed by Dr Ranganathan



**Keywords :** Public libraries, Library planning, Library legislation, India , S. R. Ranganathan

ශ්‍රේෂ්ඨ ඉන්දියානුවෙකු වශයෙන් ආචාර්ය එස්. ආර්. රංගනාදන්ගේ ජීවිතය හා කාර්යභාරය චින්තකයෙකු වශයෙන්, ගුරුවරයෙකු වශයෙන් හා ජාත්‍යන්තරවාදියෙකු වශයෙන් පෞරුෂය විදහා පෙන්වයි. තමන් උපන් රටේ අවශ්‍යතාවය අනුව විවිධ කාර්යභාර රාශියක් එකවර ඉටුකිරීමට ඔහුට සිදුවිය. ඔහුට එසේ කිරීමට හැකිවූයේ ඔහු තුළ තිබූ නිර්මාණාත්මක හා ප්‍රතිසංස්කරණ ශක්තිය නිසාය. විශාල වූ ලෝකය විවිධ පැතිකඩ ඔස්සේ දක්වමින් (වැඩි වශයෙන් ම අධ්‍යාත්මිකව) ඔහු තමාව ජාත්‍යන්තරවාදියෙකු ලෙස හැඳින්වීමට වැඩි කැමැත්තක් දැක්වීය. ජාත්‍යන්තර පුස්තකාලයාධිපතීත්වය ප්‍රවර්ධනය සඳහා ඔහු දැක්වූ උනන්දුව අගය කිරීමක් වශයෙන් ඇමරිකානු පුස්තකාලයාධිපතිවරුන් ඔහුව "ලෝක පුස්තකාලයාධිපතිවරයා" ලෙස හැඳින්වීය. හර්බට් කොබ්ලන්ස් (*Herbert Coblans*) හා ඒ. පී. ශ්‍රීවස්තාවා (*A. P. Srivastava*) විසින් ආචාර්ය රංගනාදන්ගේ මෙම පැතිකඩ පිළිබඳව ප්‍රමාණවත් ලෙස විස්තර කර ඇත.

ඔහුගේ ජාත්‍යන්තර කටයුතු හා න්‍යායාත්මක පදනම පිළිබඳ ඔහුගේ ප්‍රතිභාව තම රටතුළ පුස්තකාල ප්‍රවර්ධනය හා පුස්තකාල ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම සඳහා බාධාවක් කර නොගත්තේය. ඉන්දියානුවන් වන අප ඔහු ඉන්දියාවේ පුස්තකාල ව්‍යාපාරයේ පියා වශයෙන් සලකන අතර ඔහුගේ කාර්යභාරය ඊට වඩා පුළුල් වූ සමාජ වැදගත්කමකින් යුක්තය. කරුණු, ක්‍රමවේද, න්‍යාය හෝ දර්ශනයට වඩා ඔහු ඉගැන්වූයේ ආකල්ප හා හරයන්ය.

පුස්තකාල නොමැතිවිට නීති පහෙන් නිරූපණය වන මූලධර්මවල ප්‍රයෝජනය කුමක්ද? පුස්තකාල ගබඩාවක් ලෙස දකින සමාජයක වර්ගීකරණයේ අලංකාරය අගය කරන්නේ කවුරුන්ද? මෙම තත්ත්වය කාන්තාරයක ඇති මලක සුවඳ අපතේ යාමක් වැනි තත්ත්වයකි. එබැවින් පවතින සමාජ අවශ්‍යතාවය තේරුම් ගෙන පරිණත විද්‍යාඥයෙකු වශයෙන් තම ක්ෂේත්‍රයෙන් තරමක පරිබාහිර වූ කාර්යභාරයක් භාර ගැනීමට ආචාර්ය රංගනාදන්ට සිදුවිය. වෙහෙස නොබලා නිහතමානි ලෙස මෙම මෙහෙවර ඉටු කිරීමට රංගනාදන් නැමති මෙම දාර්ශනිකයාට සිදුවිය. ඔහුගේ නීති පහ පිළිබඳ මූලධර්මය ප්‍රචලිත කිරීමටද මෙම කාර්යභාරය ඉවහල් විය. එම මූලධර්ම දාර්ශනික හා ක්‍රමවිද්‍යාත්මක වැදගත්කමකින් මෙන්ම සමාජ වැදගත්කමකින්ද යුක්තය. ඔහු තම රටේ පුරවැසියන් පුස්තකාලවල පාඨකයින් බවට පත්කිරීමට කටයුතු කළේය. ජාතියක ආර්ථික, දේශපාලන, සංස්කෘතික හා බුද්ධිමය සංවර්ධනය සඳහා පුස්තකාලවල වැදගත්කම ඔහු නිතර පෙන්වා දුන්නේය. තොරතුරු සමාජයට පියවර තැබීම යනුවෙන් ලෝකය ඉගෙනගත්තේ මෙයයි. විධිමත් ලෙස අධ්‍යාපන ලැබූ ප්‍රජාවක් නොමැතිව ප්‍රජාතන්ත්‍රවාදයට මුල්බැසගත නොහැකි බව ඔහු පෙන්වාදුන්නේය. සියලුම දෙනාට නොමිලේ පොත් සේවාවක් නොමැතිව නිදහස් හා විශ්වීය අධ්‍යාපනය ළඟා කරගත නොහැකි බව ඔහු අවබෝධ කර ගත්තේය. නිදහස් පුස්තකාල නොමැති විශ්වීය අධ්‍යාපනය ඔහු හැඳින්වූයේ "වහලයක් නැති මැටිගෙයක් ලෙසය".

දේශපාලඥයින් හා නිලධාරීන් පුස්තකාල දකින්නේ ඵලදායිත්වයක් නොමැති දෙයක් ලෙසය. ඔවුන් පුස්තකාල දකින්නේ විකල්ප වශයෙන් පවතින අමතර දෙයක් ලෙසය. පොහොසත් ජාතීන්ට එම තත්ත්වය පත්වීමට ඔවුන්ගේ පොහොසත් දැනුම් හා තොරතුරු මධ්‍යස්ථාන හේතු වී ඇති බව ඔවුහු තේරුම් නොගනිති. කියවන ජාතිය ඉදිරියට යන අදහස ව්‍යාප්ත කිරීමට රංගනාදන් උත්සාහ කළේය. ජනතාවගේ ධනය ඉපයීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා පුස්තකාලවල ව්‍යාප්තිය උපකාරි වේ. තොරතුරු යනු ප්‍රාග්ධනයක් මෙන්ම සම්පතක්ද වේ. අප එය තේරුම් ගෙන ඇත්තේ දැන්ය.

ඉන්දියාවේ සාරවත් බුද්ධිමය හා සංස්කෘතික උරුමය පිළිබඳව සාඩම්බරයෙන් කටයුතු කළ ඒවා වැඩිදියුණු කිරීමට නිරන්තරයෙන් අවශ්‍ය වූ පුස්තකාලයාධිපතීන්, අධ්‍යාපනඥයින්, සමාජ ප්‍රතිසංස්කරණවාදීන්, දාර්ශනිකයින් හා දේශපාලඥයින් රංගනාදන්ට පෙරදු සිටියහ. ඉන්දියාවේ අතීත ශ්‍රී විභූතිය වර්ධනය කිරීමටත් විවිධ විද්වතුන් එය ඉගෙන ගැනීම සම්බන්ධයෙනුත් ඔවුන් උනන්දු වූහ. ඔවුන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ එම අරමුණ උතුම් වූවකි. නමුත් ඒ සඳහා ඔවුන් අනුගමනය කළ ක්‍රියාමාර්ග සාර්ථක නොවීය. මහජන පුස්තකාල මගින් සැමදෙනාටම නිදහස් පොත් සේවයක් ලබාදීම තම අරමුණ ඉටුකර ගැනීමේ එක් මාර්ගයක් ලෙස රංගනාදන් අවබෝධ කර ගත්තේය. නමුත් එවකට පැවති පුස්තකාලවල තත්ත්වය වැඩිදියුණු කිරීමට කිසිවෙකුත් කල්පනා කළේ නැත. පුස්තකාල භාවිතය සඳහා ජනතාව අවදි කිරීමේ කාර්යය ඔහුවෙත පැවරිණි. 1924-25 කාලයේදී බ්‍රිතාන්‍යයේ පුස්තකාල සංවිධානය පිළිබඳ ඔහුගේ අධ්‍යයනය ඔහුගේ සැලසුම් සකස්කර ගැනීමට ඔහුට උපකාරි විය. බ්‍රිතාන්‍ය පුස්තකාල සේවය හා එහි සැලසුම් ඔහුගේ අපේක්ෂාවන් වර්ධනය කළේය. 1925 දී ඔහු නැවත ඉන්දියාවට පැමිණියේය. සමස්ත ඉන්දියාවම ආවරණය වන පරිදි ඒකාබද්ධ පුස්තකාල ජාලයක් සැලසුම් කිරීමට ඔහු නිහඬව අධිෂ්ඨාන කර ගත්තේය. ඉන්දියාවේ පුස්තකාල සේවය දියුණු බටහිර රටවල පුස්තකාල සේවාවන්ට සමාන විය යුතු බව ඔහුගේ අපේක්ෂාව විය. මහජන පුස්තකාල පද්ධතියක් යනුවෙන් ඔහු අදහස් කළේ උගත්, නූගත් සියලුම පුරවැසියන්ට නොමිලයේ පොත් සේවයක් ලබාදෙන ඒකාබද්ධ ජාතික මට්ටමේ මහජන පුස්තකාල පද්ධතියකි. ව්‍යවස්ථා සම්පාදනය (*legislation*) මගින් ස්ථාපිත කරන මහජන පුස්තකාල පද්ධතියක් ඔහුගේ සිත තුළ පැවති එකම විසඳුම විය. අවිධිමත් පරිපාලන ක්‍රමවේද මගින් පුස්තකාල සේවාවක් ලබාදිය නොහැකි බවත් එවැනි කාර්යයක් සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන මූලික අවශ්‍යතාවය වන බවත් ඉන්දියානු පුස්තකාල ඉතිහාසය නැමති ග්‍රන්ථයේ බැරෝඩා (*Baroda*) පරිච්ඡේදයෙන් ඔහු පාඩමක් ඉගෙන ගත්තේය.

ඒ අනුව රටපුරා ව්‍යාප්ත වූ එකිනෙකට සම්බන්ධ පුස්තකාල දාමයකින් යුත් ඒකාබද්ධ පුස්තකාල පද්ධතියක් පිළිබඳව කල්පනා කළේය. ඔහුගේ අදහස වූයේ පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීම සාමාන්‍ය ආකාරයට සංවර්ධනය

කිරීම දැන් ප්‍රමාද වැඩි බවත් ඒ සඳහා පියවර කිහිපයක් එකවර ඉදිරියට තැබිය යුතු බවත්ය. මෙම ඉලක්කය පහසුවෙන් ළඟාවිය හැකි එකක් නොවන බව රංගනාදන් දැන සිටියේය. මෙවැනි පුස්තකාල පද්ධතියක් පිළිබඳව ඔහු යෝජනා කර අවධාරණය නොකළේ නම් කිසිවෙකුත් ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වනු ඇත.

ප්‍රමාද නොකරම ඉන්දියාවේ අනාගත පුස්තකාල පද්ධතිය හා එහි සංවර්ධනයට අදාළ සැලැස්ම ඔහු සකස් කළේය. සැම පුරවැසියෙකුටම ලැබිය යුතු පුස්තකාල සේවාවේ ප්‍රමිති ක්‍රමෝපායන් පිළිබඳව ඔහු පුළුල් ලෙස කල්පනාවට භාජනය කළේය. මේ සඳහා ඔහුට පළමු අවස්ථාව ලැබුණේ 1930 දෙසැම්බර් 26 සිට 30 දක්වා වරනාසිහිදී පැවති පළමු සමස්ත ආසියා අධ්‍යාපන සමුළුවේ පුස්තකාල සේවා අංශයේ ලේකම් ලෙස කටයුතු කිරීමට මහාචාර්ය පී. සෙසාද්‍රි විසින් ඔහුට ආරාධනා කළ අවස්ථාවේදීය. ඉන්දියාව සඳහා වන ආදර්ශ පුස්තකාල පනතේ කෙටුම්පත ඔහු එහිදි ඉදිරිපත් කළ අතර එහි එක් සැසියකදී මෙම කෙටුම්පත පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය විය. ආදර්ශ පනත් කෙටුම්පත පසුව ඔහුගේ පුස්තකාල විද්‍යාවේ නීති පහට (1931) ඇතුළත් කළ අතර මැඩ්‍රාස් පුස්තකාල සංගමයේ තුන්වන වාර්ෂික වාර්තාවටද (1931) ඇතුළත් කළේය. එම්. ඒ. ගෝපිනාත් (*M.A. Gopinath*) සඳහන් කරන ආකාරයට ඉන්දියාවේ පුස්තකාල ව්‍යවස්ථා සම්පාදනයේ වර්ධනයට මුල් වූ බීජය ඔහුගේ ආදර්ශ පනත් කෙටුම්පතයි. එය පනත සම්පාදනයේ තාක්ෂණික කොටසයි. ඊළඟට අවශ්‍ය වූයේ ඒ සඳහා සමාජ පිළිගැනීම සඳහා කටයුතු කිරීමයි. ඒ සඳහා සංවිධානාත්මක හා දේශපාලනමය සම්බන්ධතාවය අවශ්‍ය විය. මහජන පුස්තකාල සඳහා ඔහු ගෙනගිය වැඩපිළිවෙල ඔහුගේ වෘත්තිය ජීවිතයේ ආරම්භක අවධිය දක්වා දිවයයි. 1935 සිට 1940 දක්වා පුස්තකාල පිහිටුවීම සඳහා දිරිගන්වනු පිණිස කියවීමේ සමාජ ස්වරූපය පිළිබඳව ලිවීම ඔහු පුළුල් ලෙස සිදුකළේය. 1942 බොම්බායේ පැවති පස්වන සමස්ත ඉන්දියා පුස්තකාල සමුළුවේදීත් මෙම පනත් කෙටුම්පත සාකච්ඡාවට භාජනය විය. පනත් කෙටුම්පත ඉදිරිපත් කළ ආකාරය පිළිබඳව සියලුම සහභාගී වන්නන් සතුටට පත් වුහ. 1946 දී බොම්බාය විශ්වවිද්‍යාලයේදී "පුස්තකාල ව්‍යවස්ථා : ඇයි කුමක්ද කෙසේද" යන මාතෘකාව යටතේ පුළුල් දේශන දෙකක් පවත්වන ලදී. පුස්තකාලවල ප්‍රයෝජන හා පුස්තකාල ව්‍යවස්ථාවල වැදගත්කම පිළිබඳව ඔහු අඛණ්ඩව කතා කළේය. මේ පිළිබඳව ඇමතිවරයා සමඟ මෙන්ම සාමාන්‍ය ජනයා සමඟ වුවද සාකච්ඡා කිරීමට එක සමාන කැමැත්තක් තිබිණි. ඉන්දියාවේ ප්‍රවීන අධ්‍යාපනඥයෙකු මෙන්ම හිටපු අධ්‍යාපන ඇමතිවරයෙකු වන ආචාර්ය වී. කේ. ආර්. වී. රාවෝ සම්මුඛ සාකච්ඡාවදී සඳහන් කළේ රංගනාදන්ට පුළුල් වැඩපිළිවෙලක් (*Misson*) තිබූ බවයි. ජීවිතයට ශ්‍රේෂ්ඨ දේ රැගෙන එන්නේ එවැනි මෙහෙවරක් සහිත පුද්ගලයන්ය. ඔබතුළ යම් දැවෙන අපේක්ෂාවක් තිබෙන්නට ඇත. මෙම සියලුම ගුණාංග රංගනාදන් තුළ තිබිණි. "සියලුම දෙනාට නොමිලයේ පොත් සේවාවක්" යන තේමාව යටතේ ලිපි හා පොත්

රචනා කළේය.  1930 සිට 1964 දක්වා ආදර්ශ මහජන පුස්තකාල පනත් කෙටුම්පත් පහක් සකස් කළේය. ඉන්දියාව නිදහස ලබා ගැනීමට පෙර පහත සඳහන් සැලසුම් දෙක ඔහු සකස් කළේය.

- ඉන්දියාවේ පශ්චාත් යුධ පුස්තකාල ප්‍රතිසංස්කරණය (1944)
- ජාතික පුස්තකාල පද්ධතිය, ඉන්දියාව සඳහා සැලැස්මක් (1946)

බර්නාඩ් අයි. ඇල්මර් (*Bernard I Almer*) (1910--1979) සඳහන් කරන ආකාරයට පිටු 36 කින් යුත් මෙම පත්‍රිකාව ඔහුගේ වර්ගීකරණය පිළිබඳ වැදගත් කාර්යයට වඩා වැදගත් වූවකි.  කල්කටාවේ පිහිටුවා ඇති ජාතික පුස්තකාලය දිල්ලියට ගෙන ආ යුතුය යන අදහසද ඔහු ඉදිරිපත් කළේය. ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා පුස්තකාල පිහිටුවා ඒවා ඉන්දියාවේ සියලුම ප්‍රාන්තවල අධ්‍යයන හා විශේෂ පුස්තකාලවල සම්පත් සමඟ ඒකාබද්ධ කිරීම ඉදිරියේද ඉටුකිරීමට ඇති කාර්යය විය.

ඉන්දියානු පුස්තකාල සංගමය විසින් 1949 ජනවාරි මස නාග්පූර්හිදී සංවිධානය කරන ලද 8 වන සමස්ත ඉන්දීය පුස්තකාල සමුළුවේදී මෙම සියලුම පුස්තකාල පනත් කෙටුම්පත් අනුමත කරන ලදී.  ඉන්දීය රජයේ  එවකට අධ්‍යාපන කොමසාරිස්වරයා  වශයෙන් කටයුතු කළ ජෝන් සර්ජන්ට්ගේ ඉල්ලීම අනුව අධ්‍යාපනය පිළිබඳ සර්ජන්ට් සැලැස්මට  පසුව රංගනාදන් විසින් 1946 දී සකස් කරන ලද පත්‍රිකාව ඔහු කලින් සකස් කළ සංවර්ධන සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීමක් විය.  රංගනාදන් විසින් යෝජනා කරන ලද ජාතික පුස්තකාලය ප්‍රාදේශීය අධ්‍යයන මෙන්ම ව්‍යාපාර  පුස්තකාලවලද ඒකාබද්ධ පද්ධතියකි.  ජංගම සේවා සහිත ග්‍රාමීය පුස්තකාල ජාලයක්ද මෙයට අයත්වේ.  මේ සඳහා වන සමස්ත පොත් තොගය, කාර්යමණ්ඩල තනතුරු හා ප්‍රමාණය, ඔවුන්ගේ වැටුප් හා ශ්‍රේණි, මේ සඳහා වැයවන සමස්ත වියදම ඔහු ඇස්තමේන්තු කළේය.  අධිකාරිත්වය හා  ඥාණය මෙම කුඩා පත්‍රිකාවේ ලක්ෂණ වශයෙන් දැක්විය හැක.

ආදර්ශ පනත් කෙටුම්පත් පහෙන් වඩාත් වැදගත් පනත් කෙටුම්පත වන්නේ පුස්තකාල සංවර්ධන සැලැස්මයි.  එය ප්‍රාන්ත සඳහා පුස්තකාල පනත් කෙටුම්පතක් සහිත වූ ඉන්දියාව සඳහා තිස් අවුරුදු වැඩසටහනක් විය. (දිල්ලිය දිල්ලි විශ්වවිද්‍යාලය 1950) මෙම ග්‍රන්ථය පිටුපස ඇති පසුබිම් කතාව රසවත් වූවකි.  රටේ යෝජිත පුස්තකාල පද්ධතියේ ප්‍රධාන ආයතනය ලෙස ජාතික මධ්‍ය පුස්තකාලයක් ඇති කිරීම සඳහා රංගනාදන් බොහෝ කාලයක් කරුණු දැක්විය.  1948 දී ශ්‍රීමත් ජෝන් සර්ජන්ට් විසින් පත්කරන  ලද ජාතික මධ්‍යම පුස්තකාලය පිළිබඳ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් රංගනාදන් පත්කරන ලදී.  රංගනාදන් විසින් සකස් කරන ලද මධ්‍යම රජය හා ජාතික මධ්‍ය පුස්තකාල සංවර්ධන සැලැස්ම පිළිබඳ පනත් කෙටුම්පත කමිටුව විසින් අනුමත කරන ලදි.  මෙම කෙටුම්පත පිළිබඳව එවකට යුනෙස්කෝ පුස්තකාල අංශයේ ප්‍රධානියාව සිටි ඒ. ජේ. කාටර් විසින් සඳහන් කරන ලද්දේ ජාතික

පුස්තකාල සංවර්ධනය පිළිබඳව තමා මෙතෙක් දුටු වඩාත් සිත්ගන්නා හා උනන්දුව ඇතිකරන දැක්ම මෙය බවයි.

අනෙක් අය මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස්ද මේ හා සමානවම වැදගත් විය. පුස්තකාල සැලසුම්කරුවෙකු වශයෙන් ඔහු පිළිබඳ ප්‍රසිද්ධිය ඉන්දියාවෙන් පිටත පවා පැතිරිණි. පුස්තකාල ව්‍යවස්ථා (*legislation*) පිළිබඳ පුරෝගාමීන් වන බ්‍රිතාන්‍ය බලධාරීන් පවා ඔවුන්ගේ පුස්තකාල ව්‍යවස්ථා කටයුතු වැඩිදියුණු කර ගැනීම සම්බන්ධයෙන් ඔහුගෙන් උපදෙස් ලබාගත්හ. මෙම පනත් කෙටුම්පතේ නවතම සංස්කරණය "ආදර්ශ ඒකාබද්ධ පුස්තකාල පනත" නමින් හඳුන්වන ලදි. (*Herald of Library Science 11(3) July 1972 ( 219-225*) ජාතික මධ්‍ය පුස්තකාල පිළිබඳ මෙම පද්ධතිය ජාතික මට්ටමේ නීතිමය තැන්පතු පුස්තකාල (*copyright libraries*) හා නේවාසිකාගාර පුස්තකාල (*dormitory libraries*) වලින් සමන්විත වේ. එනම් සෑම ප්‍රධාන විෂයයක් සඳහාම ජාතික සේවා පුස්තකාල, ඉන්දියානු නැව් නවත්වන ඉන්දියාවේ හෝ විදේශ රටවල සෑම වරායකම ඇති කරන පුස්තකාල හා ජාතික සම්බන්ධිත පුස්තකාල යන පුස්තකාල වේ. මේවා විදේශ රටවල ඉන්දියාවේ සංස්කෘතික පුස්තකාල ලෙස කටයුතු කරයි. ජාතික පුස්තකාල අධිකාරියේ ජාතික පුස්තකාලයාධිපතිවරයාගේ, ජාතික පුස්තකාල කමිටුවේ හා අනෙකුත් නිලධාරීන්ගේ රාජකාරි පිළිබඳවද මේ මගින් විග්‍රහකර ඇත.

සෑම අධිකාරියකම පද්ධතියේ කළමනාකාරිත්වයේ කාර්යයන් පිළිබඳවද මේ මගින් විස්තරාත්මක ලෙස පැහැදිලි කර ඇත. මූල්‍ය කටයුතු පිළිබඳවද කරුණු දක්වා ඇත. සියලුම නීතිමය අවශ්‍යතා පිළිබඳවද නිරීක්ෂණය කර ඇත. අපේක්ෂිත සියලු කරුණු මෙම වාර්තාව මගින් ඉදිරිපත්ව තිබූ අතර ශ්‍රීමත් ජෝන් සර්ජන්ට් ඒ වන විට රටින් පිටව ගොස් තිබිණි. ඉන්දියානු නායකත්වය අවබෝධ කරවීම සඳහා රංගනාදන් හැකි ඉහළම ආකාරයෙන් කටයුතු කර තිබිණි. ඉන්දියාවේ ප්‍රථම අග්‍රමාත්‍යවරයා වූ ජවහර්ලාල් නේරු (1947-1964) (19) වෙත යුරෝපයේ සිට 1948 ජුලි 4 දාතමින් එවූ ලිපියේ මෙසේ සඳහන් කළේය:

**"හිතවත් පන්ඩිත් නේරු,**

මම ඔබව නොහඳුනන නමුත් මම ඔබට ලියමි. ඉන්දියානු ජාතික මධ්‍ය පුස්තකාලය පිළිබඳ මගේ වාර්තාව (දැනට කමිටුව විසින් සලකා බලනු ලබන) ඔබගේ ලේකම්වරයෙකු විසින් ඔබගේ අවධානය සඳහා යොමු කළ බව දිල්ලියෙන් පිටත් වීමට පෙර මම දැනගතිමි. අපගේ මාතෘභූමිය වෙනුවෙන් බොහෝ උසස් දේවල් කරමින් ඔබ කාර්ය බහුලව සිටින බැවින් ඔබව පෞද්ගලිකව හමුවීමට මම නොපැමිණියෙමි.

"ජාතික මධ්‍ය පුස්තකාලය පිළිබඳ මගේ වාර්තාවේ ප්‍රතිඵල පසුගිය පශ්චාත් යුධ වසර තුන තුළ මෙම රටවල ප්‍රායෝගික සංවර්ධනයන් තුළින් තහවුරු

වී ඇති බව දැනගැනීම තුළින් තහවුරු වී ඇති බව දැනගැනීම සතුටට කරුණකි."

"අප රටේ ජනතාවගේ ස්වයං අධ්‍යාපනය සඳහා ඉටුකළ යුතු අතිවිශාල වැඩ කොටසක් අප ඉදිරියේ ඇත." මහත්මා ගාන්ධිතුමා, ඔබතුමන් හා අනෙකුත් නායකයින්ගේ කාර්යභාරය තුළින් ළඟාකරගත් නව ජීවිතයට අනුවර්තනය වීම සඳහා එම ස්වයං අධ්‍යාපනය අවශ්‍ය වේ."

"මගේ තිස් අවුරුදු වැඩසටහන හා පුස්තකාල කෙටුම්පත් සහිත ඉන්දියාව සඳහා වූ පුස්තකාල සංවර්ධන සැලැස්මේ මේ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දක්වා ඇත."

"මා ආපසු ඉන්දියාවට පැමිණි පසු එම සැලැස්ම සමග මා ඔබ හමුවෙමි. දේශපාලන තත්ත්වය යහපත් වුවහොත් ජාතික පුස්තකාල පද්ධතිය ගොඩනැගීමට අදාළවන්නා වූ විවිකාධාර ගැටලු විසඳීමට ඔබට කාලය ලැබෙනු ඇත."

මෙම ප්‍රායෝගික සැලැස්ම මතකයෙන් ගිලිහී ඉන්දියානු සැලසුම්කරණයට අහිමිවේ යැයි රංගනාදන්ගේ සමීපතමයෙකු වූ එවකට දිල්ලි විශ්වවිද්‍යාලයේ උපකුලපති වශයෙන් කටයුතු කළ ශ්‍රීමත් මොරිස් ග්වයර් (Sir Maurice Gwyer) බිය පල කළේය. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් එය ප්‍රකාශයට පත්කර තිබිණි. අදාළ මුද්‍රිත පිටපත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත බෙදාහරින ලද අතර පසුව එය පුස්තකාල විද්‍යාවේ නීති පහ (*Five Laws of Library Science)*" *(Bombay ( Asia 1963*) ග්‍රන්ථයේ දෙවන සංස්කරණයට ඇතුළත් කරන ලදී. මෙම සැලැස්ම ඵලදායි ලෙස උපයෝගීකරගෙන ඇති බව මහාචාර්ය පි.එන්. කවුලා මහතාද පවසා ඇත. පහත සඳහන් ප්‍රාන්ත සඳහා පුස්තකාල පනත් කෙටුම්පත් දක්වා ඇති වර්ෂවලදී රංගනාදන් විසින් සම්පාදනය කරන ලදි. මඩ්රාස් (1946), මධ්‍යම පළාත (1946), බොම්බේ (1947), කොචින් (1947), ට්‍රැවන්කෝ (1947), එක්සත් පළාත (1949) හයිඩ්‍රබාද් (1953) මධ්‍ය ප්‍රදේශ (1957) බටහිර බෙංගාලය (1958) උත්තර් ප්‍රදේශ් (සංශෝධිත) (1958), කේරල (1959), මයිසෝර් (1961) සහ ඇසෑම් (1964).

මේ සියල්ල පනත් කෙටුම්පතක (*Bill*) අනුවාදයන් වූ අතර පසුව ඒවා ආදර්ශ ප්‍රාන්ත පුස්තකාල පනත වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදිඃ (*Herald of Lib.Sc II (3). July,1972(225 - 274*). මෙය ඒකාබද්ධ පුස්තකාල පනතට සමාන වූවකි. මෙම ප්‍රාන්ත පුස්තකාල පනත මගින් ප්‍රාන්ත මධ්‍ය පුස්තකාල සමූහ පද්ධතියක් ලබා දෙන ලදි. (ප්‍රාන්ත නීතිමය තැන්පතු පුස්තකාල, ප්‍රාන්ත නේවාසිකාගාර පුස්තකාල, ප්‍රාන්ත සේවා පුස්තකාල) මෙම පුස්තකාල ප්‍රධාන ඒවා ලෙස කටයුතු කරන අතර දිස්ත්‍රික් පුස්තකාල, නගර හා ග්‍රාමීය පුස්තකාල ධූරාවලි පිළිවෙල අනුව ක්‍රියාත්මක වේ. මෙම කෙටුම්පතට අනුව ප්‍රාන්ත පුස්තකාල අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර ප්‍රාන්ත පුස්තකාල කමිටුව මගින් ඒ සඳහා සහාය ලබාදේ. පළාත්

පුස්තකාල අධිකාරි ආයතන විසින් පළාත් පුස්තකාල පාලනය කරනු ලබයි. මෙම පද්ධතිය සඳහා මුල්‍ය පහසුකම් පුස්තකාල බද්දක් (*library levy*) මගින් ලබා ගැනීමට රංගනාදන් යෝජනා කරන ලදී. සෑම වර්ගයක්ම පුස්තකාලවල සේවා ප්‍රමිති නිර්වචනය කරන ලදි. නිලධාරීන්ගේ බලතල හා වගකීම්ද දක්වන ලදී.

ඉතිරි ප්‍රාන්ත කිහිපය සඳහා පනත් කෙටුම්පත් රංගනාදන්ගේ පිළිවෙල අනුගමනය කරමින් ඔහුගේ ශිෂ්‍යයින් හා මිත්‍රයින් විසින් කෙටුම්පත් කරන ලදි. සමහර පනත් කෙටුම්පත් පෞද්ගලිකවම අදාළ ඇමතිවරුන්ට භාර දෙන ලදි. එසේ කරන ලද්දේ ඒවා ඉක්මනින් නීතිගත කර ගැනීමේ බලාපොරොත්තුව ඇතිවය. මෙම කෙටුම්පත් "පශ්චාත් යුධ පුස්තකාල ප්‍රතිසංස්කරණය" නැමති ග්‍රන්ථයේ පුළුල්ව දක්වා ඇති විස්තරයන්ය. පුස්තකාල අනපනත් සම්පාදනය ඔහුගේ අරගලය පිළිබඳ කතාව සාදු හා සරාප් (*Sadhu and Saraf*), අබ්දුල් රහමන් (Abdul Rahman), ජෝගස් මිසර්, (*Jogesh Misra*), සී. ඩී. ශර්මා (*C. D. Sharma*) සහ වඩා විස්තරාත්මක ලෙස ආර්. එල්. මිට්ටාල් *R. L. Mittal* විසින් පැහැදිලි කර ඇත. මාතෘකාව පිළිබඳ රංගනාදන්ගේ ලේඛන පිළිබඳ ග්‍රන්ථනාමාවලියක්ද මිට්ටාල් ඉදිරිපත් කරන ලදී. සයිඩ් අලි. හශ්මි විසින් 1930 සිට 1972 දක්වා ඔහුගේ ආදර්ශ මහජන පුස්තකාල පනත්වල වෙනස්කම් අධ්‍යයනය කරන ලදි.

"පුස්තකාල පනත්වල විවිධ ප්‍රතිපාදන පිළිබඳව රංගනාදන්ගේ අදහස්වල දැඩි වෙනස් වීම් ඇතිවී ඇත". යනුවෙන් හශ්මි (*Hashmi*) අනාවරණය කරයි. ඉන්දියාවේ පුස්තකාල පනත් හා පනත් කෙටුම්පත්වල කාලවකවානු පිළිබඳ විස්තරයක් පී. එන්. කවුලා (*P. N. Kaula*) විසින් සකස් කර ඇත. රංගනාදන්ගේ කාර්යයන් පිළිබඳ විස්තරාත්මක හා පෞද්ගලිකමය විස්තරයක් කවුලා ඉදිරිපත් කරයි. රංගනාදන්ගේ එම කාර්යයන්හිදී ඔහු සමීප සහයෝග යෙන් කටයුතු කළේය. ඒ සම්බන්ධයෙන් ඔවුන් නිරන්තයෙන් ලිපි හුවමාරු කර ගත්හ. කවුලාගේ කාලවකවානු පිළිබඳ විස්තරය 1930 සිට 1967 දක්වා දිවෙන අතර එය අංග 32කින් සමන්විත වේ. රංගනාදන් තම ස්වයං චරිතාපදානයේද ඔහුගේ උත්සාහයන් පිළිබඳව කරුණු දක්වා ඇත.

රංගනාදන් මෙම පනත් කෙටුම්පත් සම්පාදනය කළේ නීති විශාරදයෙකුගේද දැනුම සහාය කර ගනිමිනි. සේවයට අමතරව, ඔහු යෝජනා කළ පුස්තකාල පද්ධතියට ස්ථිරව මුදල් ලබා ගන්නා මාර්ගයද ඔහු තහවුරු කළේය. ඔහු තම ජීවිතය පුරාම භෞතිකවාදි විරෝධියෙකු (*anti materialist*) වුවත් පනත් කෙටුම්පත්වල මුදල් පිළිබඳ වගන්තිවලදී ඔහු විශාල උනන්දුවකින් කටයුතු කළේය. නිතිපතාය හා අඛණ්ඩව කරන සේවාවන් සඳහා සැලකිය යුතු ලෙස අරමුදල් අවශ්‍යවන බව ඔහු දැන සිටියේය. පුස්තකාල පාඨකයින්ගෙන් බදු හෝ ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් ඔහු දැඩිලෙස විරුද්ධ විය. ඇමරිකානුවන් තම ජාතික පුස්තකාලය ඔවුන්ගේ ප්‍රධානම ව්‍යවස්ථාදායක ආයතනය වන කොංග්‍රසයට සම්බන්ධ කිරීම සම්බන්ධයෙන් ඔහු ඇමරිකානුවන්ට ප්‍රශංසා

කළේය. ඊට හේතුව ඒ මගින් අඛණ්ඩ ලෙස හා බහුල ලෙස මුදල් ප්‍රතිපාදන ලැබීමයි. මහජන පුස්තකාල පද්ධතිය සඳහා මුදල් ප්‍රතිපාදන ලබා ගැනීමේදී දානපතින්ගේ හෝ රජයේ මුදල් මත යැපීමට ඔහු කිසිදිනක කැමැත්තක් නොදැක්වීය. එබැවින් ඔහුට අවශ්‍යවූයේ පුස්තකාල පද්ධතිය සඳහා ස්ථිර ලෙස මුදල් ලැබීමේ ක්‍රමයකි. 1972 දී සම්මන්ත්‍රණයක් අමතමින් ඔහු මෙම ගැටළුව පිළිබඳව විස්තර කළේය.

අනෙකුත් මුදල් ලැබීමේ මාර්ග ඉවත දමමින් ඔහු සඳහන් කළේ "මුදල් ලබා ගැනීමේ එකම මාර්ගය මහජන මුදල් (*public funds*) බවය. මහජන මුදල් ස්ථිර ලෙස ලබා ගැනීමට කිසියම් සේවයක් සඳහා අවශ්‍යයෙන්ම නීතිමය ප්‍රතිපාදන තිබිය යුතුය. නීතිමය අනපනත් මත පදනම් වන ඕනෑම දෙයක් වඩා ස්ථාවර වේ. එය අපේ අත්දැකීමයි. එබැවින් මහජන පුස්තකාල සඳහා අරමුදල් ලබාදීම අනපනත් (*legislation*) මත පදනම් විය යුතුය. මෙම පනත් කෙටුම්පත්වල මූල්‍යමය වගන්ති යථාර්ථවාදී වන අතර අපේ රටේ වර්තමාන බඳු රටාවටද නිවැරදි ලෙස ගැලපී ඇත.

පුස්තකාල අණපනත් නීතිගත කරවා ගැනීමට ඔහු මහජන මතය යොමුකරගත් අතර තම මිතුරන්වද පෞද්ගලිකව ඒ සඳහා යොමු කර ගත්තේය. ඔහුට ලැබුණු විශාල ප්‍රමාණයක පිළිතුරුවලින් ප්‍රකාශවූයේ පුස්තකාල දැනටමත් රජය යටතේ පවතින අතර ඒ සඳහා ව්‍යවස්ථාමය ක්‍රියා මාර්ග අවශ්‍ය නොවන බවත්ය. එසේම එවැනි දෙයක් සඳහා කාලය තවම පැමිණ නොමැති බවය. බොහෝ අවස්ථාවල ඔහු මුහුණ පෑවේ බලාපොරොත්තු කඩවීම්වලටය. සමහර අවස්ථාවල මේ සඳහා කැමැත්තක් දැක්වූ අමාත්‍යවරයා ඉවත්ව යයි. සමහර අවස්ථාවල ආණ්ඩුව පෙරළෙයි. නිලධාරීන් ඔහුට සැලකුවේ නිතර නිතර කරදර කරන අහිංසක ධෛර්යවන්තයෙකු මෙන්ම දවල් සිහින දකින්නෙකු ලෙසය. අසාර්ථක වූ අවස්ථා නිතරම තිබිණ. දුර්වල පුද්ගලයෙකු නම් ජනතාවට රජයට හෝ පවතින තත්ත්වයන්ට දොස් පවරමින් මෙම සටන ලෙහෙසියෙන්ම අත්හරිනු ඇත. නමුත් ඔහු සටන අත් නොහරින ලද අතර නොසැලී දැඩිව සිටියේය. ඔහු අසාර්ථකවීම් ඉදිරියේ පසු නොබැස කටයුතු කළ සර්වසුභවාදියෙකි. සමහර අවස්ථාවල ඔහු සර්ව අශුභවාදි පුද්ගලයෙකු විය. ඊට හේතුව ඉන්දීය ජනතාවට ප්‍රමාණවත් නීතිගත පුස්තකාල සේවයක් ලබාදීමේදී අනවශ්‍ය ප්‍රමාදයක් සිදු කිරීමයි. ඊළඟ මොහොතේ මෙම කාර්ය ඉටුකර දෙන ලෙස ඔහු නැවත වරක් ඉල්ලා සිටී.

ප්‍රථම වරට ඉන්දියාවේ පුස්තකාල අනපනත් සම්මතවූයේ 1948 ජනවාරි මාසයේ එවකට මැඩ්රාස් නමින් හැඳින්වූ ප්‍රාන්තයේය. නීතිය බලාත්මක වූයේ 1950 මැයි 1 වන දින සිටය. මෙය රංගනාදන් හා ඔහුගේ සහායකයින් වසර 14ක් තිස්සේ වෙහෙස නොබලා අඛණ්ඩව සිදුකරන ලද උත්සාහයන්ගේ ප්‍රතිඵලයකි. 1948 මුල් පනත ඔහුගේ අවශ්‍යතාවයන්ට නොගැලපුනද ඔහු එයට එකඟවූ අතර එහි සංශෝධනයන් සඳහා දිගටම කටයුතු කළේය. ප්‍රථම පුස්තකාල පනත වෙනුවෙන් සියලුම ප්‍රසාදයන් මඩ්‍රාස් පුස්තකාල සංගමයට

ලබාදෙමින් ඔහු සඳහන් කළේ මෙම උතුම් අපේක්ෂාව ඉටුවීම ජීවිතයට විශාල ශක්තියක් බවයි. මෙම සටනින් ඔහු විශාල පන්නරයක් ලැබූ අතර ඔහු සඳහන් කළේ "කිසිදා දුර්මුඛ නොවෙමු. යහපත් දෙයක් ඉටුවීමට කාලය පැමිණි විට සියලු අයහපත් දේ පලා යයි" යනුවෙනි. මැඩ්රාස් පුස්තකාල පනත සම්මත කර ගැනීමේදී රංගනාදන්ගේ දායකත්වය පිළිබඳව ඔහුගේ මිතුරෙකු වන කේ. එම්. සිවරාවම් විසින් විස්තරාත්මකව ලේඛනගත කර ඇත. විවිධ පරාජයන් නිසා මඩ්‍රාස් ජයග්‍රහණය ආපසු හැරවුණු අවස්ථාද විය. බොහෝ කාලයක් යනතුරු වැඩිදුර කිසිවක් සිදු නොවීය. හයිඩ්‍රබාද් ප්‍රාන්තයේ 1955 දිත් ආන්ද්‍ර ප්‍රදේශ් ප්‍රාන්තයේ 1960 දීත් පුස්තකාල පනත් හඳුන්වා දෙන ලදි.

ආන්ද්‍රා ප්‍රදේශ් මහජන පුස්තකාල අධ්‍යක්ෂවරයා විසින් 1962 දි මහජන පුස්තකාල පිළිබඳ සම්මන්ත්‍රණයක් හයිඩ්‍රබාද් හිදි සංවිධානය කර ලදි. රංගනාදන්ගේ ශිෂ්‍යයෙකු වූ රාගව රෙඩි විසින් සම්මන්ත්‍රණය මෙහෙයවීම සඳහා රංගනාදන්ට ආරාධනා කරන ලදී. මහජන පුස්තකවල ගැටලු පිළිබඳව පුස්තකාලයාධිපතිවරුන් හා රජයේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීමට එය හොඳ අවස්ථාවක් විය. ඒ වන විට රංගනාදන් විසින් සකස් කරමින් සිටි කේරල මහජන පුස්තකාල පනත් කෙටුම්පත පිළිබඳව මහජන අදහස් අවබෝධ කර ගැනීමටද රංගනාදන් මෙය අවස්ථාවක් කර ගත්තේය. පනත් කෙටුම්පතේ විවිධ වගන්ති පිළිබඳව සාකච්ඡා පවත්වන ලදි. මෙම සාකච්ඡා නිසා තවදුරටත් පුස්තකාල පනත් සම්පාදන ක්‍රියාවලිය වෙනසකට භාජනය විය. කේරල පනත් කෙටුම්පත ඒ වන විටත් සම්මත කර ගැනීමට නොහැකි වූවත් 1962 හයිඩ්‍රබාද් සම්මන්ත්‍රණයේ පලදැරීමක් ලෙස මයිසෝර් මහජන පුස්තකාල පනත 1965 දී සම්මත විය.

ඉන්දියාවේ පුස්තකාල ව්‍යවස්ථා සම්පාදන ඉතිහාසයේ ප්‍රථමවරට ප්‍රාන්ත පුස්තකාල සේවාවක ප්‍රතිපාදන හඳුන්වා දෙන ලදී. පළාත් පුස්තකාල අධිකාරි ආයතන යටතේ සේවය කරන පුස්තකාලයාධිපතිවරු පැහැදිලිවම රාජ්‍ය සේවකයින් ලෙස සලකන ලදි. මයිසෝර් ප්‍රාන්තය (දැනට කර්නාටක) 1965 දී රංගනාදන් ගේ සභාපතිත්වය යටතේ මහජන පුස්තකාල පනත් කෙටුම්පත් කමිටුවක් පිහිටුවන ලද අතර ප්‍රාන්ත අධ්‍යාපන අමාත්‍යාවරයාද එහි සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ලදි. රංගනාදන්ගේ මුල් කාලීන පනත් කෙටුම්පත් නව පනත් කෙටුම්පත් සඳහා පදනම සකස් කරන ලද අතර 1966 දී රංගනාදන් කමිටුව කෙටුම්පත් කර නිර්දේශ කරන ලද පරිදි 1966 දී පුස්තකාල පනතක් බවට පත්විය. එවකට ආණ්ඩුකාරවරයා වූ බී. ඩී. ජැටි (*B. D. Jatti*) හා ප්‍රධාන අමාත්‍ය එස්. නිජලින්ගප්පා (*S. Nijalingappa*) සහ අධ්‍යාපන අමාත්‍ය එස්. අර්. කන්ති (*S. R. Kanthi*) යන අයගෙන් ඒ සඳහා සම්පූර්ණ සහයෝගය ලැබිණි. ඇත්තවශයෙන්ම, සියලුම අංශවලින් ඒ සඳහා පූර්ණ සහයෝගය ලැබිණි. එය සකස් කිරීම සඳහා රංගනාදන්ට සම්පූර්ණ නිදහස ලැබිණි. මහජන පුස්තකාල ව්‍යවස්ථා හා සේවාවලදී කර්ණාටක ප්‍රාන්තය ආදර්ශ ප්‍රාන්තයක් ලෙස තවමත් සලකනු ලබයි. පුස්තකාල අනපනත්

සම්මත කරගත් අනෙකුත් ප්‍රාන්ත වන්නේ මහාරාෂ්ඨ (1967) හා බටහිර බෙංගාලය (1979), මේන්පූර් (1988) කේරළ (1989), හර්යානා (1989), මිසෝරම් (1993), ගෝව (1994) ගුජරාට් (2001) සහ ඔරිස්සා (2001) යන ප්‍රාන්ත වේ. ඒ අනුව මුළු ප්‍රාන්ත සංඛ්‍යාව එකොළහකි. මේ සියලුම පනත් කෙටුම්පත් හා පනත් පදනම්වූයේ රංගනාදන්ගේ පනත් කෙටුම්පත් මතය. මෙහි සියලුම ගෞරව ඔහුට ලැබේ.

ඔහුගේ ඍජු කාර්යයන්ට අමතරව ඔහු වක්‍රලෙසද සහයෝගය දැක්වීය. යුනෙස්කෝ නියාමක ව්‍යාපෘතියක් වශයෙන් 1951 දී ඉදිකරන ලද දිල්ලි මහජන පුස්තකාලය තවත් කැපී පෙනෙන ජයග්‍රහණයකි. පුස්තකාල සංවර්ධනය සඳහා වැඩකිරීමට ඔහු හැමවිටම අන් අය දිරිමත් කළේය. කේ. පී. සිංහගේ සභාපතිත්වය යටතේ ඉන්දීය රජය විසින් 1957 දී පත්කරන ලද පුස්තකාල උපදේශ කමිටුව සඳහා ඔහුගේ කාලය කැප කළේය. වාර්තාව පළවූ විට ඔහු ඒ පිළිබඳව ස්වාධීනව තම අදහස් ඉදිරිපත් කළේය. ඔහුගේ අදහස් වෙනම පත්‍රිකාවක් ලෙස පුළුල් ලෙස සංසරණය කරන ලදි. සිංහ කමිටු වාර්තාවේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් ආචාර්ය ඩී.එම් සෙන් විසින් සම්පාදනය කරන ලද ආදර්ශ මහජන පුස්තකාල පනත් කෙටුම්පත ඔහු පුළුල් ලෙස අගැයීමට ලක්කරන ලදී. විවිධ අඩුපාඩු නොගැලපීම් හා ද්විත්වකරණයන් ඔහු පෙන්වා දෙන ලද අතර වටිනා යෝජනාද ලබා දෙන ලදී. ඒවා Herald of Library Science - 1964 ග්‍රන්ථයේ හා වෙනමද ප්‍රකාශයට පත්කරන ලදි. කේ. පී. සිංහ (1957) හා ඩී. එම්. සෙන් (1963) සභාපතිත්වය දරන ලද කමිටු දෙකටම ඔහුගේ ලේඛන වල බලපෑම ලැබිණි. ඩී. එම්. සෙන් විසින් සම්පාදනය කළ පනත් කෙටුම්පත හා රංගනාදන්ගේ ආදර්ශ පනත අතර බොහෝ සමානකම තිබිණි.

ඔහුගේ 1950 සැලැස්ම පදනම් වන්නේ 1941 සංගණනය මතය. 1961 සංගණනය හා ප්‍රාන්තවල දේශපාලන ප්‍රතිසංවිධානයත් රටේ මහජන මූල්‍ය රටාවේ වෙනස්කම්ද නිසා 1941 සංගණනය යල්පැනගිය එකක් බවට පත්විය.

සමහර ප්‍රාන්තවල පුස්තකාල පනත් කෙටුම්පත් සම්මත කිරීමත් ඒවායේ ක්‍රියාකාරිත්වයන් තුළිනුත් වසර ගණනාවක් තිස්සේ ලබාගත් අත්දැකීම් නිසා කලින් සැලසුම් සංශෝධනය කිරීමට රංගනාදන්ට අවශ්‍ය විය. ඒ අනුව 1964 දී මහජන පුස්තකාල සේවාවන් පිළිබඳ ජාතික සැලසුම්කරණය කෙරෙහි රංගනාදන් තම අවධානය යොමු කළේය. ඒ අනුව 1950 තිස් අවුරුදු සැලැස්ම සංශෝධනය කළේය. බැංගලෝර්හී ප්‍රලේඛන පර්යේෂණ පුහුණු මධ්‍යස්ථානය, බැංගලෝර්හී කාන්තා බහුතාක්ෂණික ආයතනයේ සමහර කාර්ය මණ්ඩල සාමාජිකයින් රංගනාදන්ගේ මගපෙන්වීම යටතේ කණ්ඩායමක් වශයෙන් මාස දෙකක් එකට කටයුතු කළේය. මහජන පුස්තකාල සේවාවන්ට සම්බන්ධ සැලසුම්කරණය, පුස්තකාල ධූරාවලිය, මිනිස්බලය, මුදල්, ප්‍රාග්ධනය, වියදම් හා අනපනත් ආදී සියලු අංශ විස්තරාත්මකව විමසුමට භාජනය කරන ලදී. රංගනාදන්ගේ ආදර්ශ මහජන පුස්තකාල පනත් කෙටුම්පත හැරුණු

විට ප්‍රකාශිත ප්‍රතිඵල මගින් පත්‍රිකා හතක් ආවරණය කරන ලදී. *Library Science with a Slant to Documentation (1964-281-414*) මෙම අරමුණ සඳහා සම්පාදනය වූ ප්‍රකාශනයකි.

මෙම කණ්ඩායම ගණන් බලන ලද ආකාරයට 1980 වන විට ඉන්දියාවේ මහජන පුස්තකාල පද්ධතිය මහජන පුස්තකාල සේවා ස්ථාන 250,000 කින් සමන්විත වනු ඇත. (සෑම පුද්ගලයින් 2000කටම එක් සේවා ස්ථානයක් බැගින්) මේ සඳහා යොදවන සේවක සංඛ්‍යාව 240,000 වන අතර එයින් 90,000ක් වෘත්තිකයින් වනු ඇත. රටපුරාම ඇතිවන සමස්ත පුස්තකාල පද්ධතිය සඳහා වන වියදම රුපියල් මිලියන 2,260ක් වනු ඇත. (කාර්ය මණ්ඩලය සඳහා මිලියන 1,130ක් ද කියවීම් ද්‍රව්‍ය හා අනෙකුත් වියදම් සඳහා මිලියන 1,130ක් වශයෙනි) මීට අමතරව ප්‍රාග්ධන වියදම් සඳහා තවත් රුපියල් මිලියන 1330ක් වැය වනු ඇත. සංවර්ධන සැලැස්මක් බැවින් එය අදියර කිහිපයකින් ළඟා කර ගත යුතු වන අතර එය රටේ ආර්ථික හා කාර්මික සංවර්ධන වැඩසටහන් සමග සම්බන්ධව ක්‍රියාත්මක කළ යුතු වේ. ඔහු සඳහන් කළ ආකාරයට "ඊළඟ සැලසුම් ගත කාලපරිච්ඡේද තුන තුළ ප්‍රමාණවත් වේගයකින් ආර්ථික හා කාර්මික සංවර්ධනය සිදුනොවුව හොත් ඊට සමානුපාතිකව පුස්තකාල ඉලක්ක ළඟා කර ගැනීම ප්‍රමාද වනු ඇත."

මෙම සියලුම පුස්තකාල අණපනත් අත්‍යවශ්‍ය බව ඔහු නැවත අවධාරණය කළේය. මෙම සැලැස්මට තරමක අවධානයක් යොමු කළද ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමක් එතරම් සිදු නොවීය. නමුත් රංගනාදන්ගේ සැලසුම් කුසලතාවය තවදුරටත් ප්‍රකටව පවතින අතර අනාගත පුස්තකාල සැලසුම්කරුවන් සඳහා ඒ මගින් මගපෙන්වීමක් ලැබෙනු ඇත.

අණපනත් සඳහා වූ අරගලය ඔහුගේ ජීවිතයේ අවසාන වර්ෂය දක්වා අඛණ්ඩව පැවතිනි. 1972 ජාත්‍යන්තර පොත් දිනය අවස්ථාවේදී මහජන පුස්තකාල පද්ධතිය පිළිබඳ සමස්ත ඉන්දීය සම්මන්ත්‍රණයක් 1972 අප්‍රේල් 28 සිට 30 දක්වා බැංගලෝර්හිදී ඔහු සංවිධානය කළේය. මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගි වූවන්ට රංගනාදන් අවධාරණයෙන් කියා සිටියේ මහජන පුස්තකාල පනත් 1972 අවසානයට පෙර සම්මත කරගත හැකිවන පරිදි තම රාජ්‍ය නිලධාරීන් සමග අවශ්‍ය කටයුතු කරන ලෙසයි. එවැනි උත්සාහයක නිෂ්ඵල බව ඔහුට පෙනී ගියද ඔහුගේ උනන්දුව ඉහළ මට්ටමක පැවති අතර තම හඬනැගීම දිගටම කළේය.

මාතෘකාව පිළිබඳ ඔහුගේ අවසාන ග්‍රන්ථය ප්‍රකාශයට පත්වූයේ ඔහුගේ අභාවයෙන් පසුවයි. එය මහජන පුස්තකාල පද්ධති පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ තුළනාත්මක අධ්‍යයනයක් වන අතර එය රංගනාදන් විසින් මෙහෙයවන ලද ඉහත සම්මන්ත්‍රණයේ සමුළු කලාපයයි.

ඔහු සඳහන් කළ ආකාරයට ලබා ගත් ජයග්‍රහණ සතුටුදායක මට්ටමේ නොපැවතිණි. සැලකිය යුතු මට්ටමින් හා අපේක්ෂා කළ පරිදි කරුණු සිදු

නොවූ බැවින් අදාළ විෂය පිළිබඳ ඔහු විසින් සම්පාදිත වැදගත් ලිපි කිහිපයක් එක් කොට ග්‍රන්ථයක් වශයෙන් සකස් කර රජයේ සහ විශේෂයෙන් අග්‍රාමාත්‍ය වරයාගේ අවධානයට යොමු කරන ලෙස පී. එන්. කවුලා ගෙන් ඉල්ලා සිටියේය. *Herald of Library Science* හි මුල්කාලීන පත්‍රිකා වශයෙන් පල කළ ලිපි ඇතුළත් මෙම ග්‍රන්ථයේ අදාළ මාතෘකා පිළිබඳ ඔහුගේ සංශෝධිත අදහස් ඇතුළත් පහත සඳහන් පත්‍රිකා පහ අඩංගු විය.

1. ආදර්ශ ඒකාබද්ධ පුස්තකාල පනත (*The Model Union Library Act*)
2. ආදර්ශ ප්‍රාන්ත පුස්තකාල පනත (*The Model State Libraries Act*)
3. ජාතික මධ්‍ය පුස්තකාල පද්ධතියක් (*A System of National Central Library*)
4. ජාතික විද්‍යා පුස්තකාල පද්ධතියක් (*A System of National Science Libraries*)
5. අණපනත් මත පදනම් වූ මහජන පුස්තකාල පද්ධතියක් සඳහා ජාතික ජාලයක් (*A National Grid for the Public Library System based on Legislation*)

අවසාන පත්‍රිකා දෙකේදී ඉන්දියාව සමග සංසන්දනය කරමින් අනෙකුත් රටවල ජාතික පුස්තකාල පද්ධති පිළිබඳව රංගනාදන් සමීක්ෂණයක් සිදු කරන ලද අතර ඒ මගින් අපේ රටේ අනාගත අවශ්‍යතා පිළිබඳව විවරණය කරන ලදී. මෙම උත්සාහයන්ගෙන් අපේක්ෂා කළ ප්‍රතිඵල නොලැබීමට පුළුවන. නමුත් අනෙකුත් වටිනා ලක්ෂණ සඳහා ඒවා ඉතා වැදගත් වේ. රංගනාදන් කවුලා කෙරෙහි විශ්වාසය තැබූ අතර ඔහු සඳහන් කළේ "කුමන ආකාරයෙන් හෝ මේ සඳහා අග්‍රාමාත්‍යවරයාගේ අවධානය ලබාගත හොත් ව්‍යවස්ථා මත පදනම් වු මහජන පුස්තකාල ජාලයක් මගින් සෑම දෙනා සඳහාම වූ නිදහස් පොත් සේවයක් ඉන්දියාවට ලබාගත හැකිය".

ඔහු තුළ තිබූ සර්වසුභවාදී බව හා උද්යෝගය නිසා ඔහුගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත වුවද ඉන්දියාවේ අනාගත පුස්තකාල පද්ධතිය සඳහා ඔහු සැලසුම් සකස් කළේය. 1980 වන විට ඉන්දියාවේ පුස්තකාල පද්ධතිය සම්පූර්ණ පිබිදීමකට ලක් කිරීමට ඔහු අපේක්ෂා කළ අතර එම පද්ධතිය ඉන්දියාව පුරාම සියලුම වර්ගවල මහජන පුස්තකාල සඳහා 240,000ක පුස්තකාලයාධිපතිවරු හා සෑම මට්ටමකම සහාය කාර්යමණ්ඩලවලින් ශක්තිමත් කිරීමටද ඔහුගේ අපේක්ෂාව විය. එය ඉන්දියාවේ පුස්තකාලවල අනාගතය පිළිබඳ පරමාදර්ශී දැක්මක් වන අතර ඉහළ අපේක්ෂාවක් සහිත වූවක් විය. ලබාගෙන ඇති ජයග්‍රහණ ඔහු සත්‍ය වශයෙන්ම අප ඉදිරියේ තැබූ දෙයට වඩා පහළ මට්ටමක් බව අප දනිමු. 1980 මහජන පුස්තකාලවල තත්ත්වය පිළිබඳ විස්තරයක් ආර්. එල්. මිට්ටාල් (*R, L. Mittal*) විසින් මෙසේ දක්වා ඇත.

1980 ජනවාරි වන විට තත්ත්වය නම් රටතුළ ජාතික මධ්‍ය පුස්තකාලයක් නොවීමය. එමෙන්ම එහි ප්‍රදේශ හතර සඳහා ජාතික පුස්තකාල සේවාවන් නොවීය. ප්‍රාන්ත මධ්‍ය පුස්තකාල පැවතියේ ප්‍රාන්ත 22න් 16කට (70%) පමණි. ඒකාබද්ධ පළාත් (*union territories*) 9න් මධ්‍ය පුස්තකාල පැවතියේ 5කට (55%) පමණි. දිස්ත්‍රික්ක 376න් දිස්ත්‍රික් පුස්තකාල පැවතියේ දිස්ත්‍රික්ක 236කටය (63%). ගම් 5,66,978න් ග්‍රාමීය පුස්තකාල පැවතියේ ගම් 50,000කටය (9%). නගර 2641න් නාගරික පුස්තකාල පැවතියේ නගර 1800ක් (68%) සඳහා පමණි. මුළු ප්‍රධාන නගර 29න් ජනගහනය ලක්ෂ 4ට හෝ ඊට වැඩි මහනගරවල මහ නගර පුස්තකාල පැවතියේ මහනගර 4ක පමණි. මහජන පුස්තකාල සඳහා වූ ඒකපුද්ගල වියදම ශත 5ක් තරම් වූ ඉතා සුළු අගයක් වූ අතර ඒ සඳහා වූ අවම ප්‍රමාණය එක් අයෙකුට රුපියල් 5කි. එමෙන්ම මහජන පුස්තකාල සේවාවන් ලැබුනේ සමස්ත ජනගහනයෙන් 10%කට පමණි. එය සාක්ෂරතාව සහිත ජනගහනයෙන් 20%කි. මේ මගින් වඩාත් වැඩි අවාසියක් අත්වූයේ ග්‍රාමීය ජනතාවටය. ජනගහනයෙන් පහෙන් හතරක් ජීවත්වන්නේ ග්‍රාමීය ප්‍රදේශවලය.

ජාතික පුස්තකාල ගණනාවක්, *NISSAT* යටතේ ඇති මධ්‍යස්ථාන, නීතිමය තැන්පතු පුස්තකාල, ප්‍රාන්ත මධ්‍ය පුස්තකාල සහ පන්චයාට් මට්ටමේ හෝ ප්‍රාදේශීය පුස්තකාල වර්තමානයේ අප සතුව ඇත. නමුත් එක්සත් රාජධානියේ ජාතික පුස්තකාලවල පවතින ආකාරයේ එකිනෙකට සම්බන්ධ වූ පද්ධතියක් මේවායේ දක්නට නැත. රංගනාදන් අපේක්ෂා කළ ආකාරයට ප්‍රාන්ත මධ්‍ය පුස්තකාල තම කාර්යයන් ඉටු නොකරයි.

ජාතියේ පුස්තකාල හා විඥාපන සේවාවන් සඳහා මධ්‍යගත පද්ධතියක අවශ්‍යතාව පවතී. මහජන පුස්තකාල මගින් සේවා ලබාදෙන ජනගහනය ඉතා කුඩාය. මහජන පුස්තකාල සඳහා වාර්ෂිකව (1985) වැය කරන රුපියල් මිලියන 30ක ප්‍රමාණය ඉතාමත් අල්පය. 1988 වන විට පැවති මහජන පුස්තකාල සංඛ්‍යාව 54,845ක් වූ අතර මහජන පුස්තකාල සඳහා වූ ඒක පුද්ගල වියදම රු 0.70ක් විය. ඒ සඳහා වූ නිර්දේශිත වියදම එක් අයෙකුට රු 10කි. ජයග්‍රහණ කාන්තාරයක ක්ෂේම භූමි වැනිය. පුස්තකාල නැමති ශුෂ්ක භූමි විශාල ප්‍රමාණයක් අස්වැද්දීමට ඇත. ඒ සඳහා අඛණ්ඩ සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ. රංගනාදන්ට ගොඩ නැගීමට අවශ්‍ය වූ පුස්තකාල ව්‍යුහය කිසිදා යථාර්ථයක් බවට පත්වූයේ නැත. ඒ වෙනුවට ඔහුගේ උත්සාහයන්ට හා අපේක්ෂාවන්ට නොගැලපෙන පිළිවෙලක් නොමැති පුස්තකාල වර්ධනයක් සිදුවිය. කිසිම පද්ධතියකින් සම්බන්ධ නොවූ පිළිවෙලක් නොමැතිව සිදු වූ පුස්තකාල වර්ධනයක් සිදු වී ඇත. ඔහුගේ සැලැස්මට අවශ්‍යවූයේ සමස්තයක් ලෙස එකිනෙකට සම්බන්ධ වූ පුස්තකාල පද්ධතියක් ගොඩ නැගීමය. ඔහුගේ සමාජ කාර්යභාරය අසාර්ථකවීමක් හෝ සාර්ථකවීමක් ලෙස විස්තර කිරීම අපහසුය. ජීවිතය හා ජයග්‍රහණය කෙරෙහි යමෙකුගේ එළඹුම මත එය රඳා පවතී. ඩී.ජේ. පොස්කට් (*D. J. Fosket*) සඳහන්

කරන ආකාරයට "රංගනාදන් යනු ඉන්දියාවේ පුස්තකාල පෝෂණය කළ හා සංවර්ධනය කළ පුස්තකාලයාධිපතීන් ස්වල්ප දෙනාගෙන් එක් අයෙකි. මහජන පුස්තකාල ව්‍යාප්තිය ප්‍රවර්ධනය හා විශේෂයෙන්ම දුගී හා ඈත ගම්වල පුස්තකාල නගා සිටුවීම සඳහා ඔහු උපරිම වශයෙන් දායක විය. එක් දෙයක් ස්ථිරවම කිව හැකිය. එනම් ඔහු ඔහුගේ කාලයට වඩා බොහෝ ඉදිරියෙන් සිටි අයෙකි. වර්තමාන තත්ත්වය සලකන විටද ඔහු අපේක්ෂා කළ පුස්තකාල පද්ධතිය තවමත් තිබෙන්නේ බොහෝ ඈතිනි. අප තුළ පවතින එකම බලාපොරොත්තුව ඔහු අප කෙරෙහි තැබූ විශ්වාසයයි. ඒ සඳහා ජනතාවගේ හා රජයේ අඛණ්ඩ පෙළඹීම හා කැපවීම අවශ්‍ය වේ. මහාචාර්ය කවුලා හා වෙලගා වෙන්කටපයාහ් (*Velaga Venkatappaiah*) වැනි උගතුන්ගේ හා විශේෂඥයින් අප අවශ්‍ය වන අතර පුස්තකාලවල වටිනාකම දේශපාලනඥයින්ට අවබෝධ කරවීමේ කාර්ය අඛණ්ඩව කරගෙන යාමේ හැකියාව ඔවුන්ට ඇත. ඔහුට අවශ්‍ය වූ පුස්තකාල පද්ධතිය වෙනුවෙන් වැඩකිරීමේ හා සමාජ හා අධ්‍යාත්මික මෙහෙවරක යෙදුනු එවන් විද්වතෙකුගේ සිහිනය සැබෑ කිරීමේ වගකීම අපට පැවරී ඇත.

ඉන්දියාවේ අම්රිට්සාර්හි ගුරු නනාක් දේව් විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයේ සම්මානිත මහාචාර්ය එම්. පී. සතිජා මහතා විසින් රචිත "*Public Library Planning and Legislation in India ( Role of S'R' Ranganathan*" නැමති ලිපියේ පරිවර්තනයකි)

# Serial Publication

# සංවෘත හා විවෘත ප්‍රවේශයීය ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනය හා තත් විෂයෙහි කූට ප්‍රකාශකයින්ගේ සම්ප්‍රාප්තිය: ශාස්ත්‍රීය සමාලෝචනයක

# Controlled and Open Access Scholarly Journal Publishing and Predatory Publishing (a Review)

ලලිත් වික්‍රමනායක

නියෝජ්‍ය පුස්තකාලයාධිකාරී

ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය

බෙලිහුල්ඔය

wwwk@lib.sab.ac.lk

## Abstract

Traditional scholarly journal publication retained by academia till early twentieth century. But the rapid development of printing trade, publishing sector and information and communication technology during twenty first century created remarkable changes to scholarly publishing. This in turn has formed innovative and profitable business environment – especially for legitimate publishers. The profitable nature of scholarly publishing sector caused many people to enter into this business. Among these, some could maintain quality and consistency of scholarly publishing while the others cheated intellectual properties of scholars. Initiation of Open Access – especially Gold Open Access initiation created new avenues to predatory publishers. This paper discusses exploitative and deceitful nature of traditional publishers and aggressiveness of predatory publishers appeared during past few

decades. It also deliberates how predatory publishers have negatively impacted for contemporary literature. The paper finally describes why scholars need to avoid these publishers and their publications and different measures that can be adopted to overcome aggressiveness and deception of predatory publishers.

**Keywords**: Scholarly publishing, Legitimate publishing, Predatory publishing, Open access initiation

## සාරසංක්ෂේපය

සාම්ප්‍රදායික සඟරා ප්‍රකාශනය ශාස්ත්‍රීය සේවාවක් ලෙස උසස් අධ්‍යාපන ආයතන සතුව තිබුණ ද එහි ඇති වාණිජමය වටිනාකම හඳුනා ගන්නා ව්‍යාපාරික පැලැන්තිය ක්‍රමයෙන් ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනය තම පාලනයට නතු කරගන්නේ එහි ඇති ස්වරූපය ද, වටිනාකම් ද විශාල පරිවර්තනයකට ලක්කරමිනි. මුද්‍රණ ක්ෂේත්‍රයේ මෙන්ම තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ සීඝ්‍ර වර්ධනය ප්‍රකාශන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා රාශියක් නිර්මාණය කරන අතර බුද්ධිමය දේපල සූරාකෑමට ඇති ප්‍රවණතාව වැඩි දියුණු කිරීම ද ඒ අතර වේ. තත්කාලීන ශාස්ත්‍රීය ප්‍රකාශනයේ ඇති ප්‍රකාශන ක්‍රියාදාමය පිළිබඳව ද, එමගින් ප්‍රකාශයට පත්වන සාධිකාරී සඟරා ප්‍රකාශනයේ ඇති ගුණදොස් හා විවේචන ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බලපෑමෙන් ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනයේ ඇති වූ වෙනස්කම් මෙන්ම කූඨ ප්‍රකාශකයින් සහ කූඨ ප්‍රකාශන කරලියට පැමිණීමෙන් ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශන ව්‍යයාමයට ද අධ්‍යතන අධ්‍යයන සමාජයට එමගින් ඇති කර ඇති හානිය සහ බලපෑම ද මෙහි දී විමසුමට ලක් කෙරේ. මීට අමතරව වර්තමානය වන විට පර්යේෂකයින්ට මෙන්ම අධ්‍යයන සමාජයට කූඨ ප්‍රකාශකයින්ගෙන් හා කූඨ ප්‍රකාශනවලින් ඇති කර ඇති බලපෑමත් එකී බලපෑමෙන් විනිර්මුක්ත වීමේ අවශ්‍යතාව ද ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ගද මෙහි දී සාකච්ඡා කෙරේ.

## හැඳින්වීම

සරලව ගතහොත් මිනිසා විසින් විවිධ වූ මාධ්‍ය උපයෝගී කරගනිමින් කරනු ලබන තොරතුරු ව්‍යාප්තිය, ප්‍රකාශනය (publishing) යනුවෙන් හඳුන්වනු ලැබේ.[1] ප්‍රකාශනයට ඇත්තේ මිනිසාගේ සම්භවයට තරම්ම දීර්ඝ ඉතිහාසයකි. අතීතයේ මිනිසා හුදෙක් තම දැනුම හා අත්දැකීම් පරපුරෙන් පරපුරට සම්ප්‍රේෂණය කිරීමේ අරමුණින් ප්‍රකාශනයේ යෙදුනත් වර්තමානයේ ඔහු එහි යෙදෙන්නේ සංකීර්ණ වූ අවශ්‍යතාවයන් රැසක් තම අභිලාශය වශයෙන් තබා ගනිමිනි. ඒ අතර තොරතුරු ප්‍රකාශනය (information dissemination), ප්‍රවෘත්ති ප්‍රකාශනය (news broadcasting and publishing) මෙන්ම වෙළඳ ප්‍රචාරණය (commercial advertising) ශාස්ත්‍රීය ප්‍රකාශනයන් අභිබවා ඇත්තේ වර්තමානයේ ඒවා විශාල වශයෙන් ලාභ ඉපැයීමේ මාර්ගයන් වී ඇති හෙයින් පමණක් නොව ප්‍රකාශනය හා සන්නිවේදනය අන්‍යෝන්‍යව එකිනෙක මත බලපවත්වන්නා වූ විෂය ද්වන්ධයක් ද වන හෙයිනි.

කෙසේ වෙතත් ග්‍රන්ථ ප්‍රකාශනය මෙන්ම ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනය ද වර්තමාන ලෝකයේ විශාල වශයෙන් ලාභ ඉපැයීමේ ව්‍යාපාර බවට පත්ව ඇත්තේ ඒ සඳහා ඇති අති විශාල ඉල්ලුම නිසාවෙනි. ඇමරිකාවේ Publishers

1 https://en.wikipedia.org/wiki/Publishing

Weekly[2] සඟරාව පෙන්වා දෙන ආකාරයට ලෝකයේ ප්‍රධාන ග්‍රන්ථ ප්‍රකාශකයින් 50 දෙනාගේ වාර්ෂික ශුද්ධ ලාභය ඇමරිකානු ඩොලර් බිලියන 50 ඉක්මවයි. උදාහරණ ලෙස එංගලන්තයේ Pearson සමාගම, එංගලන්තය, නෙදර්ලන්තය හා ඇමෙරිකාව ප්‍රධානව පිහිටුවා ඇති RELX Group සමාගම, කැනඩාවේ Thomson Reuters සමාගම, ජර්මනියේ Bertelsmann සමාගම, නෙදර්ලන්තයේ Wolters Kluwer සමාගම ආදිය වර්තමානයේ ලෝකයේ විශාල මෙන්ම වැඩිම ආදායම් ලබන ග්‍රන්ථ ප්‍රකාශන සමාගම් අතර කිහිපයක් වේ. මීට අමතරව ඉහත සඟරාව පෙන්වා දෙන ආකාරයට ඇමරිකාවේ Reed-Elsevier, ඇමරිකාවේ Wiley-Blackwell, ඇමරිකාවේ SAGE එංගලන්තයේ Taylor and Francis ජර්මනියේ Springer Nature යන සමාගම් ලෝකයේ වැඩිම ආදායම් ලබන ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනය ප්‍රධාන ව්‍යාපාරය කරගත් ආයතන කිහිපයකි. Larivière Haustein සහ Mongeon (2015)[3] දක්වන ආකාරයට 2006 වසරේ සිට 2013 වර්ෂය දක්වා ලෝකයේ ප්‍රකාශයට පත් කරන ලද ශාස්ත්‍රීය පර්යේෂණවලින් සියයට පනහකටත් වඩා වැඩි ප්‍රමාණයක් ඉහත සමාගම් පහ විසින් ප්‍රකාශයට පත් කර ඇති අතර සියයට 40ක ලාභ ආන්තිකයක් (profit margins) ඔවුන් විසින් වාර්තාකර ඇත.

තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇතිවන සීග්‍ර දියුණුව, ප්‍රකාශන ක්ෂේත්‍රය ද සීග්‍ර පරිවර්තනයකට ලක් කරයි. විශේෂයෙන්ම ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශන ක්ෂේත්‍රයට නව මංපෙත් හෙළි කරන මෙකී බලපෑම එහි සාම්ප්‍රදායික සංවෘත ප්‍රවේශයීය සඟරා සඳහා නව්‍ය වූ ව්‍යාපාරික මොඩියුලයන් ද්වන්ධයක් එනම් දෙමුහුන් සඟරා මොඩියුලය (hybrid journal) සහ පූර්ණ විවෘත ප්‍රවේශයීය සඟරා මොඩියුලය (open access model) හඳුන්වා දෙයි. ඒ අතරින් විවෘත ප්‍රවේශයීය මොඩියුලය තුළ උත්පන්න වන ස්වර්ණමය විවෘත ප්‍රවේශයීය මොඩියුලය (gold open access model) ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනයේ නිම් වළලු පුළුල් කරනවා පමණක් නොව ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනයේ විශාල පරිවර්තනයක් ද ඇති කරයි. මේ අතුරින් කුඨ ප්‍රකාශකයින් හා කුඨ ප්‍රකාශන කරලියට පැමිණීම මෙකී පරිවර්තනයේ තීව්‍රතාව පිළිබඳව ඇති හොඳම උදාහරණයයි.

ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශන ක්‍රියාදාමය පිළිබඳව ද, එමගින් ප්‍රකාශයට පත්වන සාධිකාරී සඟරා ප්‍රකාශනයේ ඇති ගුණදොස් හා විවේචන ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බලපෑමෙන් ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනයේ ඇති වූ වෙනස්කම් මෙන්ම කුඨ ප්‍රකාශකයින් සහ කුඨ ප්‍රකාශන කරලියට පැමිණීමෙන් ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශන ව්‍යායාමයට ද අධ්‍යතන අධ්‍යයන සමාජයට එමගින් ඇති කර ඇති හානිය සහ බලපෑම ද මෙහි දී විමසුමට ලක් කෙරේ. මීට

2 Publishers Weekly - https://www.publishersweekly.com/pw/reviews/index.html

3 The Oligopoly of Academic Publishers in the Digital Era/ Vincent Larivière , Stefanie Haustein, Philippe Mongeon/ Published: June 10, 2015 https://doi.org/10.1371/journal.pone.0127502/http://journals.plos.org/plosone/article?id=10.1371/journal.pone.0127502

අමතරව වර්තමානය වන විට පර්යේෂකයින්ට මෙන්ම අධ්‍යයන සමාජයට කූඨ ප්‍රකාශකයින්ගෙන් හා කූඨ ප්‍රකාශනවලින් ඇති කර ඇති බලපෑමත් එකී බලපෑමෙන් විනිර්මුක්ත වීමේ අවශ්‍යතාවය ද ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ගද මෙහි දී සාකච්ඡා කෙරේ.

පිටපත ද ප්‍රකාශනයට පත්වන්නේ සංවෘත පිටපතක් වශයෙනි. මෙකී සඟරා පරිහරණය සඳහා ද සාම්ප්‍රදායික සඟරාවලට මෙන්ම වාර්ෂික දායකත්වය ලබා ගත යුතුය. නැතහොත් පාරිභෝගිකයා විසින් අවශ්‍ය පර්යේෂණ පත්‍රිකා එකිනෙක මිල දී ගත යුතුය.

කෙසේ වෙතත් විද්‍යුත් ප්‍රකාශන මාධ්‍යයේ ඇති විවිධ වාසි අතර අඩු පිරිවැය, ප්‍රකාශන ක්‍රියාවලිය සඳහා ගතවන අඩු කාලය, කළමනාකරණයේ පහසුව, පරිහරණයේ පහසුව, වැඩි ඉල්ලුම, පාඨකයාගේ වැඩි රුචිය, නැවත නැවත පරිහරණය කිරිමේ හැකියාව හා පරිහරණයේදී ක්ෂය නොවීම, තැන්පත් කිරීමේ දී හා සංරක්ෂණයේ දී ඉඩ කඩ ගැටලුවක් නොවීම මෙන්ම ස්වයංක්‍රීය දත්ත පද්ධතීන් මගින් උද්ධාරයන් (citations) ගණනය කිරීමේ හැකියාව යනාදිය විශේෂිත වේ. උද්ධාරයන් ගණනය කිරීමේ හැකියාව වර්තමානයේ සඟරාවන් හී ගැටුම් සාධක (impact factor) තීරණය සඳහා ඍජුවම බලපානු ලැබේ. උද්ධාරයන් ඉහළ යද්දී අදාළ සඟරාවන් හී ගැටුම් සාධක ඉහළ යන අතර උද්ධාරයන් පහළට යද්දී එකී සාධක පහළ යයි. ඉහළ ගැටුම් සාධක ඇති බව සඟරාවක ගුණාත්මක භාවය පිළිබඳව වටිනා සාධකයක් හෙයින් පිළිගත් මට්ටමේ සඟරා ප්‍රකාශකයින් තම සඟරාවන් හී ගැටුම් සාධක ඉහළ මට්ටමේ තබා ගැනීම සඳහා තම ප්‍රකාශනයන් හී ගුණාත්මක බව පිළිබඳව වැඩි උනන්දුවක් දක්වයි. මේ සඳහා සඟරාවේ ප්‍රකාශයට පත්කිරීම සඳහා යොමු වන පර්යේෂණ පත්‍රිකාවන් හි අන්තර්ගතය සඟරාවේ විෂයපථය හා සැසඳීම, සංස්කරණ ක්‍රියාවලිය, භාෂාව හැසිරවීම, විෂය පිළිබඳ අඥාත විෂය විශේෂඥයන් විසින් පර්යේෂණ පත්‍රිකා ඇගයීම (blind peer review) වැනි ක්‍රියාවලියකට යටත් වේ. කෙසේ වෙතත් ඉහළ මට්ටමේ ගැටුම් සාධකය එක් අතකින් සඟරාව සඳහා පාඨක පිරිස, මූල්‍යමය ප්‍රතිලාභ හා පර්යේෂණ පත්‍රිකා ලැබීමේ අනුපාතිකය (acceptance rate) ඉහළ දමන අතර අනෙක් අතින් සඟරාවට හා ප්‍රකාශන ආයතනයට කීර්තියක් ගෙනදේ.

ශාස්ත්‍රීය සඟරා සඳහා වූ අන්තර්ජාලයේ බලපෑම මුල් යුගයේ ඉතා සරල වුව ද අද එය ඉතාම සංකීර්ණ ස්වරූපයක් පෙන්නුම් කරයි. ලෝකයේ ප්‍රමිති මට්ටමේ සියලුම ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශකයින් පමණක් නොව සාමාන්‍ය මට්ටමේ ප්‍රකාශකයින්ද වර්තමානය වනවිට තමා සතු වෙබ් අඩවියක් (website) හා පරිගණක දත්ත පද්ධතියක් (database) පවත්වාගෙන යයි. එමෙන්ම බොහෝ සඟරා සඳහා අත්පිටපත් යැවීමේ සිට ඒවා ප්‍රකාශයට පත්වන තෙක් සියලු කාර්යාවලියන් ඉටු කෙරෙන්නේ අන්තර්ජාලය හා විද්‍යුත් සන්නිවේදනය තුළිණි. අන්තර්ජාලය, ප්‍රකාශන ක්‍රියාවලියේ නිම් වළලු පුළුල් වීමට පමණක් නොව නව ප්‍රවණතාවන් රාශියක් බිහිකිරීමට ද ප්‍රධාන හේතුවක් විය. ඒ

අතර සංවෘත සඟරාව ස්වරූපමය වශයෙන් දෙමුහුන් සඟරා (hybrid journal) බවට පරිවර්තනය වීම ද, පූර්ණ විවෘත ප්‍රවේශයීය සඟරා (Open access journals) බිහිවීමද මෙම සංවර්ධනයේ සුවිශේෂ අවස්ථාවකි. ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනයේ නව මොඩියුලයක්වූ දෙමුහුන් සඟරා ඉටුකරනුයේ සංවෘත හා විවෘත පර්යේෂණ පත්‍රිකා එකම විද්‍යුත් ප්‍රකාශනයක ප්‍රකාශයට පත් කිරීමයි. දෙමුහුන් සඟරා තුළ ඇති විවෘත ප්‍රවේශයීය පර්යේෂණ පත්‍රිකා කතුවරයා විසින් (සමහරවිට කතුවරයා නියෝජනය කරන ආයතනය හෝ පර්යේෂණ අරමුදල විය හැක) ප්‍රකාශන වියදම (article processing fee) ගෙවීමේ පදනම යටතේ ප්‍රකාශයට පත්කරණ ලද ඒවා වන අතර අන්තර්ජාලයට පිවිසිය හැකි ඕනෑම අයෙකුට මෙම පර්යේෂණ පත්‍රිකා මිල ගෙවීමකින් තොරව අසීමිතව අවපතනය (download) කළ හැකිය. මෙම මොඩියුලය, කතුවරයා විසින් ගෙවීමේ මොඩියුලය (author pay model) මෙන්ම ස්වර්ණමය විවෘත ප්‍රවේශයීය මොඩියුලය (Gold open access model) වශයෙන් ද හඳුන්වයි.

මේ හැරුණ විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ මෙන්ම ප්‍රකාශන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවක් ලෙස හරිත විවෘත ප්‍රවේශයීය (Green open access model) ලෙස මොඩියුලයක් බිහි වීමද විශේෂත්වයකි. මෙම මොඩියුලයේ දී සාධිකාරී සඟරාවක සංස්කාරක වෙත ප්‍රථම වරට යැවීමට සූදානම් කළ පර්යේෂණ පත්‍රිකාවක අත්පිටපත (pre-print copy) ආයතනික විද්‍යුත් ගබඩාවක (institutional repository/ library repository) හෝ වෙනත් බාහිර විද්‍යුත් ගබඩාවක තැන්පත් කිරීමට අවකාශ ඇත. සමහර සඟරා විසින් අත්පිටපතෙහි සංස්කරණය කරන ලද අවසන් පිටපත (post-print copy) ඉහත දැක් වූ ආකාරයේ විද්‍යුත් ගබඩාවක තැන්පත් කිරීමට අවසර ලබා දේ. කෙසේ වෙතත් මේ සඳහා නිසි අවබෝධයක් ලැබීමට අදාළ ශාස්ත්‍රීය ප්‍රකාශනයේ කර්තෘ හිමිකම් අවසරය (copy right permission) නිසි පරිදි අවබෝධ කර ගත යුතුය. මේ හැරුණ විට එංගලන්තයේ ලෆ්බරෝ විශ්වවිද්‍යාලය (University of Loughborough) විසින් පවත්වාගෙන යනු ලබන ෂර්පා රෝමියෝ (SHERPA ROMEO)[4] දත්ත පද්ධතිය ද යොදා ගත හැකිය.

සාධිකාරී සඟරාවක ප්‍රකාශයට පත් වූ පිටපතට ප්‍රවේශ වීමට පාඨකයා විසින් ප්‍රකාශකට යම් මිලක් ගෙවිය යුතු නිසාවෙන් එහි භාවිතයේ යම් සීමාවන් මෙන්ම උද්ධාරයන් සීමා වීම ද සිදු වේ. එහෙයින් සඟරාවක සංස්කාරක වෙත ප්‍රථමවරට යැවීමට සූදානම් කළ පර්යේෂණ පත්‍රිකාවක අත්පිටපත හෝ අත්පිටපතෙහි සංස්කරණය කරන ලද අවසන් පිටපත ප්‍රකාශකගෙන් පරිබාහිර විද්‍යුත් ගබඩාවක තැන්පත් කිරීම පර්යේෂණ පත්‍රිකාවේ උද්ධාරයන් (citations) ඉහළයාමට සෘජුවම බලපාන බව විශ්ලේෂකයින්ගේ මතයයි. කෙසේවෙතත් මෙය හුදෙක් සංවෘත පර්යේෂණ පත්‍රිකා සඳහා පමණක් අදාළ වන්නේ විවෘත ප්‍රකාශන නිරායාසයෙන්ම එකී සම්භාවිතාවෙන් අනූන හෙයිනි. මීට අමතරව, ඉහත ක්‍රියාවලිය ආයතනික (විශේෂයෙන් විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන) තරාවන් (ranking) ඉහළ දැමීමට ද විශාල කාර්යභාරයක් ඉටු කරයි.

4 http://www.sherpa.ac.uk/romeo/index.php

## සාධිකාරී සඟරාවක් වෙත පර්යේෂණ පත්‍රිකා යැවීම සහ ඇගයීමේ ක්‍රියාවලිය

සංවෘත හෝ විවෘත වේවා, ඉහළ මට්ටමේ සාධිකාරී (authentic) සඟරාවක් සඳහා පර්යේෂණ පත්‍රිකා ලබා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් ඇත. මුලින්ම පර්යේෂකයා විසින් තම පර්යේෂණ පත්‍රිකාවේ විෂය ක්ෂේත්‍රයට අදාළව තම පර්යේෂණ පත්‍රිකාවේ ස්වභාවය හා තත්ත්වයට ගැළපෙන ඉහළ මට්ටමේ සාධිකාරී සඟරාවක් තෝරා ගන්නා අතර එහි ප්‍රධාන සංස්කාරකවරයා වෙත තම අත්පිටපත යොමු කරයි. අතීතයේ මෙය ඉටු කරගත්තේ තැපෑල හරහා මුද්‍රිත අත්පිටපත සංස්කාරකවරයා වෙත යැවීම මගින් වුවත් වර්තමානයේ බොහෝ විට මෙය සිදු වන්නේ විද්‍යුත් තැපෑල හරහා සංස්කාරකවරයා වෙත යැවීම, කෙලින්ම සඟරාවේ දත්ත පද්ධතියට හෝ සඟරාව වෙනුවෙන් ක්‍රියාත්මක පරිබාහිර දත්ත පද්ධතියකට[5] උත්පතනය කිරීම (upload) තුළිනි. ඉහත දැක්වූ ක්‍රම අතරින් මොනයම් ක්‍රමයකට හෝ තමා වෙත ලැබෙන පර්යේෂණ පත්‍රිකා සඟරාවේ ප්‍රධාන සංස්කාරක විසින් ඇගයීමකට ලක් කරයි. මෙහිදී සංස්කාරකවරයා විසින් පර්යේෂණ පත්‍රිකාව සඟරාවේ විෂය පථය හා අරමුණු සමග සැසඳීම ද, එහි නව්‍ය බව ද, උසස් බව ද, පාඨකයන් ඇති බව ද සැලකිල්ලට ගනියි. ඉහත කාරණා සම්පූර්ණ කරන පර්යේෂණ පත්‍රිකාවක් අවම වශයෙන් අඥාත විෂය විශේෂඥයන් දෙදෙනෙකුට යවන අතර එසේ නොවන පර්යේෂණ පත්‍රිකා බැහැර කරයි. අඥාත විෂය විශේෂඥයන් විසින් තමන් වෙත සඟරාවෙන් ලබාදෙන ලද මාර්ග නිර්දේශයන් ඔස්සේ අදාළ පර්යේෂණ පත්‍රිකාව විධිමත් විමර්ෂණයකට (review) ලක් කරන අතර, පර්යේෂණ පත්‍රිකාව තත් සඟරාව සඳහා සුදුසු මට්ටමක නොමැති නම් බැහැර කිරීමට යෝජනා කරන අතර වැඩිදුර විමර්ෂනය නොකරයි. කෙසේ වෙතත් පර්යේෂණ පත්‍රිකාව ඉහත දැක් වූ කාරණා සියල්ලගෙන්ම පිළිගත හැකි මට්ටමක පවතී නම් නිසි විමර්ෂනයකට ලක්කර, ගුණ දොස් යෝජනා හා නිර්දේශ සටහන් කර ප්‍රධාන සංස්කාරක වෙත යවයි. මෙහිදී ද ප්‍රධාන සංස්කාරකට තත් පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශනය සඳහා භාර ගැනීම, බැහැර කිරීම හෝ අඥාත විෂය විශේෂඥයන්ගේ යෝජනා හා නිර්දේශ වලට අනුකූලව සංස්කරණය කර නැවත ඉදිරිපත් කිරීමට පර්යේෂකට හෝ කතුවරයාට අවසර දීම කළ හැකිය. ඉතා ඉහළ මට්ටමේ පර්යේෂණ පත්‍රිකාවක් එළි දැක්වීම සඳහා මෙකී ක්‍රියාවලිය එනම් අඥාත විෂය විශේෂඥයන් විසින් විමර්ෂණය කිරීම ඉතාම වැදගත් අතර සමහර පර්යේෂණ පත්‍රිකා සඳහා මෙකී ක්‍රියාවලිය නැවත නැවත සිදුවිය හැක්කේ එකී පර්යේෂණ පත්‍රිකාව ඉතාමත් සුදුසු මට්ටමකට අනුගත කිරීමටයි. සංවෘත වේවා විවෘත වේවා ඕනෑම සාධිකාරී සඟරාවක් සඳහා මෙකී ක්‍රියාදාමය පොදු වුවත් සඟරාවේ ප්‍රමිතිය හා තත්ත්වය අනුව එහි අඩු වැඩි කම් ඇතිවිය හැකිය. එමෙන්ම ප්‍රකාශන ක්‍රමවේදය අනුව පමණක් වෙනස් වන මෙකී සඟරා දෙවර්ගයේ කර්තෘ හිමිකම් අවසරය ද එකිනෙකට අදාළව වෙනස් විය හැකිය.

5 https://mc.manuscriptcentral.com/pj-ieee

## සාම්ප්‍රදායික සඟරා ප්‍රකාශනය සඳහා ඇති විවේචනය

වර්තමානය වනවිට සාම්ප්‍රදායික සඟරා ප්‍රකාශකයින් තම බොහෝ සංවෘත සඟරා දෙමුහුන් සඟරා වශයෙන් එළි දැක්වුවත් ඔවුන්ගේ ව්‍යාපාරික ස්වභාවය හුදෙක් ලාභ ඉපයීම මතම රඳී ඇති හෙයින් විද්වතුන්ගේ නිබඳ විවේචනයන්ට ලක්වේ. අන්තර්ජාලය තම ව්‍යාපාරයට එක්කර ගැනීමට ප්‍රථම මෙකී ප්‍රකාශකයින් මුද්‍රිත මාධ්‍ය පමණක් තම ප්‍රකාශන මාධ්‍ය ලෙස භාවිත කළත් ඔවුන්ගේ සඟරා සඳහා දායකත්වය ලබා ගැනීමට පුස්තකාලවලට, විවිධ සංවිධානවලට හා තනි පුද්ගලයන්ට අති විශාල මුදලක් වැය කිරීමට සිදු විය. මෙම ප්‍රකාශකයින් අන්තර්ජාලය තම ප්‍රකාශන මාධ්‍ය කරගැනීමෙන් අනතුරුව වුවද හඳුන්වාදෙන දෙමුහුන් සඟරාවන් හි අන්තර්ගත, සංවෘත පර්යේෂණ පත්‍රිකා පරිශීලනය කිරීමට අදාළ ආයතනයන් හෝ තනි පුද්ගලයන් තත් සඟරාව සඳහා දකත්වය ලැබිය යුතුය. නැතහොත් එක් එක් පර්යේෂණ පත්‍රිකා වෙන වෙනම මිල දී ගත යුතුය. මෙම ක්‍රියාදාමය තුළ ඇති අප්‍රසන්න ස්වභාවය වන්නේ පර්යේෂකයා තම බුද්ධිය, කාලය, ධනය හා ශ්‍රමය වැයකොට නිර්මාණය කරන පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශයට පත් කරමින් ප්‍රකාශකයා විශාල ආදායමක් ලැබීමත් එමගින් කතුවරයාට කිසිදු ආර්ථික වාසියක් නොලැබීමත්ය. එපමණක් නොව මෙකී සාධිකාරී සඟරා වැඩි ප්‍රමාණයක ප්‍රධාන සංස්කාරකවරු සහ අනෙකුත් සංස්කාරක මඬුල්ල මෙන්ම අඥාත විෂය විශේෂඥයන් තම බුද්ධිය, ශ්‍රමය හා කාලය මෙකී සඟරා සඳහා වැය කරන්නේ කිසිදු ගෙවීමකට යටත්ව නොවේ. මෙම ප්‍රකාශන මොඩියුලයේදී කතුවරයා ප්‍රමුඛ මෙකී සියලු දෙනාටම මෙමගින් ඇති එකම ප්‍රතිඵලය වන්නේ මෙකී විෂයෙහි තමාට ලැබෙන පළපුරුද්ද හා කීර්තිය පමණි. සරලව පවසතොත් මෙම මොඩියුලයේ දී ප්‍රකාශක විසින් පර්යේෂණ පත්‍රිකා, ප්‍රකාශනයේ අයිතිය (copy right) සහ ශ්‍රමය නොමිලේ ලබා ගත්තත් එකී ප්‍රකාශන පරිහරණය සඳහා පාඨකයන්ට අවකාශ ලබා දීමට විශාල මුදලක් අයකරයි. Gray iy Lawson[6], 2016 අප්‍රේල් මස The Guardian පුවත්පතට "It's time to stand up to greedy academic publisher" යනුවෙන් ලිපියක් ලියමින් සාධිකාරී සඟරා ප්‍රකාශනයේ මාෆියාව හෙවත් අප්‍රසන්න ස්වභාවය මනාව හෙළිකරයි. ඔවුන් සඳහන් කරන ආකාරයට එංගලන්තයේ උසස් අධ්‍යාපන ආයතන පමණක් වසරකට පවුම් මිලියන 180 කට වඩා සඟරා දායකත්වය සඳහා වැය කරන අතර ලෝකයේ බොහෝ උසස් අධ්‍යාපන ආයතන මේ වනවිට මේ සඳහා දැරීමට සිදුවන අතිවිශාල මුදල දරා ගත නොහැකිව මැසිවිලි නගයි. ස්වර්ණමය විවෘත ප්‍රවේශයීය මොඩලය හඳුන්වා දීමෙන් පසුව පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශනයට වැයවන මුදල (article processing charges or APCs) කතුවරයාගෙන්, කතුවරයා නියෝජනය කරන ආයතනයෙන් හෝ පර්යේෂණය සඳහා අරමුදල් සැපයූ ආයතනයෙන් හෝ අරමුදලෙන් ලබාගෙන අදාළ පර්යේෂණ පත්‍රිකාව විවෘත

6 https://www.theguardian.com/higher-education-network/2016/apr/18/why-academic-journals-expensive

ප්‍රවේශයීය පර්යේෂණ පත්‍රිකාවක් ලෙස ප්‍රකාශනයට පත් කිරීමෙන් එයට මිලක් නොගෙවා සැමට සැමදා පරිහරණය කළ හැකි වුවත් ඉහත ගැටලුවට මෙමගින් ද විසඳුම් නොලැබෙන්නේ ප්‍රකාශකයින් විසින් පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශනයට වැයවන මුදල ලෙස අති විශාල මුදලක් එනම් ඩොලර් 500 පමණ සිට ඩොලර් 5000 ක් තරම් අයකිරීමයි.

## විවෘත ප්‍රවේශයීය ප්‍රකාශනයේ දැකිය හැකි සාධනීය ලක්ෂණ හා අසාධනීය ලක්ෂණ

අන්තර්ජාල පහසුකම් ඇති ඕනෑම තැනක සිට විවෘත ප්‍රවේශයීය සඟරාවකට හෝ සංවෘත ප්‍රවේශයීය සඟරාවක ඇති විවෘත ප්‍රවේශයීය පර්යේෂණ පත්‍රිකාවන්ට ප්‍රවේශ වීමට, ඒවා අවපතනය කිරීමට හා පරිශීලනයට මුදල් ගෙවීම, දායකත්වය ලැබීම වැනි කිසිදු සීමාවක් හෝ බාධාවක් නොමැති වීම මෙම ප්‍රකාශන මොඩියුලයේ ඇති ප්‍රධානම සාධනීය ලක්ෂණයයි. එමෙන්ම සංවෘත ප්‍රවේශයීය ප්‍රකාශන හා සැසඳීමේ දී විවෘත ප්‍රවේශයීය ප්‍රකාශනයන් සඳහා උද්ධාරය ලැබීමේ වැඩි ප්‍රවණතාවක් ඇත. මේ හැරුන විට ප්‍රකාශනගතවන කාලය අවම වීම, අදාළ වෙබ් අඩවි සඳහා පහසුවෙන් යොමු විය හැකි වීම, පසුගිය කලාප ඉතා ඉක්මනින් ලබාගතහැකි වීම හා භාවිතයේ පහසුව මෙන්ම වාර්ෂිකව ඉහළ යන සඟරා මිල සඳහා මෙය හොඳ විසඳුමක් වීම අනෙකුත් සාධනීය ලක්ෂණයි.

පාඨක සේවාවක් ලෙස සඟරා සඳහා දායකත්වය ලබන පුස්තකාල, පර්යේෂණායතන හා අනෙකුත් ආයතන මෙන්ම නිරන්තරව සඟරා පරිහරණය කරන විද්වතුන්ට විවෘත ප්‍රවේශයීය ප්‍රකාශන හොඳ විසඳුමක් වුවත් ඉහතදී ද පෙන්වා දුන් ආකාරයට පර්යේෂකයන්ට, විශ්වවිද්‍යාල හා පර්යේෂණායතනයන්ට මෙන්ම පර්යේෂණ සඳහා අරමුදල් සපයන විවිධ සංවිධානවලට මෙය හොඳ විසඳුමක් නොවන්නේ ඔවුන් විසින් තම පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශ කරවා ගැනීමට ප්‍රකාශකයින්ට විශාල මුදලක් ගෙවීමට සිදු වීමයි. බොහෝ සාධිකාරී සඟරා, පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශනයට වැයවන මුදල ලෙස අයකරන මුදල පිළිබඳ විනිවිදභාවයක් නොවීමත්, එකම ප්‍රකාශකයකුගේ වුවද ප්‍රකාශනයෙන් ප්‍රකාශනයට අයකිරීම් විවිධ වීමත් විද්වතුන්ගේ නොමද විවේචනයන්ට ලක්වෙන්නකි. මේ හැරුන විට සමහර සාධිකාරී සඟරාවල පළවන විවෘත ප්‍රවේශයීය පර්යේෂණ පත්‍රිකාවල තත්ත්වය (quality) පිළිබඳව විද්වතුන් හා පර්යේෂකයන් අතර වර්තමානයේ යම් ප්‍රශ්නකාරී ස්වභාවයක් උද්ගතව ඇත.

සාම්ප්‍රදායික සඟරා මොඩියුලයේදී පළකරණු ලබන පර්යේෂණ පත්‍රිකාවේ තත්ත්වය පිළිබඳව සඟරාවේ සංස්කාරකවරයා විශේෂ අවධානයකින් කටයුතු

කරන අතර අඥාත විෂය විශේෂඥයන් ලවා පර්යේෂණ පත්‍රිකාව නිසි ඇගයීමට ලක් කරයි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ සඟරාවේ පළකරනු ලබන පර්යේෂණ ලිපිවල තත්ත්වය මත එහි කීර්ති නාමය, පැවැත්ම, අලෙවිය මෙන්ම දායකත්වය ලබන්නන්ගේ ප්‍රමාණය තීරණය වන හෙයිනි. නමුත් විවෘත ප්‍රවේශයීය මොඩලයේදී ඉහත දැක් වූ ප්‍රකාශන ක්‍රියාවලියේ යම් ලිහිල් බවක් ඇති බවත් එයට ප්‍රධාන හේතුව ප්‍රකාශක විසින් අදාළ පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශ කිරීමට ප්‍රථමව එහි වියදම හා ලාභය අයකරගෙන තිබීම ලෙසත් දක්වයි.

සමහර සංවෘත ප්‍රවේශයීය සඟරා ඉහළ තත්ත්වයෙන් ප්‍රකාශනයට පත් වුවත් ඒවාට සාම්ප්‍රදායික සංවෘත සඟරාවකට තරම් පිළිගැනීමක් විද්වත් සමාජය තුළ නොමැති වීමත්, කතුවරුන් විසින් තම පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත්කල සඟරාවේ දැක්වෙන කර්තෘ හිමිකම් අවසරය නිසි පරිදි වටහා නොගැනීමෙන් හෝ නොතැකීමෙන් ආයතනික හෝ බාහිර විද්‍යුත් ගබඩාවන්හි තැන්පත් කිරීමත් විවෘත ප්‍රවේශයීය මොඩියුලයේ තවත් අසාධනීය ලක්ෂණ කිහිපයකි. පර්යේෂකයින්ගේ විෂයාත්මක ඥාණය ගැබ් වූ නව සොයා ගැනීම් නිසි ඇගයීමකට ලක් නොවී පැහැර ගැනීම්වලට ලක් වීමටත්, බොහෝ විට සංවර්ධනය වෙමින් පවතින රටවල පර්යේෂකයින් තම පර්යේෂණ පත්‍රිකා තත්ත්වයෙන් බාල මට්ටමේ විවෘත ප්‍රවේශයීය සඟරාවලට ලබා දීමත්, ඒවා විධිමත් විමර්ෂණයකට ලක් නොවී පළවීම හේතුවෙන් තත්ත්වයෙන් උසස් පර්යේෂණ පත්‍රිකාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය කරන දැනුම ඔවුන්ට නොලැබී යාමත්, තත්ත්වයෙන් බාල සඟරාවන් හි තත්ත්වයෙන් බාල පර්යේෂණ පත්‍රිකා පළකිරීම පර්යේෂකයින්ගේ කීර්ති නාමයට හා වෘත්තීය ජීවිතයට හානිදායක වීමත් මෙකී විෂයෙහි සාකච්ඡා වන තවත් කරුණු කිහිපයකි.

ස්වර්ණමය විවෘත ප්‍රවේශයීය සඟරා නව ව්‍යාපාරික මොඩියුලයක් ලෙස ඉතා වේගයෙන් ව්‍යාප්ත වීමත් සමගම සාධිකාරී සඟරා සඳහා පර්යේෂණ පත්‍රිකා ලැබීමේ අනුපාතිකය අඩු වීමත්, තත්ත්වයෙන් පහළ මට්ටමේ පර්යේෂණ පත්‍රිකා ස්වර්ණමය විවෘත ප්‍රවේශයීය සඟරාවල වැඩි වශයෙන් පළවීමත් ඒවාට උද්ධාරයන් ලැබීමේ ප්‍රවණතාවක් ඇති වීමත් නිසාවෙන් ඒවාට යම් චිරස්ථායී ස්වභාවයක් ඇතිවීම ද මෙකී මොඩියුලයේ අසාධනීය ලක්ෂණය. මේ හැරුණ විට ස්වර්ණමය විවෘත ප්‍රවේශයීය සඟරා මොඩියුලය ව්‍යාපාරිකමය වශයෙන් ලාභ ඉපයීමේ නව ප්‍රවණතාවන්ගෙන් යුක්ත බව වටහා ගන්නා කූට ව්‍යාපාරිකයින් (predatory publishers) එතුළට සම්ප්‍රාප්ත වීම හේතුවෙන් ස්වර්ණමය ප්‍රවේශයීය සඟරා ප්‍රකාශනයට ඇති කර ඇති අයහපත් බලපෑම ද අතිමහත්ය.

## ස්වර්ණමය විවෘත ප්‍රවේශයීය සඟරා ප්‍රකාශනයේ කූඨ ව්‍යාපාරික සම්ප්‍රාප්තිය

ඇමරිකාවේ කොලරාඩෝ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිකාරීවරයකු මෙන්ම සහාය මහාචාර්යවරයකු වන ජෙෆ්රි බීල් (Jeffrey Beall)[7] නම් විද්වතා විසින් 2008 වසරේ ස්වර්ණමය විවෘත ප්‍රවේශයීය සඟරා ප්‍රකාශනයේ කූඨ ව්‍යාපාරික සම්ප්‍රාප්තිය හඳුනාගන්නා අතර ඔවුන් "predatory publisher" යනුවෙන් ප්‍රථමවරට නම් කරනු ලැබීය. පසුකාලීනව "predatory publications", " predatory symposiums", "predatory conference"වැනි භාෂිතයන් ව්‍යවහාරයට පැමිණි අතර මේ සෑම සංසිද්ධියක්ම වංචනික ක්‍රියාවකි. ජෙෆ්රි බීල්ට අනුව "predatory publishers"those that unprofessionally exploit the gold open-access model for their own profit. These publishers use deception to appear legitimate, entrapping researchers into submitting their works and then charging them to publish it" [8/9] . 2010 වසරේ සිටම බීල් විසින් අන්තර්ජාලය හරහා Scholarly Open Access නමින් Blog එකක් පවත්වාගෙන ගිය අතර එහි කූඨ ප්‍රකාශකයින්ගේ මෙන්ම ප්‍රකාශනයන්හි ලැයිස්තුවක් දක්වා තිබිණි.[10] මෙම ලැයිස්තුවට අමතරව කූඨ සම්මන්ත්‍රණ (symposium) හා කූඨ සමුළු (conferences) පිළිබඳ ලැයිස්තුවක් ද මෙයට අන්තර්ගත වූ අතර බීල්ගේ Blog එක ඔහුට දිගින් දිගටම ඇති වූ ජීවිත තර්ජන ද නොතකා යාවත්කාලීන කළද 2017 වසරේ ජනවාරි මස 16 දින එය නතර කරන්නේ තම රැකියා ස්ථානයෙන් එය නතර කරන ලෙසට ඔහුට දිගින් දිගටම කරනු ලබන බලපෑම් නිසාවෙනි. Gina Kolata[11] විසින් 2017 ඔක්තෝම්බර් මස 30 වන දින New York Times පුවත්පතට "Many Academics Are Eager to Publish in Worthless Journals" නමින් ලිපියක් ලියමින් පවසන්නේ ඒ වන විටත් කූඨ සඟරා 10000 කට වැඩි ප්‍රමාණයක් අන්තර්ජාලයේ ඇති බවයි. බීල්ට අනුව 2014 මුල් වකවානුව වන විට කූඨ ප්‍රකාශන ප්‍රමාණය 8000 ඉක්මවා තිබූ අතර කූඨ ප්‍රකාශකයින්ගේ ප්‍රමාණය දළ වශයෙන් 1000 කි.[12] මෙකී එක් එක් කූඨ ප්‍රකාශකයින් බොහෝ විට විශාල සඟරා ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කරන අතර සමහරවිට එය සියයද ඉක්මවයි. මීට අමතරව මොවුන් විසින් සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණ හා සමුළු ප්‍රමාණය ද අති විශාලය. කූඨ ප්‍රකාශන වර්ධනයේ අතුරු ප්‍රතිඵලයක් වශයෙන්

---

7 https://en.wikipedia.org/wiki/Jeffrey_Beall

8 https://www.the-scientist.com/critic-at-large/predatory-publishing-40671

9 https://blogs.ubc.ca/ices/2013/01/24/predatory-journals/

10 https://beallslist.weebly.com/

11 https://www.nytimes.com/2017/10/30/science/predatory-journals-academics.html

12 https://beallslist.weebly.com/

මේවන විට කූට සඟරා මාත්‍රිකයන් (journal metrics)[13/14/15] ද විශාල වශයෙන් ක්ෂේත්‍රයට අවතීර්ණ ව ඇති බව මෙකී සඟරා විමර්ෂණයෙන් පෙනී යයි.

(abstracts) පර්යේෂණ පත්‍රිකා (full papers) එවන ලෙස ද ඒවායේ ලියාපදිංචි වෙන ලෙස ද ඉල්ලීම් කරමින් විද්‍යුත් ලිපි එවයි.

සාධිකාරී සඟරාවල මෙන් අඥාත විෂය විශේෂඥයන් ලවා මෙකී සඟරා හි පළවන පර්යේෂණ පත්‍රිකා නිසි ඇගයීමකට ලක් කරන බවට ප්‍රකාශකයින් පැවසුවත් සත්‍ය වශයන්ම එවැන්නක් සිදුවන්නේ නැත. කූට ප්‍රකාශනවල පළවන පර්යේෂණ පත්‍රිකාවල ස්වභාවය පිරික්සීමේ දී මේ බව මොනවට පැහැදිලි වේ. බොහෝ විට කූට ප්‍රකාශනයක පර්යේෂණ පත්‍රිකාවක් පළවීමට ගතවන්නේ ඉතාමත්ම කෙටි කාලයකි. සමහර විට එය දවස් කිහිපයකි. එහෙයින් නිසි විමර්ෂණයකට හෝ ඇගයීමකට ප්‍රමාණවත් කාලයක් නොමැත. මෙවැනි පර්යේෂණ පත්‍රිකාවල විධිමත් පර්යේෂණ පත්‍රිකාවක දැකිය හැකි කිසිදු ලක්ෂණයක් එනම් තාර්කික බව, නිවැරදි බව, නව්‍ය බව, විනිවිද බව, පිළිගත හැකි බව වැනි ලක්ෂණ දැකිය නොහැක.

ඉහතදී ද පෙන්වා දුන් ආකාරයට මෙකී සඟරා බොහෝ විට අන්තර්ජාලයේ ඇති කූට සඟරා මාත්‍රිකයන් (Journal metrics), කූට අනුක්‍රමණිකාකරණ (indexing) හා කූට සාරසංග්‍රහ (abstracting) කරන පමණක් නොව සාධිකාරී සඟරා මාත්‍රිකයන්ගේ නාමයන් ද සාධිකාරී අනුක්‍රමණිකාකරණ හා සාධිකාරී සාරසංග්‍රහයන් ද තම සඟරාවේ සඟරා මාත්‍රිකයන්, අනුක්‍රමණිකාකරණ හා සාරසංග්‍රහ කූට ලෙස දක්වයි. මීට අමතරව මෙම ප්‍රකාශකයින් තමන්ගේ වෙබ් අඩවි බොහෝ විට නිර්මාණය කරන්නේ සාධිකාරී ප්‍රකාශකයින්ගේ වෙබ් අඩවි අනුකරණය කරමිනි. එහෙත් විධිමත් නිරීක්ෂණයකින් ඒවා පහසුවෙන් හඳුනා ගතහැක්කේ ඒවායේ ඇති විවිධ දෝෂ එනම් ඉතාමත් අවම සෙවුම් හැකියාව (poor searching functionality), අක්‍රීය සන්ධානයන්ගෙන් යුක්ත වීම (dead links), භාෂාව හැසිරවීම, ව්‍යාකරණ හා අක්ෂර භාවිතය විධිමත් නොවීම, තොරතුරු විනිවිද භාවයකින් තොරවීම, ප්‍රකාශන ක්ෂේත්‍රයේ විවිධ ප්‍රමිතීන්ට අනුගත නොවීම යනාදියෙනි. එමෙන්ම මෙකී ප්‍රකාශකයින් බොහෝවිට තම ප්‍රකාශන ආයතනයේ නම ලෙස යොදාගන්නේ ද, තම ප්‍රකාශනයන් හි නම් ලෙස යොදාගන්නේ ද සාධිකාරී ප්‍රකාශකයින්ගේ නම් හා සඟරා නාමයන්ගේ අනුකරණයන්ය. මෙම කූට උපක්‍රම යොදාගනුයේ විශේෂයෙන්ම දියුණු

13 https://beallslist.weebly.com/misleading-metrics.html

14 https://hub.wiley.com/community/exchanges/discover/blog/2015/04/09/fake-metrics-and-how-to-spot-them

15 https://scholarlykitchen.sspnet.org/2015/03/10/knockoffs-erode-trust-in-metrics-market/?utm_source=feedburner&utm_medium=email&utm_campaign=Feed%3A+ScholarlyKitchen+%28The+Scholarly+Kitchen%29

වෙමින් පවතින රටවල තරුණ සහ පලපුරුද්දෙන් අඩු පර්යේෂකයින් තම ප්‍රකාශන සඳහා ග්‍රහණය කර ගැනීමේ උපක්‍රමයක් වශයෙනි.

මීට අමතරව වංචනික ලෙස ගොඩනගනු ලබන ගැටුම් සාධක මෙන්ම අනන්‍යතාව හෙළිනොකරන සුවිශාල සංස්කාරක මණ්ඩලයක් ද මෙම සඟරාවන් හි දැකිය හැකි පොදු ලක්ෂණයකි. සමහර විට කූඨ ප්‍රකාශකයින් විසින් ලෝකයේ විවිධ විශ්වවිද්‍යාලයන් හි සහ පර්යේෂණ ආයතනයන් හී කීර්තිමත් විද්වතුන්ගේ නාමයන් ඔවුන්ගේ අනුදැනුමකින් හා අනුමැතියකින් තොරව තම සංස්කාරක මඩුල්ලට ඇතුළු කරයි. මෙකී කූඨ ප්‍රකාශකයින්ගේ දැකිය හැකි තවත් ලක්ෂණයක් වන්නේ විවිධ විෂයයන් ඔස්සේ ප්‍රකාශයට පත් කරනු ලබන තම සියලුම ප්‍රකාශනයන් හි ප්‍රධාන සංස්කාරක ලෙස එකම පුද්ගලයකු දැක්වීමයි. නිශ්චිත ප්‍රකාශන ස්ථානයක් හෝ ලිපිනයක් දැකිය නොහැකි මෙම ප්‍රකාශකයින්ගේ විද්‍යුත් ලිපිනය ද ආයතනික සම්බන්ධයක් නොහඟවන gmail, Hotmail, yahoo mail වැනි ලිපිනයන්ය.

මොවුන්ගේ සඟරා නාමයන් බොහෝ විට ඉතාමත් දීර්ඝ වන අතර සංකීර්ණ ස්වභාවයක් උසුලයි. ඒවායේ අන්තර්ගතය බොහෝ විට විෂය සංකලනයක් පෙන්නුම් කරන අතර අන්තර්ජාතික ප්‍රමිත සඟරා අංකයක් (ISSN) හෝ Digital Object Identifier (DOI) දැකිය නොහැක. මෙකී සඟරාවන් එක්කෝ කතෘ හිමිකම් ප්‍රකාශයකින් තොරය, නැතහොත් අන්තර්ගතය කර්තෘ හිමිකම් ප්‍රකාශය වියවුල් ස්වභාවයක් උසුලන අතර කතුවරයා විසින් ගෙවිය යුතු ප්‍රකාශන වියදම පිළිබඳව තොරතුරු දැක්වීමේ විනිවිද භාවයක් නොමැත. එක් එක් ප්‍රකාශනයේ වෙළුම් අංකයන් හා කාණ්ඩ අංකයන් අතර අසමාන ස්වභාවයන් පැවතීම හා එක් එක් කාණ්ඩයන්හි ප්‍රකාශවන පර්යේෂණ පත්‍රිකාවන්ගේ ප්‍රමාණය වෙනස් වීම මෙන්ම ඉතාමත් අල්ප පර්යේෂණ පත්‍රිකා ප්‍රමාණයක් ඇතුව ද සඟරා කාණ්ඩයක් ප්‍රකාශ වීම මේවායේ ඇති තවත් ලක්ෂණ කිහිපයකි.

## කූඨ ප්‍රකාශකයින්ගෙන් විනිර්මුක්ත වීම

මේ දක්වා සාකච්ඡා කළ කරුණුවලින් අවබෝධ වන පරිදි කූඨ ප්‍රකාශකයින් තම ව්‍යාපාරය පවත්වා ගැනීම සඳහා විවිධ වූ උපක්‍රම භාවිත කරයි. මෙම කූඨ ප්‍රකාශන මත පදනම්ව ඇති ව්‍යාපාරය සඳහා කූඨ ව්‍යාපාරිකයින් අතිවිශාල වෙහෙසක් දරන්නේ මෙය මේ වන විට ලෝකයේ ඉතාමත් ලාභදායී ව්‍යාපාරයක් බවට පත්ව ඇති නිසාවෙනි. කෙසේ වෙතත් මෙම ව්‍යාපාරයේ ගති ස්වභාවය හා ඔවුන්ගේ ප්‍රකාශනවල ගති ස්වභාවය අවබෝධ කරගැනීමෙන් මෙම වංචනික ප්‍රකාශකයින්ගෙන් ගැලවී සංවෘත හෝ විවෘත සාධිකාරී සඟරාවක තම පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශයට පත්කරවා ගැනීමට පර්යේෂකයින්ට අවකාශ ඇත. මේ හැරුන විට ප්‍රකාශන ක්ෂේත්‍රයේ තත්ත්වය උසස් මට්ටමක තබා ගැනීමට වෙහෙස වන විවිධ ජාත්‍යන්තර ආයතන හා

සංවිධාන විසින් විවිධ ප්‍රමිතීන් (standards), මිණුම්දඬු (criteria) සහ නිතී සංග්‍රහයන් (codes of conduct) හඳුන්වා දී ඇත.

මේවා අතර "Principles of Transparency and Best Practice in Scholarly Publishing"[16] ඉතාමත් වැදගත් නිර්ණායකයකි. Committee on Publication Ethics (COPE), Directory of Open Access Journals, (DOAJ), Open Access Scholarly Publishers Association, (OASPA) සහ World Association of Medical Editors (WAME) සහයෝගයෙන් හඳුන්වා දී ඇති මෙම නිර්ණායකයන් තුළින් ඔවුන් බලාපොරොත්තු වන්නේ තම සංවිධානයන් හි සාමාජිකයින්ගේ හා සාමාජිකත්වය බලාපොරොත්තු වන නව අයදුම්කරුවන්ගේ සාධිකාරී ප්‍රකාශනවල ප්‍රමිතියක් හා ගුණාත්මක බවක් රඳවා ගැනීමයි. මෙම සංවිධානයන් හි සාමාජිකත්වය ලබා ඇති සියලුම ආයතන මෙකී නිර්නායකයන්ට අනුගත වීම අතිශයින්ම වැදගත්වන අතර යම් හෙයකින් එකී නිර්ණායකයන්ට එරෙහිව කටයුතු කිරීම සාමාජිකත්වය අත්හිටුවීමට හෝ අහෝසිවනු ලැබීමට හේතු වේ. සාධිකාරී මෙන්ම ප්‍රමිති සඟරාවක තිබිය යුතු මූලික ගුණාංග පිළිබඳව නිසි අවබෝධයක් ලැබීම තම පර්යේෂණ පත්‍රිකාව ප්‍රමිතියෙන් උසස් සඟරාවක පළකරවා ගැනීමට උපකාරී වන හෙයින් පර්යේෂකයින් විසින් මෙම නිර්ණායක පරිශීලනය කිරීම ඉතාමත් අත්‍යවශ්‍යය. මීට අමතරව ඉහත සඳහන් කළ එක් එක් සංවිධානයන් හි වෙබ් අඩවිවලට පිවිස ඒවායේ ඇති තොරතුරු පරිශීලනය කිරීම සාධිකාරී ප්‍රකාශන ක්‍රියාවලිය, ඒ සතු ආචාරධර්ම, නීති රීති හා එහි ඇති වැදගත්කම මෙන්ම එකී සංවිධානවල සාමාජිකත්වය ලබා ඇති ප්‍රකාශකයින් හා ප්‍රකාශන අවබෝධ කර ගැනීමට මහඟු පිටුවහලකි.

## Committee on Publication Ethics (COPE)

මෙම සංවිධානය 1997 වසරේ ආරම්භ කළ අතර ප්‍රකාශන ක්ෂේත්‍රයේ නියුක්තිකයන් (සංස්කාරක සහ ප්‍රකාශක) තුළ තම ක්ෂේත්‍රය තුළ තිබිය යුතු ආචාරධර්ම පද්ධතියක ඇති වටිනාකම පිළිබඳව අවබෝධයක් ලබා දෙන මෙන්ම ඒ සඳහා විවිධාකාරයෙන් උදව් උපකාර ලබා දෙන ආයතනයකි.[17] දැනට සාමාජිකයින් 12,000 කට වැඩි ප්‍රමාණයක් ඇති මෙම සංවිධානය තම සාමාජිකයින්ගෙන් ලැබෙන ගැටලු නිරන්තරව සාකච්ඡාවට බඳුන් කරන අතර ඒවා සඳහා මෙම සංවිධානය ලබාදෙන ලද විසඳුම් අඩංගු වන සෙවුම් හැකියාවෙන් අනූන දත්ත පද්ධතියක් ද ගොඩනගා ඇත. මෙම හේතුවෙන් මෙම සංවිධානයේ සාමාජික ආයතනයකට ප්‍රකාශන ක්ෂේත්‍රයේ යම් ගැටලුවක් ඇති විට මෙහි වෙබ් අඩවියට පිවිස විවිධ සෙවුම් ක්‍රම ඔස්සේ

16 https://publicationethics.org/files/Principles_of_Transparency_and_Best_Practice_in_Scholarly_Publishingv2.pdf

17 https://publicationethics.org/

දත්ත පද්ධතිය පිරික්සිය හැක. මෙම සංවිධානයේ සියලුම සාමාජිකයින් " Principles of Transparency and Best Practice in Scholarly Publishing" නම් නිර්ණායකයන්ට එකඟ විය යුතුවාක් මෙන්ම එහි සාමාජික සියලු සඟරා සංස්කාරකවරු "COPE Code of Conduct for Journal Editor" සඳහා ද අනුගත විය යුතුය. මෙම සංවිධානයේ වෙබ් අඩවියට පිවිසීම තුළින් එහි සාමාජිකත්වය ලබා ඇති ප්‍රකාශකයින්ගේ මෙන්ම ඔවුන්ගේ සඟරාවල මෙන්ම සංස්කාරකවරුන්ගේ හා අනෙකුත් අදාළ ආයතන හා පුද්ගලයන්ගේ විස්තර විමර්ශනය කළ හැකිය.

## Directory of Open Access Journals (DOAJ)

විවෘත ප්‍රවේශයීය සඟරා නාමාවලිය (Directory of Open Access Journals)[18], ස්වීඩනයේ ලුන්ඩ් විශ්වවිද්‍යාලය විසින් 2003 වසරේ සඟරා 300ක පමණ එකතුවකින් ආරම්භ කළ අතර මේ වන විට සඟරා 13,187ක් ද, පර්යේෂණ ලිපි 3,973,199 කින් ද යුතු විශාල දත්ත පද්ධතියක් වන අතර ලෝකයේ රටවල් 130 ක පළවන භාෂාමය සීමාවන්ට හා විෂය සීමාවන්ට සීමා නොවුන දත්ත පද්ධතියකි. අනුග්‍රාහකයින්ගේ මෙන්ම සාමාජිකයින්ගේ ආධාර මත පවත්වාගෙන යන මෙම නාමාවලිය සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා ගත හැක්කකි. "Principles of Transparency and Best Practice in Scholarly Publishing" නම් නිර්ණායකයන් ඇති කිරීමේ දී මුල් වූ ප්‍රධාන ආයතනවලින් එකක් වූ මෙම ආයතනය එකී නිර්නායක අනුගමනය කිරීම තම සාමාජිකයින්ට අනිවාර්ය කර ඇති ආයතනයකි. මෙහි සාමාජිකත්වය Publisher, Ordinary Member and Sponsor වශයෙන් කොටස් තුනකට වර්ගකර ඇත. විවෘත ප්‍රවේශයීය ප්‍රකාශන ක්ෂේත්‍රයේ කූඨ ප්‍රකාශකයින්ගේ වර්ධනය හේතුවෙන් 2014 වසරේ මෙම ආයතනය දැඩි නීති රීති පද්ධතියක් හඳුන්වා දුන් අතර එම හේතුවෙන්ම ඊට පූර්වයෙන් සාමාජිකත්වය ලැබ තිබූ සියලුම සාමාජිකයින්ටද නැවත අයදුම් කිරීමට සිදු විය. මෙම හේතුවෙන් නව නීති රීතිවලට අනුගතව නැවත අයදුම් කිරීමට නොහැකි වූ සාමාජිකයින් 2851 කට සාමාජිකත්වය ද අහිමිවිය. මෙම සංවිධානයේ වෙබ් අඩවියට පිවිසීම තුළින් එහි සාමාජිකත්වය ලබා ඇති ප්‍රකාශන, ප්‍රකාශකයින්, සාමජිකයින් මෙන්ම ඔවුන්ගේ අනුග්‍රාහකයින්ගේ විස්තර ද විමර්ශනය කළ හැකිය.

18 https://doaj.org/

## Open Access Scholarly Publishers Association (OASPA)

විවෘත ප්‍රවේශයීය ප්‍රකාශකයින්ගේ සමාගමක් වන මෙය වාණිජ නැතහොත් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් පිහිටුවා ඇති ආයතනයකි.[19] ඉහතදී ද සඳහන් කළ "Principles of Transparency and Best Practice in Scholarly Publishing" නමති නිර්ණායකයන් හඳුන්වා දීමට ද මූලික වන මෙම සමාගම විවෘත ප්‍රවේශයීය ප්‍රකාශකයින්ගේ සුබ සිද්ධිය පරමාර්ථ කොට පිහිටුවා ගන්නා ලද්දකි. මෙහි සාමාජිකයින් ලෙස විවෘත ප්‍රවේශයීය ප්‍රකාශකයින්, සංවිධාන සහ සමහර තනි තනි ප්‍රකාශන ද ඇතුළත් වේ. මෙහි පාලනය අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් සිදුවන අතර සෑම වසර තුනකට වරක් සාමාජිකයින් අතරින් අධ්‍යක්ෂක මණ්ඩලය පත් කරනු ලබයි. සාමාජිකත්වය ඉල්ලා යොමු කරන ඉල්ලුම්පත් දැඩි විමර්ශනයකට යොමු කරන අතර සාමාජිකත්වය ලැබීමට නම් යම් නිති රීති සමුදායකට (Membership Criteria) එකඟවිය යුතුය. සමාගමේ සාමාජිකත්වය ලැබූ සියලු දෙනා "Principles of Transparency and Best Practice in Scholarly Publishing" නිර්ණායකයන්ට අමතරව OASPA's Code of Conduct නම් සමාගමේ ව්‍යවස්ථාවට ද අනුකූලව තම ප්‍රකාශන ක්‍රියාවලිය මෙහෙයවිය යුතුය. ඉහත දැක්වූ අනෙකුත් ආයතනවල මෙන්ම මෙම සංවිධානයේ ද වෙබ් අඩවියට පිවිසීම තුළින් එහි සාමාජිකත්වය ලබා ඇති ප්‍රකාශකයින්, සංවිධාන සහ සමහර තනි තනි ප්‍රකාශනයන් හි විස්තර විමර්ශනය කළ හැකිය.

## World Association of Medical Editors (WAME)

වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ සාධිකාරී සඟරාවන් හි සංස්කාරකවරුන්ගේ සංගමයක් වන මෙය 1995 වසරේ ඉතාලියේ දී පිහිටුවා ගන්නේ ලෝකය පුරා විසිරී සිටින වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ සඟරාවන් හි සංස්කාරකවරුන් අතර සහයෝගය වර්ධනය කිරීම, සන්නිවේදන සම්බන්ධතා දියුණු කිරීම, තත් විෂය ක්ෂේත්‍රයේ සංස්කාරක ක්‍රියාවලියේ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම, ක්ෂේත්‍රයේ අධ්‍යයන අවස්ථා වැඩි දියුණු කිරීම තුළින් වෘත්තීයමය වැඩි දියුණුව ඇති කිරීම, ස්වයං විවේචනය හා ස්වයං හික්මීම වැඩිදියුණු කිරීම, වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ සඟරා සංස්කරණය පිළිබඳ අධ්‍යයනයන් වැඩි දියුණු කිරීම ආදී අරමුණු රාශියක් පෙරදැරිවයි.[20] මුළුමනින්ම විවිධ සංවිධාන හා පුද්ගල ආධාර මත යැපෙන මෙම සංවිධානය නොමිලේ සේවා සපයන ආයතනයකි. සාධිකාරී වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ සඟරාවන් හි සංස්කාරකවරුන්ට හා එම ක්ෂේත්‍රයේ තෝරාගත් වෘත්තිකයින්ට මෙහි සාමාජිකත්වය නොමිලයේම පිරිනැමෙන අතර ඔවුනට එම සංගමයේ සියලු වරප්‍රසාද නොමිලේ භුක්තිවිඳිය හැකිය. මෙම සංගමය ද "Principles of Transparency and Best Practice in Scholarly Publishing" නම් නිර්ණායක හඳුන්වා දීමට මැදිහත් වූ ප්‍රධාන

19 https://oaspa.org/

20 http://www.wame.org/

සංවිධානයක් වන හෙයින් එහි සාමාජිකයින් සියලුදෙනාටම තමා නියෝජනය කරන සඟරා ඉහත නිර්ණායකයන්ට අනුකූලව පවත්වා ගැනීම අනිවාර්ය කර ඇත. මෙම සංගමය සතු වෙබ් අඩවියට පිවිසීමෙන් එහි සාමාජිකයන් නියෝජනය කරන සඟරා පිළිබඳ විමර්ශනයක් කිරීමට අවස්ථාව සලසා ඇත. 2018 වසර අවසානය වන විට මෙම සංගමය සතුව රටවල් 92 ක් නියෝජනය වන සඟරා 1000 කට අධික ප්‍රමාණයක සාමාජිකයින් 1830 ක් ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් සංවිධානවලට අමතරව තම පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශ කරවා ගැනීමට සුදුසු සාධිකාරී විවෘත ප්‍රවේශයීය සඟරාවක් තෝරා ගැනීමට පර්යේෂකයින්ට උදව් වන පිළිගත හැකි සංවිධාන හා මූලාශ්‍ර සමූහයක් හඳුනාගත හැකි අතර ඒවායෙන් ඉතා වැදගත් මූලාශ්‍ර කිහිපයක් පහත සාකච්ඡා කරනු ඇත.

## Think Check Submit

"Think Check Submit"[21] යනු කූඨ ප්‍රකාශකයින්ගේ ග්‍රහණයෙන් පර්යේෂකයින් ගලවා ගැනීමට නිර්මාණය කරන ලද ඉතාමත් වටිනා වෙබ් අඩවියකි. ඉහත විස්තර කළ සංවිධාන හතර ද ඇතුළත් ලෝකයේ විවිධ සාධිකාරී ප්‍රකාශකයින් හා සාධිකාරී දත්ත පද්ධති සමූහයක ඉතා වටිනා ප්‍රයත්නයක් ලෙස මෙය හැඳින්විය හැක. මෙමගින් පර්යේෂකයින්ට තමාගේ පර්යේෂණ පත්‍රිකාව පළකරවා ගැනීමට ඉතාමත් සුදුසු සඟරාවක් තෝරා ගැනීමට අවශ්‍ය සරල පිරික්සුම් ලැයිස්තුවක් සහ උපදෙස් සපයයි.

## ROAD

ROAD (Directory of Open Access scholarly Resources)[22] දත්ත පද්ධතිය ද මෙහිලා ඉතා වැදගත්ය. මෙය 2014 වසරේ ISSN International Centre නම් ආයතනය UNESCO හි තොරතුරු හා සන්නිවේදන කාර්යාංශය හා එක්ව (Communication and Information Sector)[23] ගොඩ නගන ලද්දකි. ISSN[24] හි උප ආයතනයක් වන මෙම දත්ත පද්ධතියේ අන්තර්ගත වන්නේ ISSN ආයතනය විසින් විවෘත ප්‍රවේශයීය සඟරා සහ සාධිකාරී සම්මේලන වාර්තා ආදිය සඳහා ලබාදෙන ලද ISSN අංකයන් හා ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරය. මෙය සෙවුම් හැකියාව ඇති නොමිලේ ලබා දෙන සේවයක් හෙයින් පර්යේෂකයින්ට ඉතා පහසුවෙන් දත්ත පද්ධතියට ඇතුළත්ව තමා

21 https://thinkchecksubmit.org/

22 https://road.issn.org/

23 http://www.unesco.org/new/en/communication-and-information/

24 http://www.issn.org/

තෝරාගත් සඟරාව සඳහා ISSN ආයතනය සත්‍ය වශයෙන්ම අංකයත් ලබා දී තිබේදැයි දැනගත හැකිය. මේ සඳහා සෙවුම් වචන වශයෙන් ISSN අංකය හෝ සඟරා නාමය භාවිත කළ හැකිය.

## Beallzs list

ඉහතදී ද සාකච්ඡා කළ පරිදි "Beallzs list of potential predatory publisher" [25]නම් Blog එක 2017 වසරේ ජනවාරි මස 16 දින සිට යාවත්කාලීන කිරීම නතර කළත් එහි සංරක්ෂිත පිටපත මේ දක්වා යම් අඥාත විද්වතුන් පිරිසක් විසින් යාවත්කාලීන කරයි. මෙම ලැයිස්තුව බීල්ස්ගේ ලැයිස්තුව තරම් නිරන්තර යාවත්කාලීන කිරීමට ලක්වන්නක් මෙන්ම විස්තීර්ණ වූවක් නොවුනත් කූඨ ප්‍රකාශකයින්, කූඨ ප්‍රකාශන මෙන්ම කූඨ සම්මේලන හා සමුළු පිළිබඳව අවබෝධයක් ලැබීමට පරිශීලනය කළ හැකි වටිනා ලැයිස්තුවක් වන්නේ බීල්ස්ගේ ලැයිස්තුවද එහි තවමත් සුරක්ෂිතව තිබීම හේතුවෙනි. මෙම ලැයිස්තුව පරිශීලනය කිරීමෙන් වංචනික ලෙස අනුකරණය කරන සඟරා (Hijacked Journals) මෙන්ම කූඨ සඟරා මාත්‍රිකයන් (Misleading Metrics) හඳුනා ගැනීමට ද අවස්ථාවක් ලැබේ.

## Stop Predatory Journals

මෙම වෙබ් අඩවියද[26] ආරම්භ කරන්නේ බීල්ස්ගේ ලිස්ට් එක අකර්මන්‍ය වීමත් සමගයි. බොහෝවිට මේ සඳහා ද පාදක කරගන්නේ බීල්ස්ගේ ලැයිස්තුව වන අතර එහි අඥාත සංස්කාරකවරුන් දක්වන පරිදි ඔවුන් එම ලැයිස්තුව නිරන්තර යාවත්කාලීන කරයි. මෙම වෙබ් අඩවි දෙකෙහිම දැක්වෙන තොරතුරු බොහෝ විට සම වුවත් තොරතුරු කාණ්ඩ කිරීමේ සහ ප්‍රකාශ කිරීමේ යම් යම් වෙනස්කම් දැකිය හැකිය.

## Journal Evaluation Tool

ඇමරිකාවේ ලොයෝලා මැරිමවුන්ට් විශ්වවිද්‍යාලයේ (Loyola Marymount University) විලියම් එච් හැන්නන් පුස්තකාලයේ (William H. Hannon Library), සේවයේ නියුතු Rele Kennedy සහ Blas විසින් හඳුන්වා දී ඇති විවෘත ප්‍රවේශයීය සඟරා ඇගයීමේ උපදෙස් මාලාව (Journal Evaluation Rubric) සහ විවෘත ප්‍රවේශයීය සඟරා ඇගයීම සඳහා ලකුණු ලබාදීමේ පත්‍රය

25 https://beallslist.weebly.com/

26 https://predatoryjournals.com/

(Journal Evaluation Scoring Sheet) ඉතාමත් වැදගත් ප්‍රකාශනයකි.[27] මෙහි ඇති ඇගයීම් උපදෙස් සමග තමා තෝරාගත් සඟරාව සැසඳීමෙන් මෙන්ම ඒ සඳහා ලැබිය හැකි ලකුණු, ලකුණු ලබාදීමේ පත්‍රය තුළ සටහන් කිරීමෙන් පර්යේෂකයකුට තමාගේ පර්යේෂණ පත්‍රිකාව සඳහා තෝරාගත් විවෘත ප්‍රවේශයීය සඟරාව ඒ සඳහා සුදුසු වන්නේ ද යන්න නිගමනය කළ හැකිය.

## Quality Open Access Market

නෙදර්ලන්තයේ රැඩ්බොඩ් විශ්වවිද්‍යාලයේ (Radboud University Nijmegen) Leo Waaijers iy Saskia de Vries විසින් 2013 වසරේ හඳුන්වා දුන් විවෘත ප්‍රවේශයීය සඟරා සඳහා පුස්තකාල සහ කතුවරුන් විසින් ලකුණු ලබා දීමේ ක්‍රමවේදය QOAM (Quality Open Access Market) නමින් හඳුන්වයි.[28]/[29] මෙහිදී තෝරාගත් පුස්තකාල විසින් දෙනු ලබන එක් එක් විවෘත ප්‍රවේශයීය සඟරාවන් හි වෙබ් අඩවියට පිවිස සඟරාවන් හි විවිධ අංශ පිළිබඳව විමර්ශනයක් කර ඒවාට ලකුණු ලබාදෙන අතර මෙම සඟරාවන් හි පර්යේෂණ පත්‍රිකා පළකළ කතුවරුන් විසින් තමා අදාල සඟරාව සමග කටයුතු කිරීමේදී ලබන ලද අත්දැකීම් ඔස්සේ ඒ ඒ සඟරාවට ලකුණු ලබාදෙයි. මෙම ලකුණු පදනම් කරගනිමින් එක් එක් සඟරා සඳහා SWOT විමර්ෂනයක් කරන QOAM එක් එක් සඟරා SWOT වර්ගීකරණය ඔස්සේ Strong, Weaker, Opportunity for publishers, Threat to authors වශයෙන් කොටස් හතරකට බෙදයි. මෙකී එක් එක් කොටස සඳහා වර්ණ (Green for strong, Yellow for weak, Red for Threat, Blue for opportunity) භාවිත කරන ඔවුන් එමගින් පර්යේෂකයින්ට සඟරාවේ ස්වභාවය හඳුනා ගැනීම පහසු කරවයි. මීට අමතරව මෙම දත්ත පද්ධතිය විසින් පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශනයට වැයවන මුදල ආදී තොරතුරුද ලබා දෙයි. මෙය සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දෙන සේවාවක් වන අතර සඟරා 30,000 කට ආසන්න ප්‍රමාණයක් ආවරණය කරයි.

## Journal Guide

ඇමරිකාවේ තම මූලස්ථානය පිහිටුවා ඇති "Research Square" නම් ආයතනය විවිධ විද්වතුන්ගේ හා ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ උදව් ඇතුව නිර්මාණය කර ඇති JournalGuide[30] නමැති ප්‍රබල වෙබ් මෙවලම පර්යේෂකයින්ගේ පර්යේෂණ පත්‍රිකා සඳහා ඉතාමත් සුදුසු සඟරාවක් සොයා ගැනීම උදෙසා අවශ්‍ය සහාය ලබා දෙයි. මෙහි ඇති සෙවුම් යන්ත්‍ර "Crossref" (Crossref is an

27 http://digitalcommons.lmu.edu/cgi/viewcontent.cgi?article=1041&context=librarian_pubs
28 https://www.qoam.eu/
29 https://blogs.openaire.eu/?p=764
30 https://www.journalguide.com/

official Digital Object Identifier Registration Agency of the International DOI Foundation) හි දත්ත පද්ධතිය උපයෝගි කරගන්නා හෙයින් මෙමගින් සොයා ගන්නා සඟරාව පිළිබඳව කිසිදු සැකයක් තබා ගැනීම අවශ්‍ය නොවේ. මෙය ද සම්පූර්ණයෙන්ම නොමිලේ ලබාදෙන සේවාවකි.

ඉහත සඳහන් කළ සංවිධාන සහ මූලාශ්‍රවලට අමතරව තම විෂය ක්ෂේත්‍රය ආවරණය කරන ලෝකයේ ඇති ප්‍රධාන පෙළේ දත්ත පද්ධතීන් විමර්ෂනය කිරීම මගින් ද පර්යේෂකයකුට තම පර්යේෂණය ප්‍රකාශ කරවා ගැනීමට තෝරාගත් සඟරාව ප්‍රමිත මට්ටමේ සාධිකාරී සඟරාවක් ද යන්න නිශ්චය කර ගැනීමට උපකාරී වේ. උදාහරණ ලෙස Clarivate Analytics[31] ආයතනය විසින් පවත්වාගෙන යන Master Journal List නම් දත්ත පද්ධතිය (වර්ෂ 2016 දක්වා මෙය Thomson Reuters ආයතනයේ Intellectual Property and Science Business නම් විය) පෙන්වාදිය හැකිය. මීට අමතරව Ulrichsweb™ (Global Serial Directory)[32] ද විමර්ෂණය කළ හැකිය. මෙම දත්ත පද්ධතිය තුළ සාධිකාරී සඟරා සහ අනෙකුත් වර්ගවල සංවෘත ප්‍රවේශයීය සහ විවෘත ප්‍රවේශයීය වාරික ප්‍රකාශන 300,000 කට වැඩි ප්‍රමාණයක ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කර ඇත. මෙම දත්ත පද්ධතිය පරිශීලනය කිරීමේ ගැටලුව වන්නේ ඒ සඳහා යම් ගෙවීමක් කර දායකත්වය ලබා ගත යුතු හෙයිනි.

## සමාප්තිය

ප්‍රකාශන ක්‍රියාදාමය තුළ ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශනයේ වර්තමාන ස්වරූපය හඳුනා ගැනීම ඉතා භාරදූර කටයුත්තකි. විවෘත ප්‍රවේශයීය, සංවෘත ප්‍රවේශයීය හෝ දෙමුහුන් ප්‍රවේශයීය වේවා සාධිකාරී සඟරා ප්‍රකාශකයින් මෙන්ම කුඨ සඟරා ප්‍රකාශකයින් ද මේ වනවිට විද්වතුන්ගේ නොමඳ විවේචනයන්ට ලක්වී ඇත.

ඉහතදී ද විස්තර කළ ආකාරයට සාධිකාරී ප්‍රකාශකයින් තම අප්‍රසන්න ව්‍යාපාරික ස්වභාවය (exploitative) නිසා මෙසේ විවේචනයන්ට ලක්ව ඇත. කෙසේ වෙතත් බොහෝ සාධිකාරී ප්‍රකාශකයින් වර්තමානය වන විටත් (සංවෘත හෝ විවෘත වේවා) තම සඟරාවන් හි ප්‍රමිතිය පිළිබඳව දැඩි සැලකිල්ලක් යොමු කරන හෙයින් ප්‍රකාශන ක්‍රියාවලියේ සම්මත ප්‍රමිතීන්ට හා ආචාරධර්මයන්ට අනුගතව තම ව්‍යාපාරය මෙහෙයවයි. ඔවුනගේ ප්‍රකාශන ක්‍රියාදාමයේ ඇති යම් යම් අප්‍රසන්න ස්වභාවයන් හා අඩුලුහුඩු කම් නොතකා තවදුරටත් ඔවුන් මතම යැපීමට බොහෝ පර්යේෂකයින්ට සිදුව ඇත්තේ තම පර්යේෂණ පත්‍රිකාවට නිසි ජාත්‍යන්තර ඇගයීමක් හා පිළිගැනීමක් ලබාදිය

31 http://mjl.clarivate.com/cgi-bin/jrnlst/jlresults.cgi?PC=MASTER&Word=nature+culture

32 http://ulrichsweb.serialssolutions.com/login

හැකි වෙනත් ක්‍රමවේදයන් දුලභ බැවිනි.

විද්වත් සමාජය තුළ කූඨ ප්‍රකාශකයින්ට දැඩි විවේචනයක් එල්ල වන්නේ ඔවුන්ගේ වංචනික හා කොල්ලකාරී ව්‍යාපාරික ක්‍රියාදාමය නිසා පමණක්ම නොව ඒ තුළින් ශාස්ත්‍රීය ලේඛන කලාවට, පර්යේෂණ ක්‍රියාදාමයන්ට, ප්‍රකාශන ක්‍රියාදාමයේ ආචාරධර්ම හා ප්‍රමිතීන්ට මෙන්ම විද්‍යා හා තාක්ෂණය ඇතුළු අනෙකුත් විෂය ක්ෂෙත්‍රයන්ගේ දියුණුවට ඇති කර ඇති අසීමිත අයහපත් බලපෑම හේතුවෙනි. මේ හැරුන විට මෙවැනි ප්‍රකාශනවල තම පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීමෙන් පර්යේෂකයින් තම වෘත්තීය ජීවිතයට හානියක් මෙන්ම අපකීර්තියක් එක්කර ගැනීම ද ඔවුන් සේවය කරන හෝ අධ්‍යයනයේ යෙදෙන ආයතනවලට සෘජු හෝ වක්‍රව මෙකී අයහපත් බලපෑම් එල්ල කරවීම ද කරයි. මෙහි ඇති  බැරෑරුම් ස්වභාවය හඳුනා ගන්නා ලෝකයේ බොහෝ අධ්‍යාපනික ආයතන මෙන්ම පර්යේෂණ ආයතන තම පර්යේෂකයින් මෙකී කූඨ ප්‍රකාශකයින්ගෙන් මුදා ගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිත කරයි. කෙසේ වෙතත් කොල්ලකාරී කූඨ ප්‍රකාශකයින් එකී උපක්‍රම පරයා විවිධ  උපක්‍රම ඔස්සේ තම ව්‍යාපාරය මෙහෙයවමින් ලෝකයේ දියුණු වෙමින් පවතින රටවල තරුණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ අඩු අත්දැකීම් ඇති පර්යේෂකයින් වැඩි වැඩියෙන් තම ප්‍රකාශන සඳහා ආකර්ශනය කර ගන්නා බවට තත් විෂයෙහි වර්තමාන සාහිත්‍ය සාක්ෂි දරයි. ඒ හැරුන විට වර්තමාන ප්‍රකාශන ක්‍රියාවලිය විමර්ශනය කිරීමෙන් ද එය මනාව අවබෝධ කර ගත හැකිය.

රටක් ලෙස ශ්‍රී ලංකාව ද මෙකී කොල්ලකාරී කූඨ ප්‍රකාශකයින්ට නතුව ඇති බව වැටහෙන්නේ බොහෝ තරුණ මෙන්ම අඩු අත්දැකීම් ඇති පර්යේෂකයින් විශාල වශයෙන් මෙකී වංචනික සඟරාවන් හි තම පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශ කරවා ඇති හෙයිනි. ගූගල් සෙවුම් යන්ත්‍රය ඔස්සේ කරනු ලබන විමසුමකින් මෙන්ම බොහෝ තරුණ මෙන්ම අඩු අත්දැකීම් ඇති පර්යේෂකයින්ගේ පැතිකඩ (profile) විමර්ශනය කිරීමෙන් මේ බව මොනවට පැහැදිලි වේ. නොදැනුවත් කම හෝ අනවබෝධය හේතුවෙන් ඉතා කෙටි කාලයක් තුළ කූඨ ප්‍රාකාශනයන් හි තම පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශ කරවා ගැනීමට උනන්දුවන තරුණ මෙන්ම අඩු අත්දැකීම් ඇති පර්යේෂකයින් පමණක් නොව විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව ද වහ වහා මේ පිළිබඳව දැනුවත් කිරීම ජාතික අවශ්‍යතාවක් වන්නේ එමගින් ලැබෙන අපකීර්තිය හා පාඩුව පර්යේෂකයින්ට පමණක් නොව පොදුවේ විශ්වවිද්‍යාලයන්ට, පර්යේෂණායතනයන්ට මෙන්ම රටට ද බලපාන හෙයිනි.

# Ayurvedic Medicine

# Evaluation of Library Resources and Services Provided by the Ayurvedic Medical Libraries in Sri Lanka

**Dr.(Mrs.) C. K. Gamage**

Senior Assistant Librarian
Institute of Indigenous Medicine
University of Colombo,
Rajagiriya
ckgamage31@gmail.com

## Abstract

The rapid advancement of modern technology has transformed information needs, information seeking behavior and the role of libraries as service providing centers with quality and accuracy of information. Specially in medical libraries need to be much more proactive and should provide up to date specialized information to their users. Evaluation of information resources and services of libraries should be regarded as a management tool. Libraries have become increasingly interested in the techniques of evaluation of their resources and services within the last three - four decades. The main objective of this study is to evaluate the library resources and services in Ayurvedic medical libraries in Sri Lanka. There is no in -depth study done so far in this regard. This study is based on the survey method. Three types of research instruments questionnaires, interviews and observation were utilized for data collection in this survey. Students and Academic staff of the Institute of Indigenous Medicine (IIM), Rajagiriya and Gampaha Wickramarachchi Ayurvedic Institute (GWAI) as well as Professionals/ Para professionals of Bandaranayaike Memorial Ayurvedic Research

Institute (BMARI) were deemed as study population. The SPSS software was utilized in analyzing the data collected for this study. The study revealed the facts that the three libraries specializing in Ayurvedic medicine are at different levels of development and the reference service is the most used service in all the three libraries. It was also suggested that it is paramount importance to start current periodical collection both at the libraries of GWAI and BMARI, More information network facilities for resource sharing, Information literacy programmes should be conducted to promote current awareness services and Increasing the facilities for database searching, Regular user education programmes and users' surveys at regular intervals etc. were identified as areas that needed improvement.

**Keywords:** Evaluation of Libraries, Evaluation of Information Resources, Evaluation of Services, Ayurvedic medical libraries, User Studies

## Introduction

The academic libraries have been introduced as the 'heart' of the learning community of its parent institutions. Fulfilling user needs is one of the major aspects of library management. Collection evaluation is the understanding of the strengths and weaknesses of the current library holdings and assessment of its effectiveness to meet the needs and requirements of the present users as well as potential users. It has an important role in decision making activities in collection development and the results of collection evaluation help the library management to allocate resources more effectively. Collection evaluation mainly aimed at revealing the strength, weakness and utility of the collection on various subject areas, so as to make efforts for developing a suitable and useful collection. It helps to check, control and develop a realistic acquisition programme based on thorough knowledge of the existing collection and to organize the resources more competently and improve the efficiency of library personnel. Another purpose of collection evaluation is to determine adequacy, quantity and quality of collection and to ascertain how old and how relevant the materials are. It also guides library managers to find out current collection and identify the gaps in the collection as well as to compare with other standard libraries and to organize the resources more completely. For whatever reason evaluation may be undertaken, it is a healthy and necessary task; it can only result to improve knowledge of the collection and it is hoped improved library services.

## Background of the Study

The Institute of Indigenous Medicine (IIM), University of Colombo and Gampaha Wickramarachchi Ayurvedic Institute (GWAI), University of Kelaniya are the two major Ayurveda academic institutions in Sri Lanka. Bandaranayaike Memorial Ayurvedic Research Institute (BMARI) is the only one research institute in the fields of Ayurvedic and indigenous medicine.

The college of Ayurveda was inaugurated in 1929 by the governor of Ceylon, Sir Herbet Stanley in the Bauer Building - Cotta Road , Borella. In 1977 the College of Ayurveda was affiliated to the University of Colombo and renamed Institute of Indigenous Medicine (IIM), University of Colombo. Now the Institute comes under the Ministry of Higher Education. The Institute of Indigenous Medicine is one of the oldest indigenous medical institutions and leading institution of higher medical learning in Sri Lanka. In 1983, IIM was graded as Bachelor of Ayurvedic Medicine and Surgery (B.A.M.S.) and Bachelor of Unani Medicine and Surgery (B.U.M.S.) degree certificate. After the establishment of the Post Graduate Section in 1993, the institute has enhanced the capacity of research. At postgraduate level it offers M.Phil and M.D degrees. The institute is looking forward to the commencement of Doctorate awards and for special division of Postgraduate education. Taking the structure of the institute into consideration, there are two sections, Ayurveda and Unani managed by two sectional heads under the Director. There are six departments with departmental heads in Ayurvedic section and six departments with departmental heads in Unani section.

At the invitation of Ayurvedic Association of Gampaha, which took a lively interest in future development in Ayurveda, so as to give traditional medicine, its due place, an excellent Ayurvedic doctor G.P.Wickramarachchi who came from a very famous and respectable heritage of medicine in Siyane Korale had started the college of Gampaha Siddha – Ayurveda on 19th July in 1929. He maintained this Ayurvedic College with his own money and catered to all students' educational, residential and all other facilities freely. Due to the great service it had catered to the nation and the Ayurvedic field, the government decided to recognize it, as a governmental institute by Gazette No. 10270 in 13th July 1951. As a result of the Parliamentary

Act No. 30 of the year of 1982, the institute was renamed and became an institution under the University Grants Commission. The institute of Gampaha Wickramarachchi Ayurvedic Institute (GWAI) conducts full time five year degree course of B.A.M.S. with one year internship for the students. It has five units under the department of Basic Principles and six units under the Department of Chikithsa.

This institute is the only institute which confers Ayurvedic Degrees, except for the Institute of Indigenous Medicine – Rajagiriya. Both of these two Ayurvedic academic libraries were started in 1929, with establishments of their parent institutions aims to fulfill the needs of the medical students and to encourage staff to undertake research on relevant fields. The main purposes of these two libraries are to promote academic excellence in their parent institutions.

The developments in the Ayurvedic medicine in India led to the commencement of a research centre for Ayurvedic medicine in Sri Lanka. During that period in India, there were research activities in Ayurvedic medicine in Calcutta and Lucknow. This made a great impact on Sri Lanka to develop the field of research in Ayurveda. In 1936 the Executive Committee of health and also the Gupta Commission strongly recommended the value of establishing a research institute, for indigenous system of medicine, but these recommendations were not implemented. In 1956, the importance of a research centre for Ayurvedic medicine was emphasized again and again through the very famous Ayurvedic journal in India named "Nagarjuna." The government of Sri Lanka was responsible for the establishment of the Ayurveda research institute. Mr. P. B. Wanninayaka (the then Minister of Finance 1952 – 1956) and late Mr. S. W. R. D. Bandaranayaike (the then Prime Minister 1956 – 1959 ) gave their special dedication on the need for the establishment of an Ayurvedic research institute in Sri Lanka. As a result of these efforts in 1962, the research institute was established by the Ayurvedic Act of 1961. This institute was named in honour of (late) Mr. S. W. R. D. Bandaranayaike as Bandaranayaike Memorial Ayurvedic Research Institute (B.M.A.R.I.) and ceremonially declared open by late Pandit Jawaharlal Nehru the Prime Minister of India on the 14th of Oct. 1962. It is situated at Navinna close to Maharagama. The library of this institute was established under the Literary Research Division. The library of the BMARI mainly caters to the needs of research and the academic needs of medical professionals.

These three libraries are different in size and the collections depend on the institutions they cater for. The common objectives of these three libraries are, provision of learning materials for students, provision of teaching and research materials for members of the academic staff and provision of research and relevant materials for in -door and out - door researchers.

## Main Objective of the Study

To evaluate the library resources and services in Ayurvedic medical libraries in Sri Lanka.

Specific Objectives of the Study

1. To find out information resources available in these three libraries.
2. To investigate different services provided by these libraries.
3. To assess user satisfaction and their opinions regarding the information resources and services.

## Methodology

This study was conducted among users who use of three Ayurvedic medical libraries. In order to meet the objectives of the study, survey methodology was used.

## Research Instruments

The main research instrument was the questionnaire. In addition to that interviews and observation methods were utilized for data collection in this survey.

Three questionnaires were administered as the major instrument for data gathering. One for the academic staff members and another for the students (undergraduates and postgraduates) of two higher educational

institutions affiliated to universities. The third was for the Professionals and Para Professionals of Bandaranayaike Memorial Ayurvedic Research Institute. Both open ended and closed ended questions were included and Likert's five point scale was employed with equal negative and positive statements to measure the attitudes towards library process. The interview method was also used for this survey. Academic staff members of both institutions were picked randomly to be interviewed to collect information on their needs and the expectations as users of the two libraries. A number of visits were made to two university libraries and the research library during different hours of the day. The average length of an observation session was four hours per day. Areas covered were mainly the lending counter and the reference section. User Survey, Survey on Circulation and Survey on in house Usage were the three surveys were conducted.

## Population & Sample of the Study

## Population of the Study

The total population of this survey comprised with 101 academic staff members of the IIM and the GWAI, 974 undergraduate students of IIM and GWAI. And also 17 postgraduate students of IIM. 22 doctors and 01 scientist come under professionals where of 8 research assistants are para professionals at BMARI, of those who are eligible to use the library facilities of above mentioned three institutions.

## The Basis of the Sample of the Study

The sample had to be representative of all categories and selected randomly for every three target groups viz. Academic staff members, Students and Professionals / Para Professionals. Academic Staff Members comprised of five groups according to their designation. They are, Professor and Associate Professor, Senior Lecturer Grade 1, Senior Lecturer Grade 11, Lecturer and Assistant lecturer (Probationary). To get a representative view from the academics of IIM, four members from each department were selected as the sample. The academic staff members are attached to 12 departments and into two sections as Ayurveda and Unani of the IIM. To get a representative view from

the academics, four members from each department were selected as the sample. The total strength of academics of IIM is 68 and 48 questionnaires were distributed among them. Of them 30 academics responded and the percentage was 62.5. The total academic staff strength is 33 of GWAI. They are attached to five units under the Department of Basic Principles and 6 units under the Department of Chikithsa were included in this study. 2 academics from each units were selected for the sample, the total being 22. Of them 15 responded and the 68.1%.

The total strength of undergraduates of IIM is 974 and 100 students were selected randomly and 20 questionnaires were distributed among each year of undergraduates from year 1 to year 5. Of them 61 responded, the percentage is 61. In the case of GWAI the total undergraduate strength stood at 642. 15 undergraduates were selected from each year totaling 75. Of them 47 responded, 62.6%. Due to the meager number of postgraduate students in the IIM, it was decided to deploy the entire student population as the sample for the study. Of all 17 postgraduate students, who were provided with questionnaires only 14 responded, indicating a percentage of 82.3.

Questionnaire 3 was circulated among Professionals/Para Professionals, 31 in number at BMARI. 22 Doctors and 01 Scientist comes under Professionals where of 8 Research Assistants are Para Professionals. Here also the total number of 31 professionals were regarded as the sample. Only 15 responded out of 23 and the percentage was 65.2. All the para professionals 8 in number responded indicating 100%.

## Literature Review

The collection evaluation is not a new concept in the field of library and information science. Evaluation of library resources and services as well as library user surveys have become popular specially in academic libraries during the past two – three decades.

Kim, (2008)[1] has studied on Introducing Six Sigma Theory in the Library for Service Competitiveness enhancement and he promotes research on reasonable and efficient evaluation tools for "user satisfaction" and "performance measurement". Six Sigma means, "a systematic

innovative activity to statistically measure and analyze causes of defects that happen in all parts of management, and then remove those causes." As a theory it was originally used in manufacturing. Today it applies to service areas. This study is not only to do a simple quantitative analysis to evaluate library service but also to find out user complaint factors and it also aims to establish information infrastructure and secure service competitiveness and finally to improve user satisfaction, the ultimate goal of libraries, through setting up and carrying out Six Sigma projects as well as continuing evaluation. In this study, Kim further explained Six Sigma theory is used in order to review various aspects of library management, conduct evaluation and find a service process necessary for improvement to raise customer satisfaction. In addition, it suggests what should be done in the future in association with strategies and visions for library management.

Fleet, (2007)[2] pointed out that data gathering is the first step in the collection evaluation process. Colleting data whether quantitative or qualitative, is a way to describe current conditions. Evaluation involves examining data in the context of appropriate organizational models and in terms of the library's mission. Fleet discussed further a wide variety of techniques are available to librarians that will assist in evaluating those collections. Carefully gathered data analyzed in the context of the library's mission and the community's needs, form the basis for evaluation and effective decision making.

A critical study of the information resources and services in academic and research libraries in medicine in Sri Lanka draws the urgent need to identify the factors affecting in deficiencies in the process of information provision and its dissemination in medical sciences. Seneviratna, (2001)[3] explained that the aim of her study is to investigate the available resources in the selected medical libraries and asses the services provided by them. The study reveals that Sri Lankan medical libraries are capable of providing only the basic services. According to the survey results the existing resources and services provided to the medical community are grossly inadequate to meet the demands. She suggests that library collections need strengthening and staff need more training to cope with the modern technology.

## Findings of the Study

### Information Resources and Services of Selected Three Libraries

## Information Resources of the IIM Library

The IIM library started in 1929 aims to fulfill the needs of the medical students and to encourage staff to undertake research on health science. The main purpose of the library is to promote academic excellence in the Institute of indigenous medicine.

The main book collection of IIM library mainly covers a wide range of medical books related to Ayurveda and indigenous systems of medicine, Unani system of medicine and also other medical systems. Books on Ayurveda which is written in Sanskrit language and Unani books in Urdu and Arabic languages are among them. In addition to the main book collection there are three special collections comprising Medicinal plants, Ola leaf manuscripts and Hand written manuscripts. It is rich in historical materials and rare book collection on the history of the indigenous and Ayurvedic medicine in Sri Lanka. It also has a collection of non – medical books for recreational reading. Compared with books, periodicals contain latest information on allied subjects, very important to academics as well as researchers for their academic activities. And also compared with books, the journals are comparatively expensive. Most of the periodicals related to Ayurveda medical field are published in India. The library of IIM, has been subscribing 28 foreign periodicals related to the three medical streams of Ayurveda, Unani and Western medicine. Theses are very valuable sources of information, specially for the researchers. Theses collection consists of theses and dissertations submitted for MPhil, MSc., MLS, MD and PhD degrees by the academic staff members of both sections in Ayurveda and Unani of the Institute of Indigenous Medicine done their postgraduates in locally and abroad and also Postgraduate students. The users who wish to reach current information immediately and easily are much benefited by E- Resources. The Library of IIM has limited number of non book materials

The Dewey Decimal Classification Scheme, $21^{st}$ edition is used to classify library books. AACR 2 is used for cataloguing purposes. The library has a computerized catalogue for books using KOHA software.

The card catalogue has two sections viz.1) author – title catalogue and 11) classified catalogue. This library is one of the member libraries of networks of HELLIS and SLISTINET.

## Information Resources of the GWAI Library

The library of Gampaha Wickramarachchi Ayurvedic Institute was founded In 1929, the same year that the college was inaugurated as a private Ayurvedic medical college. Information resources of the GWAI library also consists of Books/ Monographs, Periodicals, Theses & dissertations, Non Book Materials and Ola Leaf Manuscripts etc. The library of GWAI consists of wide range of medical books related to Ayurveda and indigenous systems of medicine, and also have three special collections viz. Rare Book Collection, Hand Written Manuscripts and Ola Leaf Manuscripts. It has a separate collection of old bound volumes of periodicals and also theses. Theses included in the library of GWAI which were offered by the permanent academics of GWAI. The Library of GWAI have limited number of non book materials.

The Dewey Decimal Classification Scheme- 21$^{st}$ edition is used to classify books. The books are arranged on the shelves according to their class numbers. AACR 2 is used for cataloguing purposes. The card catalogue has search headings under author and title apart from the classified catalogue. The computerization of the catalogue is in progress. This library is also one of the member libraries of networks of HELLIS and SLISTINET.

## Information Resources of the BMARI Library

The Bandaranayaike Memorial Ayurvedic Research Institute was established in 1962. The main objective of this research institute was to uplift research and related activities of indigenous and Ayurvedic medical field in Sri Lanka. In the same year that the research institute was inaugurated, the library was also established. The library has a comprehensive collection of books, mainly covers a wide range of historical medical materials and invaluable rare book collection on the history of medicine in Sri Lanka. Specially, it has a very good collection of Ola Leaf Manuscripts. But not maintained non – book materials. The books are classified according to the DDC classification scheme, 20$^{th}$ edition.

# Services Provided by Selected Three Ayurvedic Medicinal Libraries

The main objective of any library is to provide services for its users effectively. In any type of library, whether it is a school library, a university library, a special or a research library, the most important and popular element is “Service”. “Circulation, reference service and ILL are referred to as reader services. Documentation, translation, photocopying, audio – visual aids and extension activities are referred to as auxiliary services”. (Sharma, 1980)

The three selected libraries of Ayurveda Medicine offer following services to their users of undergraduate & postgraduate students as well as academic staff and professionals & para professionals.

## Lending Service

Circulation of books is one of the most popular services in any university library. A greater portion of the library collection is usually reserved for lending purposes. All the three libraries surveyed for this study provide services free of charge to their users. The lending facilities differ according to the status of the users of three libraries.

## Reference Service

The importance of reference service increases day by day, specially in university libraries. Reference service is the most obvious service which all the libraries offer to all the users as well as non – users. Both libraries of IIM and GWAI maintain comprehensive separate reference and permanent reference collections. Permanent reference materials including quick reference materials such as Encyclopedias, Dictionaries, Directories, hand books, Glossaries and important text books in ready reference nature are reserved strictly for reference purposes within the library and not permitted to lend under any circumstances.

## Inter Library Loan Service

The inter library loan service (ILL) is treated as more important service among university libraries. Libraries do not have sufficient financial allocation to purchase or obtain all materials required for their users' needs. Besides constrained budgetary allocations and the information explosion have made it impossible for any library to be self sufficient. As a solution to this, libraries with similar status and interests should establish an inter – library loan service. This co- operative system helps to access to the information resources of another library, on mutual co-operation. Facilities for ILL service are available in two academic libraries of IIM and GWAI.

## Resource Sharing Facilities and Networked Resources

Accession to network resources is the most important solution to many information needs of health professionals. Resource sharing through networks is the most recent trend and most effective way of getting current information. The networks of HELLIS and SLISTINET are useful attempts for resource sharing among health science libraries and the library of IIM obtains benefits of both these networks.

## Selective Dissemination of Information (SDI Service)

SDI service is very useful to enhance the resource sharing activities among the libraries and it is very valuable tool for academics cum medical professionals to fulfill their current information needs of chosen topics. The library of IIM provides the benefits of this service to its users with the help of the HELLIS network.

## Photocopy Service


At present photocopying is a very popular document reproduction service and plays an important role in servicing the library clients. All three libraries surveyed offer photocopying facilities and this service has to be provided a subsidized price and within the legal framework of the copyright law.

## Discussion & Data Analysis

## Utilization of Information Resources

The questionnaire addressed to all categories of user community, "What are the information sources you use frequently in the library?" According to the responses given all the respondents namely 100% use books/monographs. The second priority of students about 82.79 % use others, that means encyclopedias and dictionaries; academics 88.89% prefer to use periodicals. The least used information resource of students is hand written manuscripts. The least popular information resource of 17.78% among academics is audio-visual materials. The professionals and para professionals of the library of BMARI do not use hand written manuscripts, theses, audio -visuals and information networks. The first priority among them was books/monographs.

Figure 1- Utilization of Information Resources




Suggestions to Improve the Information Resources

As illustrated by table 1 majority of students (84.42%) have suggested that more and more new Ayurvedic and Unani medical books purchased for the library. Among the suggestions made by students the need to increase the quantity of existing book collection accounts for 28.57%.

Students have paid the least attention for modern technology for libraries and E – materials ( 18.18% ). The emphasis levid by students for purchase of more local and foreign journals was a positive trend in acquiring current information.  In case of academics their suggestion was to increase the quantity of collection and more research publications take the first priority. Suggestions no. 2, 4 and 5 have been given equal preference (48.28 %) by the academics.


Table 1 - Suggestions to Improve the Information Resources

| **Suggestions** | **Students** | | **Academics** | |
|---|---|---|---|---|
| | **Frequency** | **Percentage** | **Frequency** | **Percentage** |
| i. Develop the Book Collection | 65 | 84.42% | 24 | 82.76% |
| ii. Purchase more Local and International Journals | 32 | 41.56% | 14 | 48.28% |
| iii. Increase the quantity of collection and more research publications | 22 | 28.57% | 25 | 86.21% |
| iv. Modern Technology for Library/ More E-materials | 14 | 18.18% | 14 | 48.28% |
| v. Improve the Internet/E-searching facilities | 27 | 35.06% | 14 | 48.28% |

## Frequency of Visits

As per the responses submitted by Students and Professionals/Para Professionals regarding frequency of visits, daily visits rank highest among them, whereas the highest frequency indicated by academics is three days a week.


Figure 2 - Frequency of Visits




Usage of Library Services

The aim of any library is to provide the optimum service to their users. Among the many types of services provided by the library, lending service, reference service, photocopy service and internet searching are the most used services by users of these three libraries. The question in the three questionnaires addressed to students, academics, and professionals and para professionals "What are the services you obtain from this library? According to the responses illustrates the following figure no. 3, the first priority of academics and professionals is that almost 100% have obtained the benefits of reference service. In all three libraries highest priority service seem to be the reference service, the lending service ranks second in preference. Internet & e-searching appears to be the least preferred service compared with other three main services.

Figure 3 – Comparison of Major Library Services




Popularity of Services among Academics

The most popular service of academics in IIM and GWAI is the reference service, percentage wise it was 100. The preference for the lending service was 93.33%. This implies that the lending service ranks number 2 with regard to popularity of services. The number of Academics who responded was 45 and only 2 (4.22%) had used inter-library loans, being the least used service among academics. These values are illustrated by Table 2 as follows.

Table 2 - Popularity of Services among Academics

| **Service** | **Frequency** | **Percentage** |
|---|---|---|
| Lending service | 42 | 93.33% |
| Reference service | 45 | 100% |
| Inter library loan | 2 | 4.22% |
| Network facilities | 17 | 37.78% |
| Content page service | 7 | 15.56% |
| Photocopy service | 39 | 86.67% |
| Internet & E- resources | 26 | 57.78% |


## User Satisfaction

The library is a centre which provides various services for it's users and it is very vital to evaluate the satisfaction level. The responses given by the students and the academics in the libraries of IIM and GWAI to the question, " What is the percentage of your information needs fulfilled from this library?" are illustrated the table 3 and the figure 4.

Table 3 - Overall Satisfaction Level

| **Level of Satisfaction** | **Students** | | **Academics** | |
|---|---|---|---|---|
| | **Frequency** | **Percentage** | **Frequency** | **Percentage** |
| 0-25% | - | 0.00% | 1 | 2.22% |
| 26-50% | 21 | 17.21% | 14 | 31.11% |
| 51-75% | 40 | 32.79% | 19 | 42.22% |
| More than 75% | 23 | 18.85% | 4 | 8.89% |
| No Answer | 38 | 31.15% | 7 | 15.56% |

Figure 4 - Overall Satisfaction Level



As revealed by the figure 4 majority of academics who responded are in the 51% - 75% satisfaction level. As a percentage it is 42%. The least of 0-25% indicates a percentage of 2.22%. In case of students the majority are in the satisfaction level of 51-75%. And the least number is 26-50%. Of the non respondents 45 the majority are students, the percentage being 31.When the overall satisfaction level is analyzed, it can be concluded that a majority of both students 32.79% and academics 42.22% are in the third (51-75%) satisfactory level. Taking into consideration the data analyzed the two academic libraries namely IIM and GWAI are nither at the low level nor high level as far as user's opinion are concerned. The fact highlights that collection and services provided by these libraries are in the satisfactory level.

## Fulfillment of Research Needs of Academics

One of the main objectives of a University/ Higher education institute is the active involvement of academics in research work. The resources of a university library should be developed with a view to fulfill the learning, teaching and research needs of students and academics. By the questions no. 5.1, 5.2 and 5.3 in the questionnaire distributed among academics they were asked to indicate whether the subject areas to support their research needs adequate, inadequate or poor. Their responses are given in the Table 4.

Table 4 - Fulfillment of Research Needs of Academics

| | Ayurveda | Traditional | Unani | Western |
|---|---|---|---|---|
| Adequate | 10 | 2 | 2 | 14 |
| Inadequate | 21 | 24 | 1 | 18 |
| Poor | 1 | 4 | 7 | 0 |

Both IIM and GWAI should necessarily possess a good collection of books in indigenous medicine. Surprisingly both these institutions do not meet the needs of their users, as compared with collections on Ayurveda, traditional and Unani medicine, collection on western medicine is quite adequate. The collection on western medicine is quite higher. The undergraduates, post graduates and academics who process Unani medicine use the Unani collection. As revealed by the table 4

it is quite evident that the academics are badly hampered due to the poor collection of Unani medicine. This is attributed mainly to the less availability of such materials and the low percentage of publications of Unani books.

## Suggested Services to be Improved

Based on the results of the survey following suggestions could made for upgrading the library services and status of the three Ayurvedic libraries in Sri Lanka.

Table 5 – Suggested Services to be Improved

| Service | Frequency | Percentage |
|---|---|---|
| Current Awareness Services | 17 | 44.73% |
| Develop the Audio-visual materials | 19 | 50% |
| Link with Colombo Medical Faculty/ PGIM libraries | 10 | 26.32% |
| Internet and E-searching facilities | 21 | 55.26% |
| Regular Basis Awareness Programmes | 13 | 34.21% |

Only 86 academics out of 95 have made their suggestions, highest priority was for internet and database searching facilities. Availability of internet and database searching facility would enable the medical professionals to access to current and relevant information related to health science. The second preference (50%) was to develop the audio-visual materials. Further the suggestion for linking with sophisticated libraries equipped with latest information services, like Colombo medical faculty and the PGIM libraries was very applicable to academics.

## Major Findings and Conclusion

Relevant information on medicine is made readily available for the medical and health science students and academics in most on the developed countries. But in a developing country like Sri Lanka there are many deficiencies in information dissemination due to many contributing factors like lack of funds, inadequate resources, insufficient experienced and trained man power, etc. This is true of the three libraries

on Ayurveda medicine in Sri Lanka. In addition lack of published materials related to Ayurveda and Unani medicine can be regarded as another major problem faced by Ayurvedic medicinal libraries.

The study has revealed further several deficiencies of the three libraries reviewed. Two of the libraries namely, Institute of Indigenous Medicine and Gampaha Wickramarachchi Ayurvedic Institute are on a sounder putting than the library of BMARI. For example the book collections are systematically classified an arranged at the two libraries of IIM and GWAI. But the three libraries specializing the Ayurvedic medicine are at different levels of development. The study has also disclosed that the reference service is the most used service in all the three libraries. Services like inter library loan and other materials are made use of very rarely. The building up of the collection is another important step that has to be taken by all the three libraries specially BMARI library. Adequate funds have to be allocated to purchase more periodicals. The use of database searching has to be encouraged at all these three Ayurvedic medicinal libraries. Likewise, increasing the facilities for database searching and giving more provision to the use of e- materials and special attention has to be paid for the building of the good collection of e-materials are needed.

The support from international agencies such as WHO to strengthen the resources and services provided by the three libraries is another action to be taken in the correct direction. According to the users' opinion collection and services provided by these libraries are in the satisfactory level. The facts reveled by this study highlights the above priorities that should be given to the development of the Information resources available and library services provided by three Ayurvedic medicinal libraries in Sri Lanka.

## Suggestions

- Building up of a good collection of books related to the Unani system of medicine at the library of IIM.
- It is paramount importance to start a current periodical collection both at the libraries of GWAI and BMARI.
- 

- Further steps have to be taken to improve the Reference service at these three libraries.
- Increasing the facilities for database searching, specially relevant to the health science field at all three libraries.
- Giving more provision to the use of E - materials.
- Regular user education programmes is highly recommended for the library of GWAI.
- Users' surveys should be conducted at regular intervals with a view to assess the users needs and their priorities are recommended at all three libraries.

## References


Fleet, C. V. (2007). The Culture of Evaluation. Colordo:Libraries Unlimited http://eduscapes.com/seeds/ed.4.html

Kim, D. S. (2008). Introducing Six Sigma Theory in the Library for Service Competitiveness Enhancement. http://www.ifla.org/iv/ifla72/index.htm

Lancaster, W. F. (1993). If Do You Want to Evaluate Your library. Virginia: Information Resources Press.

Mahapathra, P.K. (1999). Collection Management in Libraries. New Delhi: Ess Ess Publication

Seneviratna, D. (2001). Necessity of Human Resource Development in Medical Libraries in Sri Lanka, Library Review (New Series), 14 (2) 12-14.

# Film Media

# ශ්‍රී ලංකාවේ සිංහල භාෂාමය සිනමා සාහිත්‍යය පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් (1947-2016 දක්වා පළ වූ ප්‍රකාශන ඇසුරින්)

**උදිත අලහකෝන්**
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
udithaala@gmail.com

## Abstract

Cinema literature is a developing subject field in Sri Lanka. Specially, with the advent of cinema institutes its value as an academic subject has been expanded. Therefore, books published on cinema were increased. The main objective of the study is to analyze the books published on cinema in Sinhala language in Sri Lanka during 1947-2016. The major source for data collection was Sri Lanka National Bibliography. Bibliometric study method was used to analyze collected data according to the year, author, publisher, translations, sub-subjects etc. Total number of books published during the period under examined were 322. Most books were published during the decade covering 2007-2016. Gunasiri Silva and Thusita Jayasundara were the prominent authors contributed to promote the cinema literature among Sinhalese readers. Godage and Sarasvati were the Leading publishers who contributed to publish relevant books. 176 books out of 322 were belonged to basically two subcategories such as film criticism and scripts. The study revealed that the greatest number of books contain descriptive information rather than analytical and persuasive. Research publications published during the relevant period were significantly low. As cinema is becoming an academic discipline among universities and other higher education institutes authors and publishers must focus their attention to proliferate

research publications on cinema. Further, it is also proposed to make a conscious attempt to increase the quality of the content with the help of latest philosophical and cinematic concepts used in the contemporary global cinema and supersede the traditional framework of criticism.

## හැඳින්වීම

දහනව වැනි සියවස අග භාගයේ දී ප්‍රංශයේ ලුමියෙරේ සොහොයුරන් විසින් ලොවට හඳුන්වා දුන් චිත්‍රපටය විසි වැනි සියවස පුරා අතු ඉති ලා වැඩුණු අතර එහෙයින් ම එය විසිවන සියවසේ කලාව ලෙස අභිෂේක ලැබීය. කාර්මිකකරණය සහ නාගරිකකරණය වේගවත් වීමත් සමඟ විශාල ජනගහනයක් නගර වෙත සංක්‍රමණය වූ අතර මෙම නගරවාසීන්ගේ ප්‍රමුඛතම විනෝදාස්වාද මාර්ගය බවට චිත්‍රපටය පත් විය. මූලිකව කලාත්මක හා අධ්‍යාපනික මාධ්‍යයක් ලෙස ඇරඹි චිත්‍රපටය පසුකාලීනව දැවැන්ත ප්‍රාග්ධනයක් අවශ්‍ය කර්මාන්තයක් ලෙසින් වර්ධනය විය. පසුගිය සියවසකට අධික කාලය පුරා සිනමාව එහි තාක්ෂණික අංගවලින් පමණක් නොව ශානරීය විවිධත්වය, ප්‍රේක්ෂකත්වය මෙන් ම න්‍යායික පාර්ශ්වයෙන් ද වර්ධනීය මට්ටමක් අත්පත් කර ගෙන ඇත. එමෙන් ම චිත්‍රපටය නිෂ්පාදනය සහ බෙදාහැරීම ජාතික සීමාවන් අබිබවා ගෝලීය තත්ත්වයට පත්ව තිබේ. රටවල් ගණනාවක් වාර්ෂිකව ජාත්‍යන්තර සිනමා උත්සව පවත්වනු ලබන අතර එහි දී විවිධ ප්‍රවර්ග යටතේ ලොව චිත්‍රපට ඇගයීමට ලක් කරනු ලැබේ. ඇමරිකා එක්සත් ජනපදයේ හොලිවුඩ් සහ ඉන්දියාවේ බොලිවුඩ් වැනි සිනමා රාජධානි නිර්මාණය වී ඇත. සිනමාවේ මෙම කර්මාන්තමය ප්‍රසාරණය හේතු කොට ගෙන එය ඇතැම් රටවල දළ ජාතික ආදායමේ ප්‍රධාන සංරචකය බවට  පත්ව ඇත.

මෙම වර්ධනීය ක්‍රියාවලියට සාපේක්ෂව සිනමාව පිළිබඳ අධ්‍යයන ක්ෂේත්‍රයද සිනමා ප්‍රකාශන ක්ෂේත්‍රය ද ඉදිරියට ගමන් කරනු දැකිය හැකිය. බොහෝ රටවල සිනමාව සඳහා ම වූ අධ්‍යයන ආයතන බිහි වී ඇති අතර එය ශාස්ත්‍රීය විෂයක් ලෙස ලොව ප්‍රකට විශ්වවිද්‍යාල පාඨමාලාවලට ඇතුළත් කර ඇත. සිනමාකරුවන් පමණක් නොව සිනමාව පිළිබඳ විද්වතුන්, ශාස්ත්‍රඥයන්, පර්යේෂකයන්, ලේඛකයන්  ලොවට දායාද කිරීම එකී පාඨමාලාවල අභිප්‍රාය වේ. එහෙයින් සිනමාව කලාවක්, කර්මාන්තයක් මෙන් ම ශාස්ත්‍රීය විෂයක් ලෙස සංවර්ධනය වීමේ දී සිනමා ප්‍රකාශනවලට අතිශය වැදගත් ස්ථානයක් හිමි වේ. ලෝක මට්ටමින් ගත් විට බෙහෙවින් දියුණු, විවිධත්වයෙන් යුතු සිනමා සාහිත්‍යයක් පවත්නේ එහෙයිනි.

ශ්‍රී ලංකාවේ සිනමාව මේ වන විට වසර හැත්තෑව ඉක්මවා ඇත. 1947 කඩවුණු පොරොන්දුව චිත්‍රපටයෙන් ඇරඹි මෙරට සිංහල චිත්‍රපට නිෂ්පාදනය වර්තමානයේ ඩිජිටල් සිනමාව දක්වා වර්ධනය වී තිබේ. මෙම දශක හත පුරා විවිධ ශානර නියෝජනය කරන විශිෂ්ට චිත්‍රපට රැසක් දායාද කිරීමට මෙරට සිනමාකරුවෝ සමත්ව ඇත. මෙරට නිෂ්පාදිත චිත්‍රපට රැසක් ජාත්‍යන්තර සිනමා උළෙල නියෝජනය කර ඇති අතර ඒවායෙන් සමහරක් සම්මානයට ද පාත්‍ර වී ඇත. මෙම සම්භාව්‍ය සිනමාවට සමාන්තරව පොදුජන රසිකත්වය ආමන්ත්‍රණය කළ ජනප්‍රිය චිත්‍රපට ප්‍රවාහයක් ද මෙරට පවතී. පොදු රසිකයා සිනමාව වෙත ඇද බැඳ තබා, කර්මාන්තයක් වශයෙන් නොනැසී පැවතීමට සිනමාව වෙත ජීවය දෙනුයේ මෙම ජනප්‍රිය සිනමාවය. කෙසේ වෙතත්,

1980 දශකයේ වාර්ගික කලබල සහ සිවිල් අරගල හේතු කොට ගෙන පොදු රසවින්දන මාධ්‍යයක් ලෙස පැවති සිනමා ශාලාවලින් ප්‍රේක්ෂකයන් යම් තරමකට දුරස් කෙරිණි. එහෙත් 1990 දශකයේ සිට ශීඝ්‍ර දියුණුවක් අත්පත් කර ගත් තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා අන්තර්ජාලයේ පුළුල් ව්‍යාප්තිය, එකී අර්බුදය සමතික්‍රමණය කිරීමට මගක් විවර කර දුන්නේය. එනමුදු, මෙම තාක්ෂණික පිළිතුර සිනමා ශාලා ප්‍රේක්ෂකයා හුදෙකලා ප්‍රේක්ෂකයෙක් බවට රූපාන්තරණය කළේය. මෙකී සියලු උච්චාවචන තුළ සිනමාව සහ ප්‍රේක්ෂකයා අතර සබඳතාව අඛණ්ඩව පවත්වා ගෙන යාමට දායක වූ ප්‍රමුඛ සාධකයක් වන්නේ සිනමා සාහිත්‍යයයි.

එමෙන් ම පසුගිය දශක දෙකක පමණ කාලයක සිට මෙරට සිනමාව පිළිබඳ අධ්‍යාපනික ආයතන, පාඨමාලා සහ සිනමාව අධ්‍යයන කරන්නන්ගේ සංඛ්‍යාත්මක වර්ධනයක් දක්නට පුළුවන. කැලණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය, සෞන්දර්ය හා ප්‍රසංග කලා විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය යන රාජ්‍ය විශ්වවිද්‍යාල සිනමාව හා ඊට සම්බන්ධ විවිධ තාක්ෂණික හා ශාස්ත්‍රීය අංශ පිළිබඳ උපාධි පාඨමාලා පවත්වනු ලබයි. මෙයට අමතරව, ශ්‍රී ලංකා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා පදනමට අනුබද්ධිත ඩිජිටල් සිනමා ඇකඩමිය, ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයට අනුබද්ධ ශ්‍රී ලංකා චිත්‍රපට පාසල, රජයේ චිත්‍රපට සංස්ථාව, යනාදි රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සිනමාව සම්බන්ධ උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පවත්වයි. තව ද, විවිධ චිත්‍රපට සාමූහික, සංගම්, රාජ්‍ය නොවන සංවිධාන, විදේශීය රටවල සංස්කෘතික මධ්‍යස්ථාන සිනමා උත්සව, සම්මන්ත්‍රණ, වැඩමුළු, කතිකා යනාදිය සංවිධානය කරමින් සිනමා ශිල්පීන්ගේ සහ ප්‍රේක්ෂකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටී. මෙම පාඨමාලා, වැඩමුළු සහ වෙනත් ඉසව්වලට සහභාගි වන්නන් බහුතරයක් සිංහල භාෂාවෙන් පොතපත කියවන සහ කටයුතු කරන අය වේ. එහෙයින් මෙම ක්ෂේත්‍රයට රුචියක් දක්වන්න වුන්ගේ දැනුම වර්ධනය සඳහා පොහොසත් සිනමා සාහිත්‍යයක් සිංහල භාෂාවෙන් පැවතීම අනිවාර්ය කොන්දේසියක් වේ. මෙය හුදෙක් සිනමා ක්ෂේත්‍රයට පමණක් සීමා වූ කොන්දේසියක් නොවේ. ඕනෑම විෂය හෝ වෘත්තීය ක්ෂේත්‍රයක ගුණාත්මක වර්ධනය සඳහා එය අත්‍යවශ්‍ය වේ.

මෙරට සිනමා සාහිත්‍ය ගත් කල්හි එය විවිධත්වයෙන් යුත් බව පැහැදිලිය. එයට පුවත්පත් ලිපි, සඟරා ලිපි, දේශන පිටපත්, සමරු කලාප, පොත් යනාදි මුද්‍රිත මාධ්‍ය ද බ්ලොග්, වෙබ් අඩවි වැනි අන්තර්ජාල ප්‍රකාශන ද අයත් වේ. පොදුවේ සෑම පුවත්පතක ම සිනමා විචාර සහ අතිරේක පළවන අතර සිනමාව සඳහා ම වෙන් වූ පුවත්පත් ද වේ. (උදාඃ විසිතුර, ගීතා, සරසවිය) එමෙන් ම සාමාන්‍ය වාර සඟරාවල සිනමාව පිළිබඳ ලිපි පළවන අතර සිනමාව සඳහාම වෙන් වූ සඟරා ද තිබේ. (උදාඃ චිත්‍රපට, සිනෙසිත්, Agenda 14) සිනමා ප්‍රකාශන සම්බන්ධයෙන් මෙවන් විවිධත්වයක් පැවතිය ද මෙම අධ්‍යයනයේ දී අවධානයට යොමු කරනුයේ 1947-2017 දක්වා වසර 70 තුළ

සිනමාව විෂය කොට ගෙන පළ වූ ග්‍රන්ථ වෙත පමණි.

## පර්යේෂණ අරමුණු

- සිනමා ග්‍රන්ථ පළවීමේ සීඝ්‍රතාව විශ්ලේෂණය කිරීම.
- කතුවරුන්ගේ, පරිවර්තකයන්ගේ සංස්කාරකවරුන්ගේ දායකත්වය අනුව සිනමා ග්‍රන්ථ විග්‍රහ කිරීම.
- සිනමා ග්‍රන්ථ සමාජගත කිරීම සඳහා ප්‍රකාශකයන්ගේ දායකත්වය විමසීම.
- සිනමාවේ ආනුශංගික විෂය ක්ෂේත්‍රවලට අනුව ග්‍රන්ථ පළ වීම අධ්‍යයනය කිරීම.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ග්‍රන්ථමිතික අධ්‍යයන ක්‍රමවේදය භාවිත කර ඇත. ඒ අනුව 1947--2017 දක්වා මෙරට තුළ පළ වූ සිනමා ප්‍රකාශන පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට ප්‍රධානතම මූලාශ්‍රය ලෙස ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය යොදා ගැණිනි. 1885 අංක 1 දරන මුද්‍රණකරුවන්ගේ සහ ප්‍රකාශකයන්ගේ ආඥා පනතට අනුව සෑම මුද්‍රණකරුවකු ම තමන් මුද්‍රණය කරන ප්‍රකාශනවලින් පිටපත් පහක් ජාතික ලේඛනාගාරයට යැවිය යුතුය. එහි ලියාපදිංචි කෙරෙන එකී පිටපත්වලින් එකක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙහි තැන්පත් කෙරේ. ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් කරනුයේ එම ප්‍රකාශන පිළිබඳ තොරතුරු වේ. එහෙයින් මෙම අධ්‍යයනයට භාවිත කරන ලද්දේ ජාතික ලේඛනාගාරයේ ලියාපදිංචි කරන ලද ප්‍රකාශන පමණි.

ග්‍රන්ථමිතික අධ්‍යයනය යනු මුළුමනින් ම සංඛ්‍යාත්මක විග්‍රහයකි. විශේෂයෙන්, කිසියම් විෂයක ප්‍රකාශන රටාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම සඳහා මෙම අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරනු ලැබේ. මෙම අධ්‍යයනය සඳහා ග්‍රන්ථමිතික ක්‍රමවේදය යොදා ගන්නා ලද්දේ එහෙයිනි.

## සාහිත්‍ය විමර්ශනය

ලෝක සිනමාවේ වයස මේ වන විට වසර 128කි. 1895 දෙසැම්බර් 28 දා ප්‍රංශයේ උපන් සිනමාව සියවසකට අධික කාලය තුළ විවිධ භූමිභාග, ජන කොටස්, අධ්‍යාත්ම සිසාරා විවිධ ශාඛා විහිදුවමින් සංවර්ධනය වී ඇත. Brazin (1967) මනුෂ්‍යයා විශ්වයට දක්වන සබඳතාවේ ප්‍රතිරූපණය ලෙස සිනමාව අර්ථ දක්වන අතර සිනමාව ලොව පවත්නා වඩාත් ම ජාත්‍යන්තර ලක්ෂණ නිරූපණය කරන කලාව බව Eisenstin (1959) පවසයි. මේ අනුව සිනමාව කලාවක්, සංස්කෘතික භාණ්ඩයක්, කර්මාන්තයක්, දෘෂ්ටිවාදී මෙවලමක්

ලෙස ලොව පුරා ව්‍යාප්තව ඇත. මෙම කාලය පුරා ලෝක සිනමාව විවිධ ශානර ඔස්සේ සංවර්ධනය වී ඇත. ත්‍රාසජනක, ගොපලු, ප්‍රේම, යුද, ක්‍රියාදාම, චරිතාපදාන, සංගීතමය, හොල්මන්, ක්‍රීඩා, ප්‍රහසන, අපරාධ, වික්‍රමාන්විත, සමාජීය, ඓතිහාසික, විද්‍යා, ෆැන්ටසි, සජීවීකරණ, කලාත්මක, වාර්තා යනාදි වශයෙන් මෙකී ශානරයන්හි දීර්ඝ ලැයිස්තුවක් සැකසිය හැකිය. (www. scriptmag .com) මෙම ශානරයන්හි උප ශානර ද රාශියක් පවතී.

ශ්‍රී ලංකාවේ ප්‍රථම කතා නාද සිංහල චිත්‍රපටය ලෙස කඩවුණු පොරොන්දුව 1947 ජනවාරි 21 දින කල එළි බැස්ස ද ඊට පෙර සිට ම මෙරට සිනමාත්මක ප්‍රයත්න පැවතිණි. මේ අනුව 1925 දී රාජකීය වික්‍රමය මෙරට නිෂ්පාදිත ප්‍රථම චිත්‍රපටය ලෙස ද 1936 දී පළිගැනීම මෙරට ප්‍රදර්ශනය කළ ප්‍රථම චිත්‍රපටය ලෙස ද පිළි ගැනේ. (ජයසුන්දර, 2014)

සිංහල සිනමාවේ විධිමත් ආරම්භය 1947 වුව ද සිනමාව පිළිබඳ සිංහල භාෂාමය ග්‍රන්ථයක් පළ වනුයේ ඊට දශකයකට පසුය. එලෙස ඇරඹි සිනමා සාහිත්‍යය මේ වන විට වර්ධනයක් අත් කර ගෙන සිටිය ද එය තවමත් පවතින්නේ ප්‍රාථමික මට්ටමකය. (වේරගම, 1993) මෙය ශ්‍රී ලාංකීය සිනමාවේ පවත්නා අර්බුදයකට හේතුවක් බව පෙනී යන්නේ ''සිනමාව තුළින් නව චින්තන ධාරාවක් ගොඩ නගමින් මානව සංවර්ධනයේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමේ වගකීම පැවරී ඇත්තේ සිනමා සාහිත්‍යයටය'' යනුවෙන් වේරගම (1988) කරන ප්‍රකාශය සලකා බැලීමේ දීය. මේ අනුව පැහැදිලි වන්නේ සිනමා සංස්කෘතියක ප්‍රභවයත්, පැවැත්මත් මූලික වශයෙන් හරවත් සිනමා සාහිත්‍යයක් මත රඳා පවත්නා බවය. ලෝකයේ සිනමා සාහිත්‍යයේ ආරම්භය දෙස බැලීමේ දී පෙනී යන්නේ නළු නිළියන් පිළිබඳ තොරතුරු ඇතුළත් පුවත්පත් සහ සඟරා ඊට මූලික වී ඇති බවය. බටහිර රටවල පවා ප්‍රබල චිත්‍රපට සංස්කෘතියක් බිහි වූයේ මෙම නිසරු සිනමා සඟරාවලට අභියෝග යක් බවට පත් වූ හරවත් සිනමා ප්‍රකාශන සහ ශාස්ත්‍රීය ග්‍රන්ථ බිහි වන්නට වූ පසුය.

## දත්ත විශ්ලේෂණය

1947--2016 දක්වා දශක හත තුළ සිනමා ග්‍රන්ථ ප්‍රකාශනය සංඛ්‍යාත්මක සිදු වූ ආකාරය ඒ ඒ දශකයට අනුව සලකා බලන විට දිස්වන්නේ පහත සඳහන් ආකාරයෙනි.

| දශකය | සංඛ්‍යාව |
|---|---|
| 1947---1956 | - |
| 1957---1966 | 07 |
| 1967---1976 | 13 |
| 1977---1986 | 14 |

| | |
|---|---|
| 1987---1996 | 34 |
| 1997---2006 | 85 |
| 2007---2016 | 166 |
| වර්ෂය නොමැති | 03 |
| | 322 |

1- වගුව ප්‍රකාශිත ග්‍රන්ථ සංඛ්‍යාව දශක අනුව

මෙයින් පැහැදිලි වන්නේ 1947--1986 දක්වා ම පළ වී ඇත්තේ ග්‍රන්ථ 34ක් බවයි. එය සමස්තයෙන් 10% කි. 1987 සිට සිනමා ග්‍රන්ථ ප්‍රකාශනයේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කෙරේ. මේ අනුව ග්‍රන්ථ 288ක් ම, එනම්, 90%ක් ම පළ වී ඇත්තේ 1987---2016 දක්වා වසර 20 තුළය. සිනමාව විශ්වවිද්‍යාල විෂයක් ලෙස පිළිගැනීම, වෙනත් ආයතන සිනමා පාඨමාලා ආරම්භ කිරීම සහ විවිධ ස්වේච්ඡා කණ්ඩායම් සිනමාව පිළිබඳ කතිකාව සජීවීව පවත්වා ගෙන යාමට දායක වීම මීට හේතු විය හැකිය.

මෙම කාල සීමාව තුළ කතුවරුන් 201ක් දෙනෙකු සමස්ත ග්‍රන්ථ සංඛ්‍යාව වන 322ක පාඨක ජනතාව අතට පත් කිරීමට දායක වී සිටිති. මේ අතරින් 13ක් විදේශීය ලේඛකයෝ වෙති. මෙම කෘති 322න් 38ක කතුවරුන් සඳහන් නොවන අතර ඒවායෙන් 20ක් සංස්කාරකවරයකු සහිත ග්‍රන්ථ වේ. මෙම කාලය තුළ ග්‍රන්ථ තුනකට වඩා රචනා කර ඇති ලේඛකයන් 2 වගුවේ දැක්වේ.

| ලේඛකයා | සංඛ්‍යාව |
|---|---|
| ගුණසිරි සිල්වා | 14 |
| තුසිත ජයසුන්දර | 12 |
| අමරනාත් ජයතිලක | 08 |
| සුනිල් ලීනස් ප්‍රනාන්දු | 08 |
| තිස්ස අබේසේකර | 07 |
| අජිත් ගලප්පත්ති | 07 |
| ගාමිණී වේරගම | 07 |
| අසෝක හඳගම | 06 |
| සුනිල් මිහිඳුකුල | 06 |
| නුවන් නයනජිත් කුමාර | 06 |
| ජීවන්ත දයානන්ද | 05 |

2 වගුව: කතුවරුන් අනුව විශ්ලේෂණය

සිනමා ග්‍රන්ථ 10කට වඩා රචනා කර ඇති ලේඛකයන් සිටිනුයේ දෙදෙනෙක් පමණි. ඒ ගුණසිරි සිල්වා සහ තුසිත ජයසුන්දරය. මෙයින් ගුණසිරි සිල්වා 1976 සිට මේ දක්වා අඛණ්ඩව ග්‍රන්ථකරණයේ යෙදෙයි. එමෙන් ම ග්‍රන්ථ 08 බැගින් ලියූ ලේඛකයන් දෙදෙනෙක් ද ග්‍රන්ථ 07 බැගින් ලියූ ලේඛකයන් 04 දෙනෙක් ද ග්‍රන්ථ 06 බැගින් ලියූ ලේඛකයන් 03 දෙනෙක් ද ග්‍රන්ථ 05ක් ලියූ එක් ලේඛකයෙක් ද ග්‍රන්ථ 04 බැගින් ලියූ ලේඛකයන් 04 දෙනෙක් ද ග්‍රන්ථ 03 බැගින් ලියූ ලේඛකයන් 08 දෙනෙක් ද ග්‍රන්ථ 02 බැගින් ලියූ ලේඛකයන් 25 දෙනෙක් ද සිංහල භාෂාමය සිනමා සාහිත්‍යය පෝෂණය කිරීම සඳහා දායකව සිටිති. මෙම කාල සීමාව තුළ ලේඛකයන් 87 දෙනෙක් ම රචනා කර ඇත්තේ සිනමාව පිළිබඳ එක් කෘතියක් පමණි. සිනමා කෘති බහුතරයක් රචනා කර ඇති ලේඛකයන් බොහොමයකගේ කෘතිවල (ගුණසිරි සිල්වා, තුසිත ජයසුන්දර, අමරනාත් ජයතිලක, සුනිල් මිහිඳුකුල, නුවන් නයනජිත් කුමාර) තොරතුරුමය හා විස්තරාත්මක බව අබිබවා යන විශ්ලේෂණාත්මක සහ විග්‍රහාත්මක ගුණය දැකිය හැක්කේ කලාතුරකිනි.

සංස්කාරකවරුන් යටතේ පළ වූ කෘති සංඛ්‍යාව 24කි. මෙයින් සුනිල් මිහිඳුකුල සහ රංජනී රත්නවිභූෂණ කෘති 04 බැගින් සංස්කරණය කර ඇත. විදේශීය කෘති 30ක් සිංහලයට පරිවර්තනය වී ඇති අතර මීට දායක වී තිබෙන පරිවර්තකයන් සංඛ්‍යාව 16කි. මෙයින් කෘති 07ක් ආරිය රාජකරුණා විසින් ද සේනාරත්න වීරසිංහ, එම්. ඩී. මහින්දපාල සහ බර්ටි ජයසේකර විසින් කෘති තුන බැගින් ද පරිවර්තනය කර තිබේ.

සිනමා ග්‍රන්ථ පළ කිරීමේ දී ප්‍රකාශකයාගේ දායකත්වය විග්‍රහ කිරීම ද වැදගත් වේ. සිනමා සාහිත්‍යයට දායක වූ ප්‍රමුඛතම ප්‍රකාශකයන් 3 වගුවේ දැක්වේ.

| ප්‍රකාශක | සංඛ්‍යාව |
|---|---|
| ගොඩගේ | 49 |
| සරසවි | 40 |
| කර්තෘ | 29 |
| ෆාස්ට් | 28 |
| සංහිඳ | 13 |

3 වගුව: ප්‍රකාශන දායකත්වය

මෙයට අමතරව, කතෝලික සිනමා පර්ෂදය සහ ජාතික චිත්‍රපට සංස්ථාව කෘති 08ක් ද, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් කෘති 05ක් ද නැනිල ප්‍රකාශන, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය සහ ආසියානු සිනමා කේන්ද්‍රය කෘති 04 බැගින් ද පළ කර තිබේ. මෙහි දී දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ සිනමා සාහිත්‍යයක් බිහි කිරීම සඳහා රාජ්‍ය අංශයේ අවම මැදිහත් වීමය. ජාතික චිත්‍රපට සංස්ථාව, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ රජයේ

තොරතුරු කාර්යාංශය යන ආයතන තුනෙන් වසර 70ක් පුරා පළ කර ඇත්තේ කෘති 11ක් පමණි.

සිනමා සාහිත්‍යයක පවත්නා තවත් ලක්ෂණයක් වන්නේ එය විවිධ ශාඛා සහ අනුවිෂයන් ඔස්සේ වර්ධනය වීමය. සිනමාව සමඟ බැඳුණු අංග රාශියක් තිබේ. අවධානයට ලක් වූ කාල සීමාව තුළ පළ වූ සිනමා ප්‍රකාශනයන්ගේ ප්‍රමුඛතම අනුවිෂයන් 4 වගුවේ දැක්වේ.

| අනුවිෂය | සංඛ්‍යාව |
|---|---|
| චිත්‍රපට විචාර | 78 |
| තිර රචනා | 68 |
| සිනමාකරුවන් හා ශිල්පීන් | 47 |
| ඉතිහාසය | 17 |
| උත්සව | 10 |

4 වගුව: විෂය ප්‍රමුඛතාව

මේ අනුව පෙනී යන්නේ සමස්ත කෘති සංඛ්‍යාව වන කෘති 322න් කෘති 210ක් ම අයත් වන්නේ ප්‍රවර්ග පහකට බවය. එයින් ද බහුතරයක් තිරරචනා සහ විචාර අතර බෙදී යයි. මෙම කාල සීමාව තුළ පර්යේෂණාත්මක කෘති පළ වී ඇත්තේ පහක් පමණි. පරිවර්තන කෘතිවලින් ද වැඩි කොටස් තිරරචනා සහ සිනමාකරුවන් පිළිබඳ වේ.

## සමාලෝචනය

පසුගිය දශක හත පුරා පළ වූ සිංහල භාෂාමය ග්‍රන්ථ දෙස බැලීමේ දී විද්‍යමාන වන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ඒවායේ කර්තෘත්වයේ පවත්නා විවිධත්වයයි. එහෙත් මේ අතරින් සිනමා ලේඛකයන් යන අනන්‍යතාව සහිත කතුවරුන් සිටිනුයේ අල්ප සංඛ්‍යාවකි. වැඩිම කෘති සංඛ්‍යාවක් රචනා කර ඇති ගුණසිරි සිල්වාගේ ග්‍රන්ථ අතර බහුතරයක් චිත්‍රපට විචාර වේ. ඒවා ද පුවත්පත්වලට රචනා කරන ලද විචාර ලිපි සංග්‍රහන්ය. පුවත්පතක සපයන ඉඩකඩ අනුව ප්‍රශස්ත මට්ටමේ විචාරයක් ලිවීම අතිශයින් අපහසු කාර්යයකි. එහෙයින් පුවත්පතක පළ වන ලිපි එලෙස ම පොතක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් පාඨක සමාජයට එක් කරන අතිරේක දැනුමක් නොමැත. සිනමා විචාර ලෙස පළ වී ඇති කෘති අති බහුතරයක මෙම ලක්ෂණය පොදුවේ දැකිය හැකිය. පුවත්පතකින් සහ පොතකින් ආමන්ත්‍රණය කරනුයේ පාඨක කණ්ඩායම් දෙකක් පිළිබඳ ලේඛකයන් තුළ පවත්නා ව්‍යාකූල අවබෝධය

මෙයින් දිස් වේ. එමෙන් ම මෙය පුවත්පත් පාඨක පිරිස එලෙස ම නඩත්තු කිරීමට ගන්නා උත්සාහයක් මිස එකී පාඨකයන්ගේ සිනමාත්මක කියවීම ඉහළ තලයකට රැගෙන යාමට දරන ප්‍රයත්නයක් නොවේ.

සිනමා ග්‍රන්ථ පරිශීලනය කරන පාඨක කණ්ඩායම් රැසක් සිටිති. පොදු රසිකයා එක් කණ්ඩායමකි. මොවුන් බොහෝ විට සිනමාව විනෝද මාධ්‍යයක් ලෙස භාවිත කරන්නවුන් වේ. විශේෂයෙන්, මොවුන්ගේ අභිලාෂය වන්නේ කිසියම් සිනමාපටයක් පිළිබඳ සරලමතික වැටහීමක් සහ එම සිනමාපටයේ කතා රසය පැහැදිලි කර ගැනීම සඳහා වූ රචනාවන් කියවීමය. මොවුන්ට බොහෝ විට තිබෙනුයේ කුතුහලය සංසිඳවන තොරතුරුමය අවශ්‍යතාවකි. පුවත්පත් ලිපි සහ අතිරේක ඉටු කරනුයේ මෙම කාර්යභාරයයි. තව ද, මෙම පොදු රසිකයාගේ තත්ත්වය ඉක්මවා ගිය දියුණු රසිකයෙක් ද මෙම සමාජයේ සිටී. ඔහු/ඇය අපේක්ෂා කරනුයේ සිනමාව පිළිබඳ මෙම කුතුහලාත්මක අරමුණු අබිබවා ගිය විශ්ලේෂණාත්මක කියවීමක් සඳහා වන උත්සාහයකි. මෙම රසිකයාට සිනමාපටයක කතා රසය විනිවිදීම අවශ්‍යය. ඒ හරහා සිනමාකරුවා පවා අපේක්ෂා නොකළ අරුතක් එයින් මතු කර ගැනීමට අවශ්‍යය. මෙම රසිකයා සිනමාව පමණක් නොව ඊට අනුබද්ධිත වෙනත් විෂය කලාපයන් පිළිබඳ යම් අවබෝධයක් ඇත්තෙකි. මොහු හුදෙක් පුවත්පත් ලිපිවලින් තෘප්තිමත් නොවෙයි. මොවුන් බොහෝ විට යොමු වනුයේ ශාස්ත්‍රීය සඟරා වෙත හෝ පොත් වෙතය. එහෙත් පසුගිය වසර 70 කාලය තුළ සිංහල භාෂාමය සිනමා ග්‍රන්ථ දෙස බලන විට පෙනී යන්නේ මෙම පාඨක කණ්ඩායමේ අවශ්‍යතා ඉටු කරන ප්‍රකාශන අවම මට්ටමක පවතින බවය.

රට තුළ ක්‍රියාත්මක වන විවිධ සිනමා ආයතනවල පාඨමාලා හදාරන සිසුන් සිනමා සාහිත්‍යයේ තවත් පාඨක කණ්ඩායමකි. මොවුන්ට අවශ්‍ය වන්නේ විධිමත් ලෙස සිනමා විෂය හැදෑරීම ඉලක්ක කර ලියවුණු ග්‍රන්ථ ය. මෙහිදී පෙළ පොත් ආකෘතියෙන් රචනා කරන ග්‍රන්ථවලට විශේෂ වැදගත්කමක් හිමි වේ. මෙම පාඨක කණ්ඩායම දිනෙන් දින සංඛ්‍යාත්මකව වර්ධනය වන හෙයින් මෙම වැදගත්කම තවදුරටත් තීව්‍ර වේ. කෙසේ වෙතත්, පසුගිය දශක හත තුළ මෙවන් ආකෘතියේ ග්‍රන්ථ කිසිවක් සිංහල භාෂාවෙන් පළ වී නොමැත. රිචඩ් බාසම් (Richart Barsam) සහ දේව් මොනහන් (Dave Monahan) රචනා කළ නිව්යෝර්ක්හි නෝට්ස් සමාගම ප්‍රකාශයට පත් කළ Looking at movies: An Introduction to Film මෙවන් කෘතියකට අගනා නිදසුනකි. මෙයින් විද්‍යමාන වන්නේ මෙරට තුළ තවමත් සිනමාව අධ්‍යාපනික විෂයක් ලෙස පුළුල්ව වර්ධනය වී නොමැති බවයි.

අනෙක් පාඨක කණ්ඩායම වන්නේ සිනමාව පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයන්හි යෙදෙන පිරිසයි. සිනමාව පිළිබඳ දැනුම උත්පාදනය කරනුයේ මොවුන් විසිනි. ඕනෑම විෂය ක්ෂේත්‍රයක් ඉදිරියට ගමන් කිරීමට නම් එම ක්ෂේත්‍රයේ පර්යේෂණාත්මක ප්‍රකාශන වැඩි වැඩියෙන් බිහිවීම අවශ්‍යය. එහෙත් පසුගිය දශක හතකට ආසන්න කාල සීමාව විමසුමට ලක් කරන විට

පෙනී යන්නේ සිංහල භාෂාමය සිනමා ග්‍රන්ථකරණය තුළ එවන් උත්සාහයන් ඉතාමත් අඩුවෙන් දැකිය හැකි බවය. හිනිඳුම සුනිල් සෙනෙවි, මහේෂ් හපුගොඩ, පුෂ්පජිත් තිරෝෂණ ජයසිංහ යනාදීන් දරන ලද ප්‍රයත්න කීපයක් පමණක් මීට අයත් වේ. විශේෂයෙන් වර්තමානයේ ලෝක මට්ටමින් ගත් විට සිනමාවේ ශාස්ත්‍රීය පාර්ශවය විවිධ දාර්ශනික සහ සෞන්දර්යාත්මක සංකල්ප ඔස්සේ පෝෂණය වන ආකාරය ඉංග්‍රීසි භාෂාවෙන් යුරෝපීය සහ ඇමරිකානු මහාද්වීපයන්හි ප්‍රකාශිත මෑතකාලීන ග්‍රන්ථ වෙත නෙත් යොමු කිරීමෙන් මනාව පැහැදිලි වේ. එහි දී ඔවුහු සිනමාපට සහ සිනමාකරුවන්ගේ භාවිතය විශ්ලේෂණය හා විචාරය කිරීමට මාක්ස්වාදය, මනෝවිශ්ලේෂණය, සංඥාර්ථවේදය, ව්‍යුහවාදය, ස්ත්‍රීවාදය, පශ්චාත් යටත්විජිතවාදය, විසංයෝජනය යනාදී දාර්ශනික චින්තාවන්ගේ න්‍යායික සංකල්ප යොදා ගනිති. එහෙත් මෙවන් ප්‍රවණතාවක් ගොඩ නැංවීම සඳහා වන බරපතළ මැදිහත් වීමක් සිනමාව පිළිබඳ සිංහල භාෂාවෙන් ග්‍රන්ථකරණයේ යෙදෙන ලේඛකයන් වෙතින් දර්ශනය නොවේ. මෙරට සිනමා විචාරය තවමත් පුවත්පත් ආකෘතියෙහි ගිලී සිටීමට මෙය ද හේතුවකි.

ක්ෂේත්‍රයේ නිර්මාණශීලී තාක්ෂණික සහ කළමනාකරණ කාර්යයන්හි නියැළී සිටින පිරිස් තවත් පාඨක කණ්ඩායමකි. ගෝලීය අර්ථයෙන් ගත් කළ ඉහත ක්ෂේත්‍ර ශීඝ්‍රයෙන් සංවර්ධනයට සහ වෙනස් වීම්වලට බඳුන් වේ. මොවුනට මෙකී වෙනස්කම් සහ සංවර්ධනයන් හැකි ඉක්මනින් ග්‍රහණය කර ගැනීමට උචිත සාහිත්‍යයක් පැවතීම ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ දී අත්‍යවශ්‍ය සාධකයක් වේ. අධ්‍යක්ෂණය, නිෂ්පාදනය, සංස්කරණය, කැමරාකරණය, සංගීතය, තිරරචනය, ආලෝකකරණය යනාදි අංග මෙහි දී ප්‍රමුඛත්වයක් ගනී. එම්. ඩී. මහින්දපාල, චන්දන සිල්වා සහ බර්ට්‍රම් නිහාල් යනාදීන්ගේ දායකත්වය මෙහි දී කැපී පෙනේ. එහෙත් එහි දී වැඩි අවධානය යොමු කර ඇත්තේ කැමරාකරණය විෂය වෙත පමණි. තිරරචනා විශාල වශයෙන් පළ වී තිබුණ ද තිරරචනා ශිල්පය පිළිබඳ විධිමත් යාවත්කාලීන කෘතියක් පළ වී නොමැත. අධ්‍යක්ෂණය, නිෂ්පාදනය, සංගීතය, බෙදා හැරීම යනාදිය පිළිබඳ ග්‍රන්ථ පළ වී නොමැති තරම්ය. සැබවින් ම සිනමාව කලාවක් මෙන් ම කර්මාන්තයක් ලෙස සංවර්ධිත මට්ටමකට ගෙන ඒමට මෙවන් ක්ෂේත්‍ර පිළිබඳ විධිමත්ව රචිත ග්‍රන්ථ ප්‍රකාශයට පත් වීමේ අවශ්‍යතාවක් පවතී. මෙම ක්ෂේත්‍ර පිළිබඳ වෘත්තීකභාවයෙන් යුත් ලේඛකයන්ගේ අඩුව මීට හේතු වී ඇත. මේ සඳහා ප්‍රබල සහ අඛණ්ඩ දායකත්වයක් සපයනුයේ මෙරට සිටින විශිෂ්ටතම සිනමා කැමරා අධ්‍යක්ෂවරයකු වන එම්. ඩී. මහින්දපාල පමණි.

සිනමාව පිළිබඳ පරිවර්තිත ග්‍රන්ථ ද වැඩි වශයෙන් අයත් වන්නේ තිරරචනා සහ සිනමාකරුවන් යන ප්‍රවර්වලටය. සිනමාව පිළිබඳ පර්යේෂණාත්මක කෘති සහ සිනමා න්‍යාය පිළිබඳ මෑතකාලීන කෘති පවා සිංහල පාඨකයා වෙතට පැමිණ නොමැති තරම්ය. සිනමාවේ දාර්ශනික සහ න්‍යායික පාර්ශ්වය අළලා ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් මෑතකාලීනව පළ වී ඇති බව Google

Books ගවේෂණය කිරීමෙන් අනාවරණය කර ගත හැකිය. දියුණු පරිවර්තන සාහිත්‍යයක් සිනමාව විෂය සම්බන්ධයෙන් පැවතීම ද මෙරට සිනමාකරුවන් පමණක් නොව ප්‍රේක්ෂකත්වය ඇතුළු සමස්ත සිනමා සංස්කෘතිය පෝෂණය සඳහා වැදගත් සාධකයක් බව නොකිවමනාය. කෙසේ වෙතත්, අධ්‍යයනයට ලක් වූ කාල සීමාව තුළ එවන් උත්සාහයක් දක්නට නොතිබිණි. මෙය ලේඛකයන්ගේ පමණක් නොව ප්‍රකාශකයන්ගේ ද වගකීමකි. සිනමා ප්‍රකාශන සම්බන්ධයෙන් මෙරට වෙළඳපොළ තුළ විශාල ඉල්ලුමක් නොමැති වීම මීට හේතු විය හැකිය. මෙම අඩුව යම් පමණකට සමනය කළ හැක්කේ සිනමාව සහ සංස්කෘතිය සම්බන්ධ රාජ්‍ය ආයතන මේ සඳහා සක්‍රීය මැදිහත්වීමක් කරන්නේ නම් පමණි. ෆාස්ට් පබ්ලිෂිං ආයතනය මෑත වසර කීපය තුළ සිනමා ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ අනන්‍යතාවක් අත්කර ගැනීමේ උත්සාහයක යෙදී සිටින බව පෙනේ. කර්තෘ ප්‍රකාශන ශීඝ්‍රයෙන් ඉහළ යාම මගින් ද ආයතනගත ප්‍රකාශකයන් සිනමා කෘති පළ කිරීමට දක්වන මැළිකම ඉඟි කෙරේ. මෙම ගැටලුව සඳහා විකල්ප විසඳුමක් ලෙස ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය යොදා ගැනීම ගැන සලකා බැලීමට ප්‍රකාශකයන්ට පුළුවන. ඒ අනුව කෘතියක පිටපත් සංඛ්‍යාව ඉල්ලුමට අනුව මුද්‍රණය කිරීමට (Print on Demand) හැකියාව ලැබේ. මෙහි දී මිල ගණන් වෙත ද අවධානය යොමු කළ යුතු වේ.

අධ්‍යයනයට ලක් වූ කාල සීමාව තුළ පළ වී ඇති සිංහල භාෂාමය සිනමා ග්‍රන්ථ විශ්ලේෂණය කිරීමේ දී දැකිය හැකි තවත් මුඛ්‍ය ලක්ෂණයක් වන්නේ විෂය විවිධත්වයේ අඩුවයි. පළ වී ඇති සමස්ත කෘති සංඛ්‍යාවෙන් (322) 60% (193) ක් ම අනුවිෂය ක්ෂේත්‍ර තුනකට, එනම්, තිරරචනා 68 විචාර 78 සහ සිනමාකරුවන් 47අයත් වීම මීට සාක්ෂි දරයි. මෙය සිනමා ලේඛකයන්ගේ මෙන් ම ප්‍රකාශකයන්ගේ ද අවධානයට ලක් විය යුතු කරුණකි.

සිනමාව කලාවක් මෙන් ම කර්මාන්තයක් ලෙස වෘත්තිකභාවයෙන් හා ශාස්ත්‍රීය ගුණයෙන් සංවර්ධනය වීමට නම් දියුණු හා යාවත්කාලීන සිනමා සාහිත්‍යයක් පැවතීම අත්‍යවශ්‍ය සාධකයක් වේ. කෙසේ වෙතත්, දශක හතක මෙරට සිංහල භාෂාමය සිනමා සාහිත්‍යය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලිව පෙනී යන්නේ එවන් සාහිත්‍යයක් තවමත් ගොඩ නැංවී නොමැති බවය. විවිධ පුද්ගලයන් සහ ආයතන විසින් වරින්වර ගන්නා ලද හුදෙකලා ප්‍රයත්නයන් පැවතිය ද සිනමාකරුවන්, ලේඛකයන්, පර්යේෂකයන්, ශාස්ත්‍රඥයන්, ප්‍රකාශකයන් එක්ව ගන්නා සමෝධානික ප්‍රයත්නයක් දැකීම උගහටය. එය සිනමාව කලාවක් මෙන් ම කර්මාන්තයක් ලෙස ද ශාස්ත්‍රීය විෂයක් ලෙස ද වර්ධනීය තලයකට ගෙන ඒමට ප්‍රධාන බාධකයකි. එහෙයින් මෙරට සිනමා සංස්කෘතිය සහ චින්තනය දියුණු කිරීමට, ගෝලීය ප්‍රවණතා පිළිබඳ දැනුවත් සාමූහික ප්‍රයත්නයක යෙදීමේ අවශ්‍යතාව ඉහත කී පාර්ශ්ව සියල්ලට ම ප්‍රබලව පවතී.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ජයසුන්දර, තුසිත. (2014). ලෙනින්, නීල් සහ යසපාලිතඃ ඔවුන් සහ ඔවුන්ගේ සිනමාව පිළිබඳ විමසුමක්. සරසවි ප්‍රකාශකයෝ

වේරගම, ගාමිණී. (1988). චිත්‍රපට සංස්කෘතියක් උදෙසා හරවත් සිනමා සාහිත්‍යයක අවශ්‍යතාව. සිනෙසිත් පි. 2, 27-32 පි.

වේරගම, ගාමිණී. (1993). මෑතකාලීන සිනමා සාහිත්‍යය පිළිබඳ නිරීක්ෂණයක්. සිනෙසිත් අංක 25, 41-47 පි.

Baasam, Richard & Monaham, Dave. (2010). Looking at Movies: An Introduction to Film. New York. w.w. Norton

Brazin, Andre. (1967). What is Cinema. Los Angelis. University of California Press.

Eisenstin, Sergi. (1959). Notes of the Film Director. London. Lawrance and Wishaart.

www. Sriptmag. Com. Accessend on 01. 05. 2019

# Information Needs & Survey Behaviour

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල කළමනාකරණ පීඨ සිසුන්ගේ වාර සඟරා භාවිතය : කැලණිය විශ්වවිද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඇසුරින්

# Use of Journalis by Management Faculty Students in Sri Lanka Universities : A Study Based on University of Kelaniya and Sri Jayewardenepura


**පී. ඒ. අයි. පීරිස්**

සහකාර පුස්තකාලයාධිපති,

බදුල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

**anupamapeiris92@gmail.com**



## Abstract

Journal is a primary source includes new information in the world. It is a periodical publication, especially dealing with matters of current interest; often used of official or semi-official publications of special groups. "Particularly a periodical issued by a society or institution and containing news, proceeding, transaction and report of work carried our in a particular field." (The Librarian's Glossary)

The main objectives of the study are identify the usage of journals by management students. The study based on survey method. Questionnaires were used for data collection. Microsoft Excel was used to analyses the collected data. Under the survey research method, two unicersities of Kelaniya, Sri Jayewardenepura were used as the sample and used 100 management students in both of unicersities.

As the result of the study most of the students like to use E-journals than printed journals. The main reason of readers prefer to E-journals are casier to use E-journals than printed journals, ability to get latest information quickly. difficulties of readers facing are lack of awareness of management E-journals in the library. The study suggests that raising awareness of readers about the E-Journals are easier to use E-journals than printed journals, ability to get latest information quickly. Difficulties of readers facing are lack of awareness of management E-journals in the library. The study suggests that raising awareness of readers about the E-journals by presenting newly bought E-journal's information by using notice board, library website and printing handbooks leflet.

**Keywords :** Journals, University Libraries, Use of Journals, E-Journals, Information Services

## සාරාංශය

ශාස්ත්‍රීය පර්යේෂණ හා ගවේෂණවල ප්‍රතිඵලයක් ලෙස බිහිවන නවතම දැනුම සෙසු පාඨකයන් වෙත පළමුවෙන්ම ගෙන එන ප්‍රාථමික තොරතුරු මාධ්‍යය නැතහොත් මූලාශ්‍රය වන්නේ වාර සඟරාවයි. ඒ අනුව විඥාපන මාධ්‍යයක් ලෙසත් පර්යේෂණ අනාවරණය කරනු ලබන ප්‍රලේඛන මාධ්‍යයක් ලෙසත් විශ්වවිද්‍යාල පුස්තකාලවල අත්‍යන්තයෙන්ම අවශ්‍ය තොරතුරු මූලාශ්‍රයකි. අධ්‍යයනයේදී විශ්වවිද්‍යාලවල කළමනාකරණ සිසුන්ගේ වාර සඟරා භාවිතය අධ්‍යයනය කිරීම මුඛ්‍යය අරමුණ වේ. කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර යන විශ්වවිද්‍යාල පමණක් මේ සඳහා තෝරා ගන්නා ලදි. මෙහිදී නියැදිය වශයෙන් විශ්වවිද්‍යාලයකින් කළමනාකරණ පීඨ සිසුන් 50 ක්ද වශයෙන් විශ්වවිද්‍යාල ද්විත්වය සඳහා සිසුන් ගණන 100 දෙනෙකු තෝරා ගන්නා ලදි. වේ. පර්යේෂණයේදි දත්ත රැස් කිරීම සඳහා සමීක්ෂණ අධ්‍යයන ක්‍රමවේදය යටතේ ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලි භාවිත කරන ලද අතර ඊට අමතරව දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ද භාවිත කෙරිණි. දත්ත විශ්ලේෂණයෙන් පසු ගම්‍යය වූයේ විශ්වවිද්‍යාල සිසුන් තම අධ්‍යයන කටයුතු සඳහා වාර සඟරා භාවිත කරන බවත්, සිසුන් වැඩි පිරිසක් ඉලෙක්ට්‍රොනික සඟරාවලට වැඩි නැඹුරුතාවක් දක්වන බවයි. මෙහිදී දැක ගත හැකි ප්‍රධාන ගැටලුවක් වන්නේ පුස්තකාලයේ පවතින වාරසඟරා පිළිබඳ පාඨකයන් සතුව ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීමය. වාර සඟරා පිළිබඳ පාඨකයන් දැනුවත් කරීම. විශේෂයෙන්ම පාඨකයන්ට විධිමත් පාඨක අධ්‍යාපනයක් ලබා දීම එනම් පුස්තකාල සේවා හඳුන්වාදීමේ වැඩ සටහන් පුස්තකාලය තුළදී ක්‍රියාත්මක කළ යුතු අතර පුස්තකාලයේ විවිධ අංශ සහ සේවා පිළිබඳ දැනුවත් කිරීමක් කළ යුතුය. සෑම විෂයකටම අදාළ සඟරා ප්‍රතිග්‍රහණය කළ හැකි අතර නව සඟරා පාඨක ප්‍රදර්ශනයට තැබීම, පාඨකයන්ට පහසුවෙන් වාර සඟරා තොරතුරු ගවේශණය පහසු කිරීම සඳහා ගවේශණ උපක්‍රම සැකසීම හා සේවා පාඨක පහසුව මූලික කරගෙන සැකසිය යුතුය.

**මූලික පද :** වාර සඟරා, විශ්වවිද්‍යාල පුස්තකාල, වාර සඟරා භාවිතය, ඉලෙක්ට්‍රොනික සඟරා, තොරතුරු සේවා

## හැඳින්වීම

පුස්තකාලයක් විමර්ෂණ අංශය, බැහැර දීමේ අංශය, දුර්ලභ අංශය, බහුමාධ්‍ය අංශය වැනි පාඨක සේවා සපයනු ලබන අංශ අතරින් වාර සඟරා අංශය සුවිශේෂ වේ. විඥාපන මාධ්‍යයක් ලෙසත් පර්යේෂණ සඳහා අත්‍යවශ්‍යය වැදගත් තොරතුරු මාධ්‍යයක් බැවින් විද්‍යාඥයන් විසින් සිය ප්‍රකාශනවල කියවීම් ලැයිස්තු ලෙස සඳහන් කර ඇති තොරතුරු මූලාශ්‍ර අතුරින්

95ක්ම වාර සඟරා හා ශාස්ත්‍රීය සමිතිවල ප්‍රකාශන වේ. (ජයතිස්ස, 2005) පුස්තකාලයට අත්පත් කරගන්නා දේවල් අතුරින් වාර සඟරා සුවිශේෂ වේ. පොතකට වඩා ඉතාම ඉක්මනින් නව තොරතුරු ලබාගත හැකි පහසුම මාර්ග යක් වීමත්, ඉක්මනින්ම සඟරා ලිපියක් කියවා අදහස් ලබාගත හැකි වීමත්, වාර සඟරාවන්හි ලිපි සාධිකාරී බවින් යුතු වීමත්, විශිෂ්ට තොරතුරු ලබාගත හැකි වීමත් යන කරුණු නිසා වාර සඟරා ප්‍රලේඛන මාධ්‍යයක් ලෙස වැදගත් වේ. (ප්‍රනාන්දු, 2000) පුස්තකාල වාර සඟරා අයත් කර ගැනීම වාර්ෂික දායකත්වය මත සිදු වේ. පාඨකයාට අවශ්‍යයවන වාර සඟරා පිළිබඳව අවබෝධයක් පුස්තකාලයාධිපති සතුව පැවතිය යුතුය. එමගින් වාර සඟරා එකතුව සක්‍රීය එකතුවක් බවට පත්කළ හැක. මෙහිදී කළමනාකරණ සිසුන් වාර සඟරා භාවිත කරන්නේ කුමන අවශ්‍යයතා සඳහා ද, ඔවුන්ට අත්‍යවශ්‍යය වාරසඟරා මොනවාද, පාඨකයන් වැඩි නැඹුරුතාවක් දක්වන්නේ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික සඟරාවලින් කුමකට ද යන්න පිළිබඳව පුස්තකාලයාධිපති සතුව අවබෝධයක් පැවතිය යුතුය.

## අධ්‍යයන අරමුණු

විශ්වවිද්‍යාලවල කළමනාකරණ සිසුන්ගේ වාර සඟරා භාවිතය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. අධ්‍යයනයේ අනෙකුත් අරමුණු පහත පරිදි වේ.

- කළමනාකරණ පීඨයේ පාඨකයන් වාර සඟරා භාවිත කිරීමේ අරමුණු හා අවශ්‍යතා හඳුනාගැනීම.
- කළමනාකරණ පීඨයේ පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා වාර සඟරා මගින් ඉටුවන්නේද යන්න අධ්‍යයනය කිරීම.
- ඉලෙක්ට්‍රොනික හා මුද්‍රිත සඟරාවලින් පාඨකයන් වැඩි කැමැත්තක් දක්වන්නේ කවරක් සඳහාද යන්න හඳුනා ගැනීම.
- වාර සඟරා භාවිතයේදී කළමනාකරණ පාඨකයන් මුහුණ දෙන ගැටලු අධ්‍යයනය කිරීම

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ අධ්‍යයන ක්‍රමවේදය යොදා ගන්නා ලදි. කළමනාකරණ පීඨ සිසුන්ගේ වාරසඟරා භාවිතය අධ්‍යයනය කිරීමේදී කැලණිය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල කළමනාකරණ පීඨ ඇසුරින් දත්ත ලබාගත් අතර අහඹු ලෙස විශ්වවිද්‍යාලයකින් 50 බැගින් විශ්වවිද්‍යාල ද්විත්වයෙන් 100ක නියැදියක් අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. දත්ත රැස්කිරීමේදී ඒ සඳහා සකස් කරන ලද ප්‍රශ්නාවලියක් මගින් දත්ත

රැස් කෙරිණි.

## සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල කලා පීඨ හා කළමනාකරණ පීඨ සිසුන්ගේ වාර සඟරා. භාවිතය පිළිබඳ අධ්‍යයනයක් හසන්තිකා (2012) විසින් සිදුකර ඇත. විශ්වවිද්‍යාල සිසුන්ගේ මුද්‍රිත වාර සඟරා භාවිතය කෙසේ සිදුවේ ද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණය. විශ්වවිද්‍යාල සිසුන් වැඩි පිරිසකගේ මුද්‍රිත වාර සඟරා භාවිතය දුර්වල මට්ටමක පවතින අතර ඉලෙක්ට්‍රොනික සඟරාවලට වැඩි නැඹුරුතාවක් දක්වන බව දක්වා ඇත. පර්යේෂණ යෝජනා ලෙස වාර සඟරා පිළිබඳ පාඨකයන් දැනුවත් කිරීම හා පුළුල් ආවරණයක් සහිත වාර සඟරා පිළිබඳ දැනුවත් කිරීම, සෑම විෂයකටම අදාළ සඟරා ප්‍රතිග්‍රහනය කළ හැකි අතර නව සඟරා පාඨක ප්‍රදර්ශනයට තැබීම, විශේෂයෙන්ම පාඨකයන්ට විධිමත් පාඨක අධ්‍යාපනයක් ලබා දීම, එනම් පුස්තකාල සේවා හඳුන්වාදීමේ වැඩ සටහන් පුස්තකාලය තුළදී ක්‍රියාත්මක කළ යුතු අතර පුස්තකාලයේ විවිධ අංශ සහ සේවා පිළිබඳ දැනුවත් කිරීම දක්වා ඇත.

විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ක්වාමේ න්ක්රුමා විශ්වවිද්‍යාලයෙහි (Kwame Nkrumah University of Science and Technology - KNUST) අධ්‍යයන සාමාජිකයන්ගේ ඉලෙක්ට්‍රොනික සඟරා භාවිතය, ප්‍රවේශය හා දැනුවත්භාවය පිළිබඳ අධ්‍යයනයක් ෆැන්සිස් (2012) විසින් සිදුකොට ඇත. ඉලෙක්ට්‍රොනික සඟරා වෙත පාඨකයන් ප්‍රවේශ වන්නේ කෙසේද යන්න පිළිබඳ පර්යේෂකයා අනාවරණය කර ඇත. ඒ අනුව පොදු ගවේශණ උපකරණ වන යාහූ, ගූගල් මගින් මෙන්ම විශ්වවිද්‍යාල දත්ත පදනම මගින් ප්‍රවේශව බව පර්යේෂකයා පෙන්වා දේ. මාර්ගගතව සඟරා ලිපි කියවීම, අනාගත විමර්ශන සඳහා සුරැකීම (Save)" HTML/PDF ආකෘතියෙන් සඟරාවල මුද්‍රිත පිටපත් ගැනීම යන්න අතුරින් පාඨකයන් වැඩි කැමැත්තක් දක්වන ක්‍රමය පිළිබඳ කරන ලද අධ්‍යයනයේදී 67%ක් HTML/PDF ආකෘතියෙන් සඟරාවල මුද්‍රිත පිටපත් ගැනීම බොහෝ දෙනා කැමැත්තක් දක්වන ලද බව අනාවරණය කර ඇත. පාඨකයන් ප්‍රධාන වශයෙන් මුහුණදෙන ගැටලුවක් ලෙස අන්තර්ජාල වේගය දක්වා ඇත.

නයිජීරියාවේ බෙනින් විශ්වවිද්‍යාලයේ හා ඩෙල්ටා ස්ටේට් විශ්වවිද්‍යාලයේ වෛද්‍යය විද්‍යා සිසුන්ගේ වාර සඟරා භාවිතය හා දැනුවත් භාවය පිළිබඳ අධ්‍යයනයක් ගොල්ලෙයි විසින් සිදුකොට ඇත. වෛද්‍යය හා සායනික අධ්‍යයන සිසුන් අධ්‍යයනය සඳහා අඩංගු වේ. ආයතන දෙකේම වෛද්‍යය විද්‍යා සිසුන්ගේ ඉලෙක්ට්‍රොනික සඟරා පිළිබඳ දැනුවත්බව හා භාවිතය, පරිගණක සාක්ෂරතාව අඩු මට්ටමක පැවතීම පර්යේෂණ අනාවරණ වේ. ඉලෙක්ට්‍රොනික සඟරා භාවිතය වැඩි දියුණු කිරීමට සඳහා පරිගණක සාක්ෂරතා පාඨමාලා විෂය මාලාවේ අනිවාර්යය අංගයක් බවට පත් කිරීම,

අන්තර්ජාල පහසුකම් සැපයීම පර්යේෂණ යෝජනා වේ.

ජපන් පරමාණුක බලශක්ති කාර්යංශයේ ඉලෙක්ට්‍රොනික සඟරා භාවිතය පිළිබඳ ඉෂිකාවා සහ ෆුකසාවා (2008) විසින් සමීක්ෂණයක් සිදුකර ඇත. ජපන් පරමාණුක බලශක්ති කාර්යංශයේ පාඨකයන් ඒසෙවියර් මගින් ප්‍රකාශයට පත්කරනු ලබන සඟරා මාතෘකා 1,783ක් සඳහා ප්‍රවේශ වීම හා බාගත කිරීම සිදුවී ඇති බව දක්වයි. එසේවුවද 1,028ක් සඟරා නාම සඳහා පර්යේෂකයන් කැමැත්තක් දක්වන ලද බව දක්වයි. ඒ අතර භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, වෛද්‍යය විද්‍යාව, සමාජීය විද්‍යාව යනාදිය දක්වා ඇත. මුද්‍රිත ආකෘතියේ සිට ඉලෙක්ට්‍රොනික ආකෘතියට මාරුවීම හේතුවෙන් 30% කින් පාඨක සංඛ්‍යාව වර්ධනය වූ බවත් පර්යේෂණ පත්‍රිකා කියවන ප්‍රමාණය වර්ධනය වූ බවද පෙන්වා දේ. ඉලෙක්ට්‍රොනික සඟරාවල වැදගත් කාර්ය ලෙස ගවේශනය, වෙනත් ග්‍රන්ථ විද්‍යාත්මක වාර්ථා සඳහා සම්බන්ධයෙන් (link) ලබාදීම දක්වා ඇත.

අෂාක් සහ මහ්මුද් (2005) විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල පුස්තකාල හා විඥාපන විද්‍යා සඟරා භාවිතය මලයාසියාව හා පාකිස්තානය ඇසුරින් සංසන්දනාත්මකව අධ්‍යයනය කර ඇත. සංවර්ධනය වෙමින් පවතින රටක අධ්‍යාපන මෙවලමක් වශයෙන් පුස්තකාල හා විඥාපන විද්‍යා සඟරා බාගත කරන ප්‍රමාණය හා ස්වභාවය අධ්‍යයනය, පුස්තකාල හා විඥාපන විද්‍යා සඟරාවල කාර්යයභාරය පිළිබඳව පුස්තකාල හා විඥාපන විද්‍යා සිසුන්ගේ අවබෝධය අධ්‍යයනය කිරීම, පුස්තකාල හා විඥාපන විද්‍යා සඟරා භාවිතයේ දී මුහුණදෙන ගැටලු හා බාධක පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණු වේ. පර්යේෂකයා සිය නියැදිය සඳහා මලයාසියා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය හා පාකිස්තානයේ පන්ජාබ් විශ්වවිද්‍යාලය තෝරාගෙන ඇත. වාර සඟරා භාවිතයේදී මලයාසියාවේ 9% ක් මුද්‍රිත සඟරා භාවිතයට ද, 17ක් ඉලෙක්ට්‍රොනික සඟරා භාවිතයට ද, 74%ක් ඉලෙක්ට්‍රොනික හා මුද්‍රිත සඟරා භාවිතයට ද, පාකිස්තානයේ 42%ක් මුද්‍රිත සඟරා භාවිතයට ද, 2% ක් ඉලෙක්ට්‍රොනික සඟරා භාවිතයට ද, 56%ක් ඉලෙක්ට්‍රොනික හා මුද්‍රිත සඟරා භාවිතයට ද කැමැත්තක් දක්වනු ලබයි. වාර සඟරා භාවිත කිරීමේ අවශ්‍යතා පිළිබඳව පර්යේෂකයා කරන ලද අධ්‍යයනයෙන් පෙන්වා දෙන්නේ රටවල් ද්විත්වයේම පර්යේෂකයින් පවත්වාගෙන යන පර්යේෂණ සඳහා මහඟු දායකත්වයක් ලබාදෙන බවය. ඒ අනුව ප්‍රධාන වශයෙන් පර්යේෂණ සඳහා ද, පුස්තකාල හා විඥාපන විද්‍යාවට අදාළ නව ප්‍රවණතා පිළිබඳ තොරතුරු ලබා ගැනීමට වාර සඟරා භාවිත කරයි.

## දත්ත විශ්ලේෂණය


මෙම අධ්‍යයනයේදී කැලණිය විශ්වවිද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහා ප්‍රශ්නාවලී එක් විශ්වවිද්‍යාලයක් සඳහා 50 බැගින් 100ක් බෙදාහරින

ලදි. බෙදන ලද ප්‍රශ්නාවලී 100න් කැලණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සිසුන් 44ක් (48%) ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් 48ක් (52%)ද ප්‍රතිචාර දක්වා ඇත.

ලබාගන්නා ලද දත්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මක ආකාරයෙන් විශ්ලේෂණය කරන ලදි. ඒ අනුව වගු සටහන්, ප්‍රස්ථාර හා ප්‍රතිශතමය අගයන් යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදුකරන ලදි.

## ප්‍රතිචාරිතයන් විසින් හදාරනු ලබන අධ්‍යයන පාඨමාලා විෂය ක්ෂේත්‍ර

විශ්වවිද්‍යාල ද්විත්වයෙන් ම ගිණුම්කරණය හා මූල්‍ය විෂය හදාරණ සිසුන්ගෙන් 16%ක් ද, වාණිජ හා ගණකාධිකරණය අධ්‍යයන සිසුන් 15%ක් ද, මානව සම්පත් කළමනාකරණය හා මූල්‍යය කළමනාකරණය සිසුන් 12%ක් ද, ව්‍යාපාර ආර්ථික විද්‍යාව සිසුන් 13%ක් ද, අලෙවිකරණය සිසුන් 10ක් (11%) ද, ව්‍යාපාර පරිපාලනය සිසුන් 3%ක් ද, ව්‍යාපාර කළමනාකරණය සිසුන් 2%ක් ප්‍රතිචාර දක්වා ඇත.



ප්‍රස්තාරය 01 : ප්‍රතිචාර දැක්වූවන්ගේ අධ්‍යයන පාඨමාලා දත්ත


මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත

## වාරසඟරා භාවිත කිරීමේ අරමුණ

වාරසඟරා භාවිත කරන පාඨකයින් කිනම් අරමුණු සඳහා වාරසඟරා භාවිත කරනු ලබන්නේ ද යන්න අධ්‍යයනය කරන ලදි.

විශ්වවිද්‍යාල ද්විත්වයේම කළමණාකරන සිසුන්ගේ වාර සඟරා භාවිත කිරීමේ අරමුණු හඳුනාගැනීමේ දී සිසුන් අතරින් 50ක් (29%) වන බහුතර පාඨකයන් පැවරුම් අවශ්‍යතා සඳහා ද, 38ක් (22%) සටහන් සකසා ගැනීමට ද, 26ක් (15%) විෂය තොරතුරු දැනගැනීමට ද, 23ක් පාඨකයන් (13%) සාමාන්‍යය දැනුම වර්ධනයට ද, 21ක් (12%) පර්යේෂණ අවශ්‍යයතා සඳහා ද, 11ක් (6%) කියවීම් අවශ්‍යතා සඳහා ද, 3ක් (2%) විනෝදාස්වාදය සඳහා ද වාර සඟරා භාවිත කරනු ලබයි.

ප්‍රස්තාරය 02 ඃ වාරසඟරා භාවිත කිරීමේ අරමුණ




මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත

## භාෂා මාධ්‍යය අනුව වාර සඟරා භාවිතය

විශ්වවිද්‍යාලවල කළමනාකරණ පීඨ සිසුන්ගේ වාර සඟරා භාවිතය අධ්‍යයනය කිරීමේදී වාර සඟරා භාවිතයේදී පාඨකයන්ට අවශ්‍යය භාෂා මාධ්‍යය හා වාර සඟරා භාවිතයේදී අවශ්‍ය භාෂා මාධ්‍යයයෙන් වාර සඟරා පුස්තකාලයේ පවතීද යන්න පිළිබඳ පාඨක ප්‍රතිචාර අධ්‍යයනය කරන ලදි.

වගු අංක 1 : වාර සඟරා භාවිතයේදී සිසුන් වැඩි කැමැත්තක් දක්වන භාෂා මාධ්‍යය

| භාෂා මාධ්‍යය | එකතුව ප්‍රතිශතය | එකතුව |
|---|---|---|
| සිංහල | 28% | 30 |
| දෙමළ | 0% | 0 |
| ඉංග්‍රීසි | 72% | 79 |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත

කළමනාකරණ පීඨ සිසුන් වැඩි පිරිසක් එනම් සිසුන් 79ක් (72%) ඉංග්‍රීසි භාෂාවෙන් පවතින වාර සඟරාද, 30ක් (28%) සිංහල භාෂාවෙන් පවතින වාර සඟරාද භාවිත කරනු ලබයි.

වගු අංක 2 : වාර සඟරා භාවිතයේදී අවශ්‍යය භාෂා මාධ්‍යයෙන් වාර සඟරා පුස්තකාලයේ පවතීද යන්න පිළිබඳ පාඨක ප්‍රතිචාර

| ප්‍රතිචාරය | එකතුව | එකතුව ප්‍රතිශතය |
|---|---|---|
| පුස්තකාලය තුළ පවතී | 72 | 78% |
| පුස්තකාලය තුළ නොපවතී | 19 | 21% |
| ප්‍රතිචාර දක්වා නොමැත | 1 | 1% |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත

විශ්වවිද්‍යාල ද්විත්වයේම අවශ්‍යය භාෂා මාධ්‍යයෙන් වාර සඟරා පවතින බව සිසුන් 72ක් (78%) ප්‍රතිචාර දක්වා ඇත. අවශ්‍ය භාෂා මාධ්‍යයෙන් වාර සඟරා නොපවතින කළමනාකරණ සිසුන් 19ක් (21%) ප්‍රතිචාර දක්වා තිබේ.

වගු අංක 3 : වාරසඟරා හා වාරසඟරා ලිපි වෙත ප්‍රවේශ වීමේදී අනුගමනය කරනු ලබන ගවේෂණ උපක්‍රම

| ගවේෂණ උපක්‍රම | එකතුව | එකතුව ප්‍රතිශතය |
|---|---|---|
| රාක්ක මත අලවා ඇති නියමු ලේබල් | 51 | 49% |
| පටුන පිටු සේවාව | 19 | 18% |
| දෘශ්‍ය අනුක්‍රමණිකාව | 12 | 11% |
| සාර සංග්‍රහ සේවාව | 8 | 8% |
| අනුක්‍රමණිකා භාවිතය | 5 | 5% |
| බීජ පද මගින් ඉලෙක්ට්‍රොනික සඟරා සෙවීම | 10 | 10% |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත

අධ්‍යයනයට ලක් කරන ලද ප්‍රතිචාරිතයන්ගෙන් 51 (49%) දෙනෙකු රාක්ක මත අලවා ඇති නියමු ලේබල් රාක්ක මත අලවා ඇති නියමු ලේබල්, 19ක් (18%) පටුන පිටු සේවාව, 12ක් (11%) දෘශ්‍යය අනුක්‍රමණිකාව, 10ක් (10%) බීජ පද මගින් ඉලෙක්ට්‍රොනික සඟරා සෙවීම, 8ක් (8%) සාර සංග්‍රහ සේවාව, 5% ක් අනුක්‍රමණිකා මෙම ප්‍රතිචාරිතයන් විසින් භාවිත කරනු ලැබූහ.

## ඉලෙක්ට්‍රොනික හා මුද්‍රිත වාරසඟරා අතුරින් වඩා ප්‍රියතාවක් දක්වන ආකෘතිය

කළමනාකරණ පීඨ පාඨකයන් ඉලෙක්ට්‍රොනික හා මුද්‍රිත වාරසඟරා ආකෘතීන්ගෙන් වඩා ප්‍රියතාවක් දක්වන ආකෘතීන් විමසීමේදී බහුතරයක් වන 67% ක් ඉලෙක්ට්‍රොනික වාරසඟරා ද, 32% ක් මුද්‍රිත වාරසඟරා ද භාවිත කිරීමට ද කැමැත්තක් දක්වයි.


## ඉලෙක්ට්‍රොනික වාරසඟරා භාවිත කිරීමට හේතු

අධ්‍යයනයේදී ඉලෙක්ට්‍රොනික වාරසඟරා භාවිත කිරීමේ හේතු ලෙස වැඩි පිරිසක් එනම් සිසුන් 61% ක් නව තොරතුරු ඉක්මනින්ම ඉලෙක්ට්‍රොනික වාරසඟරා මගින් ලබාගත හැකි වීම, 21% ක් මුද්‍රිත වාරසඟරා භාවිත කරනවාට වඩා පහසුවෙන් භාවිත කළ හැකි වීම, 13% ක් තම විෂය ක්ෂේත්‍රයට අදාළ තොරතුරු බහුලවම පවතින්නේ ඉලෙක්ට්‍රොනික වාර සඟරාවල වීම ද අඩු පිරිසක් එනම් 5% ක් පුස්තකාලයේ බහුලව පවතින්නේ ඉලෙක්ට්‍රොනික වාරසඟරා වීම ලෙස ප්‍රතිචාර දක්වා ඇත.

## ඉලෙක්ට්‍රොනික වාරසඟරා භාවිත කිරීමේදී ලිපියේ අදාළත්වය හඳුනා ගැනීම

කළමනාකරණ සිසුන්ගේ ඉලෙක්ට්‍රොනික සඟරා භාවිතයේ දැනුවත්භාවය පරීක්ෂා කිරීමේ අරමුණින් ඉලෙක්ට්‍රොනික වාරසඟරා භාවිත කිරීමේදී ලිපියේ අදාළත්වය හඳුනා ගන්නා ආකාරය පරීක්ෂා කරන ලදි. 68ක් (74%) ලිපිය කියවීමට පෙර සාර සංග්‍රහය පළමුව කියවීමෙන් ඉලෙක්ට්‍රොනික සඟරා ලිපියේ අදාළත්වය හඳුනාගනී. 23ක් (25%) සම්පූර්ණ ලිපිය ම කියවීමෙන් ඉලෙක්ට්‍රොනික සඟරා ලිපියේ අදාළත්වය හඳුනාගනී.

ප්‍රස්තාරය 05 : ඉලෙක්ට්‍රොනික වාරසඟරා භාවිත කිරීමේදී ලිපියේ අදාළත්වය හඳුනාගැනීම




මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත

## වාරසඟරා භාවිතයේදී කළමනාකරණ සිසුන් මුහුණදෙන ගැටලු

වාර සඟරා භාවිතයේ දී කළමනාකරණ පීඨ පාඨකයන් මුහුණ දෙන ගැටලු පරීක්ෂා කිරීමේදී වැඩි පිරිසක් මුහුණ දෙන ගැටලුව ලෙස හඳුනාගත හැකි වන්නේ තම විෂයයට අදාළ වාර සඟරා පිළිබඳව දැනුවත්භාවයක් නොමැති වීමය. ඒ සඳහා 50ක් (25%) ප්‍රතිචාර දැක්වා ඇත. 39ක් (20%) අවශ්‍ය වාර සඟරා ලිපි සොයාගැනීමට වැඩි කාලයක් ගතවීම, 36ක් (18%) PDF ලෙස පවතින වාර සඟරා Download කිරීමට වැඩි කාලයක් ගත වීම, 30ක් (15%) වාර සඟරා භාවිත කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම, 24ක් (12%) වාරසඟරා / වාරසඟරා ලිපි සොයාගැනීමේ ශිල්පක්‍රම නොදැනීම, 10ක් (5%) භාෂා ගැටලු, 8ක් (4%) ඉලෙක්ට්‍රොනික වාරසඟරා භාවිතයේදී නොදන්නා මුර පද භාවිත කිරීමට සිදු වීම හා අඩුම පිරිසක් 3ක් (2%) විශ්වවිද්‍යාලයෙන් පිටතදී ඉලෙක්ට්‍රොනික සඟරා සඳහා ප්‍රවේශය ලබා නොදීම ලෙස ප්‍රතිචාර දක්වා ඇත.

| ප්‍රතිචාර | එකතුව | එකතුව ප්‍රතිශත |
|---|---|---|
| තම විෂයයට අදාළ වාර සඟරා පිළිබඳව දැනුවත්භාවයක් නොමැති වීම | 50 | 25% |
| අවශ්‍ය වාර සඟරා ලිපි සොයාගැනීමට වැඩි කාලයක් ගතවීම | 39 | 20% |
| PDF ලෙස පවතින වාර සඟරා Download කිරීමට වැඩි කාලයක් ගත වීම | 36 | 18% |
| වාර සඟරා භවිත කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම | 30 | 15% |
| වාරසඟරා / වාරසඟරා ලිපි සොයාගැනීමේ ශිල්පක්‍රම නොදැනීම | 24 | 12% |
| භාෂා ගැටලු | 10 | 5% |
| ඉලෙක්ට්‍රොනික වාරසඟරා භාවිතයේදී නොදන්නා මුර පද භාවිත කිරීමට සිදු වීම | 8 | 4% |
| විශ්වවිද්‍යාලයෙන් පිටතදී ඉලෙක්ට්‍රොනික සඟරා සඳහා ප්‍රවේශය ලබා නොදීම | 3 | 2% |
| බීජපද මගින් ඉලෙක්ට්‍රොනික සඟරා සෙවීම | 10 | 10% |

මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත

## පර්යේෂණ අනාවරණ

බහුතරයක් පාඨකයන් පැවරුම් අවශ්‍යතා ඉටුකර ගැනීමේ අරමුණින් වාර සඟරා භාවිත කරනු ලබන අතර වාර සඟරා වෙත ප්‍රවේශ වීමේදී රාක්ක මත අලවා ඇති නියමු ලේබල් බහුල වශයෙන් කළමනාකරණ පාඨකයන් භාවිත කරයි.

වාර සඟරා ආකෘති වන මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික ආකෘති අතුරින් නව තොරතුරු ඉක්මනින්ම ඉලෙක්ට්‍රොනික වාරසඟරා මගින් ලබාගත හැකි වීම හේතුවෙන් ඉලෙක්ට්‍රොනික වාර සඟරා භාවිත කිරීමට කළමනාකරණ සිසුන් කැමැත්තක් හා වැඩි නැඹුරුතාවක් දක්වයි. ඉලෙක්ට්‍රොනික සඟරා භාවිතයේදී සිසුන් සම්පූර්ණ වාර සඟරා ලිපිය කියවීමට පෙර සාර සංග්‍රහය කියවීම සිදු කරයි.

වාර සඟරා භාවිතයේ දී සිසුන් ප්‍රධාන වශයෙන් තම විෂයට අදාළ වාර සඟරා මොනවාද යන්න පිළිබඳව දැනුවත්භාවයක් නොමැති වීම ප්‍රධාන වශයෙන් කළමනාකරණ සිසුන් මුහුණදෙන, PDF ලෙස පවතින සඟරා බාගත කිරීමට වැඩි කාලයක් ගත වීම, අවශ්‍ය වාර සඟරා ලිපි සොයා ගැනීමට වැඩි කාලයක් ගත වීම හා වාර සඟරා භාවිත කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම පාඨක ගැටලු වේ.

## යෝජනා

- වාර සඟරා අංශයේ වාර සඟරා සංවිධානය කර ඇති ආකාරය හා වාර සඟරා ලිපි ගවේෂණය පිළිබඳව පාඨකයා දැනුවත් කිරීම.
- පුස්තකාල හඳුන්වා දීමේ වැඩසටහන් මගින් පුස්තකාලය තුළ දී කුඩා කණ්ඩායම් වශයෙන් එක් එක් අංශය පිළිබඳව දැනුවත් කිරීම හා එකතුව පිළිබඳව දැනුවත් කිරීම. එහිදී සුදුසු පරිදි ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධ්‍යය භාවිතය.
- වාර සඟරා භාවිතය වැඩි දියුණු කිරීම සඳහා වාර සඟරා අංශය මගින් වැඩමුළු, තොරතුරු සාක්ෂරතා වැඩසටහන් පැවැත්වීම.
- නව තොරතුරු අවශ්‍යතාවන්ට සරිලන වාර සඟරා පුස්තකාලයට අයත්කර ගැනීම හා පුස්තකාලය වාර සඟරා අයත්කර ගැනීමේදී පාඨක මතය නියෝජනයවන පරිදි පාඨක ප්‍රතිචාර ලබාගැනීම.
- පුස්තකාලයට අයත්කර ගන්නා නවතම වාර සඟරා පිළිබඳව පුස්තකාල කළමනාකරණ සිසුන් මෙන්ම අනෙකුත් පීඨවල සිසුන් ද දැනුවත් කිරීම සඳහා වාර සඟරා අංශය තුළ දී නව වාර සඟරා පාඨක ප්‍රදර්ශනය සඳහා තැබීම, දැන්වීම් පුවරු භාවිතයෙන්, වාර සඟරා අංශය පිළිබඳ තොරතුරු ඇතුළත් කුඩා අත්පොත් (Booklet, Brouchers) සම්පාදනය හා පුස්තකාලයෙන් පිටත කළමනාකරණ පීඨය තුළ දෙපාර්තමේන්තු මට්ටමෙන් දැන්වීම් පුවරු හා අත්පත්‍රිකා ඇසුරින් සිදු කිරීම.
- ඉලෙක්ට්‍රොනික සඟරා බාගත කිරීම වේගවත් කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ අන්තර්ජාල වේගය වැඩි කිරීමට (bandwidth) වැඩි කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ජයතිස්ස, එල්. ඒ. (1999). පුස්තකාල කළමනාකරණය. කර්තෘ, කැලණිය.

ජයතිස්ස, එල්. ඒ. (2014). ඉලෙක්ට්‍රොනික යුගයේ පුස්තකාල කළමනාකරණය. ගොඩගේ, කොළඹ.

පියසිරි, ජී. ඩී. (1977). කළමනාකරණ මූලිකාංග. දයාවංශ ජයකොඩි සහ සමාගම කොළඹ.

ප්‍රනාන්දු, ජානකී. (2000). ශ්‍රී ලංකාවේ වාර සගරා, පුවත්පත්, සම්මන්ත්‍රණ පත්‍රිකා සහ රජයේ ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනය. පුස්තකාල ප්‍රවෘත්ති, 21(2).

බාලසූරිය, එල්.ඩී. නදීෂා සඳමාලි. (2012). 'ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල විද්‍යුත් වාර සඟරා ප්‍රවේශයට ලබා දී ඇති දායකත්වය හා සිසුන්ගේ භාවිතය පිළිබඳ අධ්‍යයනයක්'. තෙවන පුස්තකාල හා විඥාපන විද්‍යා සම්මන්ත්‍රණය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

හසන්තිකා, උදාරි. (2012). 'ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල කලා පීඨ හා කළමනාකරණ පීඨ සිසුන්ගේ වාර සඟරා .භාවිතය පිළිබඳ අධ්‍යයනයක්'. තෙවන පුස්තකාල හා විඥාපන විද්‍යා සම්මන්ත්‍රණය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

Afaq, Novera and Mahmood, Khalid. (2005). 'Use of LIS journals in developing countries – a comparative study of Malaysia and Pakistan'. Library Review, [online] 54(3) http://www.emeraldinsight.com/doi/full/10.11 08/0024253051 05 88 944 [10tct 2018]

Ishikawa, Masashi and Fukazawa, Takeyasu. (2008). Survey on usage of electronic journals in Japan Atomic Energy Agency. JAEA-Review https://inis.iaea.org/search/search.aspx?orig_q=RN:40024366 [9th Nov 2018]

Nunoo, Francis Kofi Nimo. (2012). The awareness, access and usage of electronic journals among academic staff in KNUST. Thesis of Master of Art http://ir.knust.edu.gh/handle/123456789/6237 [3rd Oct 2018]

# Information society

# පාඨක තොරතුරු අවශ්‍යතා සාධනයේ දී මහජන පුස්තකාලවලින් ලැබෙන පිටිවහල පිළිබඳ අධ්‍යයනයක් (ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ සහ මඩකලපුව දිස්ත්‍රික්ක ඇසුරෙනි)

**බී. ජී. රංගනී**

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි (පුස්තකාල හා විඥාපන විද්‍යාව),
කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
geethika94612@gmail.com

**ඒ. ජී. ආර්. පී. කුමාර,**

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි (කැලණිය විශ්වවිද්‍යාලය),
සහකාර පුස්තකාලයාධිපති,
මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.
kumaraagrpk123@gmail.com

**සාරාංශය**

අධ්‍යාපනික, පර්යේෂණික, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික කටයුතු ආදී විවිධ කාර්යයන් නිසා මානව දැනුමට එකතු වන තොරතුරු මහා ප්‍රවාහයක් බවට පත් ව සීඝ්‍රයෙන් වර්ධනය වේ. මෙලෙස බිහි වන තොරතුරු පාඨකයාට සම්ප්‍රේෂණය කිරීමටත්, අනාගත අවශ්‍යතා සඳහා උරුම කරලීමටත් වගකීම පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථාන වෙත පැවරෙන අතර එයින්ද මහජන පුස්තකාල ප්‍රධාන භූමිකාවක් හොබවයි. පාඨක තොරතුරු අවශ්‍යතා සාධනයේ දී මහජන පුස්තකාලවලින් ලැබෙන පිටුවහල පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. පාඨක තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීම, පාඨකයන්ට අවශ්‍ය කරන තොරතුරුවල ස්වභාවය, තොරතුරු වර්ග හා තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීම, පාඨක තොරතුරු අවශ්‍යතා සඳහා මහජන පුස්තකාල කොතෙක් දුරට වැදගත් වන්නේ ද, දැනට පවතින ගැටලු

අඩුපාඩු කවරේ ද, යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ සෙසු අරමුණු ලෙස හඳුනා ගත හැකිය. මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති මහජන පුස්තකාල සංගහනය වූ අතර පර්යේෂණ නියැඳිය වූයේ දිස්ත්‍රික්ක පහකට අයත් මහජන පුස්තකාල පහකි. පර්යේෂණ විධික්‍රමය වූයේ ප්‍රශ්නාවලී ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. ලබා ගත් දත්ත සහ තොරතුරු විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කර ඇත. පර්යේෂණයේ නිගමනය වශයෙන් පාඨක තොරතුරු අවශ්‍යතා සඳහා මහජන පුස්තකාල මඟින් ලැබෙන පිටුවහල ප්‍රමාණවත් නොවන බව තහවුරු විය. පාඨකයන් තම තොරතුරු අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී විවිධ ගැටලුවලට මුහුණ පාන බවත් හෙළිදරව් විය. පුස්තකාලය තුළ යාවත්කාලීන තොරතුරු මූලාශ්‍රවල හිඟකම, මනා තොරතුරු කළමනාකරණයක් නොමැති වීම, පාඨක උද්දේශන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම, නිලධාරීන්ගේ සුහදශීලීත්වය අඩු වීම සහ තොරතුරු අවශ්‍යතා හා සේවා ඉටු කර ගැනීමේ දී කාර්යමණ්ඩලය ලබා දෙන සහයෝගය සහ මඟපෙන්වීම ප්‍රමාණවත් නොවීම මෙයට ප්‍රධාන ලෙසම බලපා ඇත. පාඨක තොරතුරු අවශ්‍යතා නිවැරදිව හඳුනා ගැනීම මෙන්ම එම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා උචිත කාර්යක්ෂම වූත් විධිමත් වූත් තොරතුරු සැපයීමේ යාන්ත්‍රණයක් මහජන පුස්තකාල විසින් ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බව මෙයින් තහවුරු වේ.

**ප්‍රමුඛ පද :** තොරතුරු, තොරතුරු මූලාශ්‍ර, තොරතුරු සන්නිවේදන මාධ්‍ය, තොරතුරු සාක්ෂරතාවය, තොරතුරු සමාජය, මහජන පුස්තකාල

## හැඳින්වීම

ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් මෙන්ම තොරතුරු ද මිනිසාගේ ප්‍රධාන අවශ්‍යතාවයක් බවට පත් ව තිබේ. මිනිසාට එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවල දී තොරතුරු පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වේ. තොරතුරුවලින් තොරව මානව ජීවිතය පවත්වා ගෙන යා නොහැකි තරමටම තොරතුරු මානව ජීවිතය හා සම්බන්ධ වී ඇත. අධ්‍යාපනික, පර්යේෂණික, ආර්ථික කටයුතු, දේශපාලනික කටයුතු, සංස්කෘතික කටයුතු ආදී විවිධ කාර්යයන් නිසා මානව දැනුමට එකතු වන තොරතුරු මහා ප්‍රවාහයක් බවට පත් ව තිබේ. ඒ අනුව නව තොරතුරු බිහිවීමත්, තිබෙන තොරතුරු යල්පැනයාමත් හේතු කොට ගෙන විවිධ නිමාවන්ගෙන් යුත් තොරතුරු බිහිවීමේ වේගය දෙගුණ තෙගුණ වෙමින් පවතී. මෙලෙස තොරතුරුවල සිදුවන විප්ලවීය වර්ධනයත් සමඟ වර්තමාන සමාජය තොරතුරු සමාජයක්, දැනුම් මූලික සමාජයක් බවට පරිවර්තනය වී තිබේ.

මෙලෙස තොරතුරු බිහිවීමේ වේගයත් සමඟ පාඨක තොරතුරු අවශ්‍යතාවයන් ද සීඝ්‍ර ලෙස වර්ධන වෙමින් පවතී. එමෙන්ම වර්ධනය වන පාඨක තොරතුරු අවශ්‍යතා ඉතා සංකීර්ණ ස්වාභාවයකට ද පත්ව තිබේ. Oxford dictionary අනුව එක්තරා පුවත්පතක්, සඟරාවක් හෝ පෙළක් කියවන පුද්ගලයෙකු පාඨකයෙක් ලෙස හැඳින්විය හැකිය.

ඒ අනුව මිනිසාට එදිනෙදා පැන නඟින විවිධ ගැටලු නිරාකරණය කර ගැනීමටත්, දැනුම හා බුද්ධිය වර්ධනය කර ගැනීමටත් රැකියා කටයුතු සාර්ථක කර ගැනීමටත්, කළමනාකරණ තීරණ ගැනීමටත්, ප්‍රතිපත්ති සැලසුම් සම්පාදනය කිරීමටත්, පර්යේෂණ හා නව සොයා ගැනීම් සිදු කිරීමටත්, විනෝදය ලබා ගැනීමටත් තොරතුරු අවශ්‍ය වේ. මෙම තොරතුරු අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා ඔවුහු තම පවුල් පරිසරය, සමාජ වටපිටාව, සේවා ස්ථාන, පුවත්පත්, රූපවාහිනී, ගුවන්විදුලිය, අන්තර්ජාලය වැනි ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් මූලාශ්‍ර භාවිතා කෙරේ.

මේ ආකාරයට තොරතුරු දිනෙන් දින යාවත්කාලීන වෙමින් නැවත නැවත සකස් වන අතරම ඒ හා සමගාමීව යාවත්කාලීන තොරතුරු බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයන් පිරිසක් ද නිර්මාණය වේ. මෙලෙස නිර්මාණය වන තොරතුරු සහ පාඨක තොරතුරු අවශ්‍යතා එකිනෙකට මුණගැස්වීමෙහි ලා යම්කිසි සන්නිවේදන මාධ්‍යයක අවශ්‍යතාවය පැන නඟී. මෙහි දී තොරතුරු නිෂ්පාදනය කරන්නෙකු සිටීම, ග්‍රාහකයෙකු සිටීම සහ යම්කිසි සන්නිවේදන මාධ්‍යයක් පැවතීම තොරතුරුවල ලක්ෂණ ලෙස පෙන්වා දිය හැකිය. ඒ අනුව, තොරතුරු ශූන්‍යතාවයට පත් නොවන දෙයකි. තොරතුරු පාඨකයාගේ අවශ්‍යතාවය අනුව අවසන් වනු විනා එය අවසන් නොවන දෙයකි. තොරතුරු නිතරම මාධ්‍යයන් උපයෝගී කර ගෙන ගලා යන දෙයකි.

මෙලෙස බිහි වන තොරතුරු පාඨකයාට සම්ප්‍රේෂණය කිරීමටත්, අනාගත අවශ්‍යතා සඳහා උරුම කරලීමටත් වගකීම පැවරෙනුයේ වර්තමාන පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථාන වෙතටය. භූගෝලීය, දේශපාලන, සමාජයීය හා සංස්කෘතිකමය කඩඉම් හරහා ගලා යන තොරතුරු ප්‍රවාහය  මෙහෙයවීම හා ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වීම සඳහා ඇති විඥාපන ආයතන අතර පුස්තකාලයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි.

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම අද දක්වා එක් පරපුරක් සතු දැනුම තවත් පරපුරකට උරුම කර දෙමින් අද්විතීය සේවාවක් ඉටු කරන ප්‍රජාතාන්ත්‍රික සමාජීය ආයතනයක් ලෙස පුස්තකාලය හැඳින්විය හැකිය. යම්කිසි පුද්ගලයෙකුට හැඟීමක් දැනීමක් අරුතක් දෙන යමක් තොරතුරක් වන අතර පුස්තකාලය තරම් ජනතාවගේ සිතුම් පැතුම් කෙරෙහි බලපාන වෙනත් ආයතනයක් නොමැති තරම්ය. ඒ අනුව පුස්තකාල පාඨක තොරතුරු අවශ්‍යතාවයන් සපුරාලීමේ නිරන්තර උත්සාහයක යෙදී සිටී. මේ අතරින් මහජන පුස්තකාලයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. පුස්තකාල සේවා අවශ්‍ය සැමට පොදුවේ සේවය සපයන ආයතනයක් ලෙස මහජන පුස්තකාලය අන් පුස්තකාල වර්ගවලින් වෙන් කර හඳුනා ගත හැකිය. මහජන පුස්තකාල ප්‍රාදේශීය, කලාපීය හෝ ජාතික රාජ්‍යයන් හෝ වෙනත් ස්වරූපයකින් යුත් ප්‍රජා සංවිධානයක් මඟින් හෝ ප්‍රජාව මඟින් හෝ ස්ථාපිත කරන ලද, ආධාර කරනු ලබන අරමුදල් සපයනු ලබන සංවිධානයකි. එය පුළුල් පරාසයක සම්පත් හා සේවාවන් මඟින් දැනුම, තොරතුරු හා පරිකල්පනාත්මක කාර්යයන් සඳහා සියලු සාමාජිකයන්ට සම සේ ප්‍රවේශය සපයයි. එහිදී ඔවුන්ගේ ජාතිය, ආගම, භාෂාව, ආබාධිත බව, ආර්ථික හා රැකියා තත්ත්ව සහ අධ්‍යාපනික මට්ටම සලකා බලනු නොලැබේ. ඒ අනුව මහජන පුස්තකාල සියල්ලන් සඳහා විය යුතුය යන්න එහි මූලික ප්‍රතිපත්තියයි. ජාත්‍යන්තර පුස්තකාල සංගම් සම්මේලනය දක්වන පරිදි ස්වකීය අභිමතාර්ථයන් නොවලහා ඉටු කර ගැනීම සඳහා මහජන පුස්තකාලය අනවතරයෙන් ම ජාති භේද, ආගම් භේද, භාෂා භේද, අධ්‍යාපනික හා වෘත්තීය භේද, ලිංග භේද, සමාජ හා ජීවන තත්ත්ව භේද ඉක්ම වූ ආයතනයක් ලෙස පවත්වා ගෙන යා යුතුය.

ඒ අනුව මහජන පුස්තකාලයන්හි ප්‍රාථමික අභිප්‍රාය වන්නේ පුද්ගලයන්ගේ හා සමාජ කණ්ඩායම්වල අධ්‍යාපනික, තොරතුරු හා පුද්ගල සංවර්ධනය මෙන්ම නිර්මාණාත්මක හා වින්දනාත්මක අවශ්‍යතා සපුරාලීමට විවිධ වූ මාධ්‍යවලින් සමන්විත සම්පත් හා සේවා සැපයීම වේ. ඊට අමතරව පුළුල් සහ නන්විධ පරාසයකින් යුත් දැනුම, අදහස් හා ආකල්ප වෙත පෞද්ගලික ප්‍රවේශයක් සැපයීම මඟින් ප්‍රජාතාන්ත්‍රීය සමාජයක් සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාමකි.

"දැනුම සඳහා ප්‍රාදේශීය දොරටුවක් වන මහජන පුස්තකාල පෞද්ගලික මෙන්ම සමාජ කණ්ඩායම්වල යාවජීව ඉගෙනුම, ස්වාධීන තීරණ ගැනීම සහ සංස්කෘතික දියුණුව උදෙසා වූ මූලික පහසුකම් සපයා දෙති." (ඉෆ්ලා /

යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රඥප්තිය, 1994)

අධ්‍යාපනය, විඥාපන සේවා, විනෝදාස්වාදය, වින්දනය හා ඇගයීම අරමුණු කර ගනිමින් විශාල පරාසයක සේවා මහජන පුස්තකාල මඟින් සංවිධානය කරයි.

"මහජන පුස්තකාලය අධ්‍යාපනය, සංස්කෘතිය හා සන්නිවේදනය පිළිබඳ ප්‍රජාතාන්ත්‍රික ආයතනයකි." (ජයතිස්ස, 2014, පි.161)

අඛණ්ඩ වූ ද, යාවජ් වූ ද, සර්වජන වූ ද, අධ්‍යාපනයක් සැපයීම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික යුතුකමක් වශයෙන් ද, මානව සමාජය අධ්‍යාපනික හා සංස්කෘතික වශයෙන් ලබන ප්‍රගතිය තාත්විකව අගය කිරීමේ සංකේතයක් වශයෙන් ද මහජන පුස්තකාලය සැලකිය යුතු වේ. මිනිසාගේ සිතුම් පැතුම් හා නිර්මාණාත්මක කුසලතාවයන් පිළිබිඹු කරන්නා වූ ලේඛන සම්භාරය නොමිලයේ, නිදහසේ, පොදුවේ පරිහරණය කිරීමට ඉඩ සැලසීමෙන් ද, විනෝදය සඳහා පොත්පත් සම්පාදනය කර මිනිසාගේ භෞතික දියුණුවක් ඇති කර ගැනීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමෙන් ද, මිනිසාගේ ආධ්‍යාත්මික පුනර්ජීවනයක් ඇති කිරීමෙන් ද, ඉගෙන ගැනීමෙහි නිරත වූවන් සඳහා අවශ්‍ය දැනුම සපයාදීමෙන් ද, පොදුවේ තාක්ෂණික විද්‍යාත්මක හා සමාජ ක්ෂේත්‍රයන්හි නවතම දැනුම ලඟා කර දීමෙන් ද මහජන පුස්තකාල සේවය කරනු ලබයි.

සෙසු පුස්තකාලයන්ට වඩා පාඨකයාගේ විවිධ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා කිසිදු භේදයකින් තොරව සේවයට කැප වී ඇති ස්ථානයක් ලෙස මහජන පුස්තකාලය හඳුනා ගත හැකිය. මෙලෙස පාඨක තොරතුරු අවශ්‍යතා සාධනයේ දී මහජන පුස්තකාලය මඟින් ඉටුවන සේවාව පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය තුළින් සිදු කරයි. ඒ අනුව මහජන පුස්තකාල මඟින් ලැබෙන පිටුවහල පාඨක අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් වේ ද හෝ ප්‍රමාණවත් නොවේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම තුළින් පාඨක අවශ්‍යතා නිසි පරිදි ඉටු කිරීමට සරිලන මහජන පුස්තකාල සේවාවක් ස්ථාපනය කිරීමෙහි ලා මාර්ගෝපදේශකයක් සැපයීම අපේක්ෂා කරයි.

### අධ්‍යයන අරමුණු

පාඨක තොරතුරු අවශ්‍යතා සාධනයේ දී මහජන පුස්තකාලවලින් ලැබෙන පිටවුහල පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර අනෙකුත් අරමුණු පහත පරිදි වේ.

1) පාඨක තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීම.

2) පාඨකයන්ට අවශ්‍ය කරන තොරතුරුවල ස්වාභාවය, තොරතුරු වර්ග හා තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීම.

3) පාඨක තොරතුරු අවශ්‍යතා සඳහා මහජන පුස්තකාල කොතෙක් දුරට වැදගත් වන්නේ ද? දැනට පවතින අඩුපාඩු කවරේ ද යන්න විමසා බැලීම.

## පර්යේෂණ ක්‍රමවේදය

පාඨක තොරතුරු අවශ්‍යතා සාධනයෙහි ලා මහජන පුස්තකාලවලින් ලැබෙන පිටුවහල පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කරයි. මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ ක්‍රමය යොදා ගන්නා ලදී. ඒ අනුව ප්‍රශ්නාවලි සහ පුද්ගල හමුවීම් මඟින් තොරතුරු රැස් කර ගනු ලැබීය. සමීක්ෂණය සිදු කිරීමේ දී යොදා ගන්නා ලද්දේ ව්‍යුහගත හා ව්‍යුහගත නොවන ප්‍රශ්නාවලී වේ. මෙහිදී මහජන පුස්තකාලයාධිපතීන්ට හා මහජන පුස්තකාල පාඨකයින් සඳහා ප්‍රශ්නාවලි ඉදිරිපත් කර අවශ්‍ය තොරතුරු රැස් කර ගන්නා ලදී.

### සංගහනය හා නියැදිය

මෙම අධ්‍යයනයේ දී සංගහනය ලෙස ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති මහජන පුස්තකාල යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සියලුම මහජන පුස්තකාල වෙත අධ්‍යයන කාල සීමාවේ දී ළඟා වීමට නොහැකි බැවින් දිස්ත්‍රික්ක පහකට අදාළ මහජන පුස්තකාල අතරින් එක් දිස්ත්‍රික්කයකින් එක් ප්‍රධාන මහජන පුස්තකාලය බැගින් මහජන පුස්තකාල පහක් තෝරා ගෙන අධ්‍යයනය සිදු කරන ලදී. ඒ අනුව ආචාර්ය රිචඩ් පතිරණ මහජන පුස්තකාලය - ගාල්ල, මාතර කුමාරතුංග මුනිදාස මහජන පුස්තකාලය, හම්බන්තොට මහජන පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය සහ මඩකලපුව මහජන පුස්තකාලය මෙහි නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. මෙම මහජන පුස්තකාල තුළින් ළමා, තරුණ, වැඩිහිටි පාඨකයින් 100ක ප්‍රමාණයක් යොදා ගන්නා ලදී.

### සාහිත්‍ය විමර්ශනය

පාඨක තොරතුරු අවශ්‍යතා සාධනයෙහි ලා මහජන පුස්තකාලවලින් ලැබෙන පිටුවහල පිළිබඳව අධ්‍යයනයේ දී ඍජු ලෙසම පාඨක තොරතුරු අවශ්‍යතා සහ මහජන පුස්තකාල පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි.

පුස්තකාල ආරම්භ වී බොහෝ කලක් ගත වුව ද මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පවතින සාහිත්‍යයේ අඩුව ශ්‍රී ලංකාවේ පුස්තකාලයාධිපතීත්වයට ප්‍රබල අභියෝග යකි. මෙහිදී පාඨක තොරතුරු අවශ්‍යතා සහ මහජන පුස්තකාල පිළිබඳ ලියැවී ඇති මාතෘකා අළලා බිහි වූ සාහිත්‍යය සාපේක්ෂ වශයෙන් එතරම් විශාල නොවූව ද අඩු වශයෙන් මෙම මාතෘකාව පිළිබඳව විවිධ පැතිකඩ ඔස්සේ දක්වන පර්යේෂණ වාර්තා මෙන්ම බොහෝ ලිපි ලේඛන හා පොත්පත් යම් ප්‍රමාණයක් දේශීය හා විදේශීය වශයෙන් පරිශීලනය කරන්නට යෙදුණි. ඒ අනුව මෙම පර්යේෂණයට අදාළව ගවේෂණය කරනු ලබන සාහිත්‍ය විමර්ශනය පහත පරිදි වේ.

පාඨකයාට ඉහළ පාඨක සේවාවක් ලබා දීම සඳහා පාඨක අවශ්‍යතා අවබෝධ කර ගැනීම සහ සපුරාලීම පිළිබඳව අධ්‍යයනය දශක ගණනාවක සිටම පුස්තකාලයාධිපතිවරුන්ගේ අවධානය යොමු වූ කාර්යයකි. පුස්තකාල විමර්ශන සේවාවේ පියා ලෙස විරුදාවලිය ලත් සැමුවෙල් ග්‍රීන් (1876) පාඨකයා හා

පුස්තකාලයාධිපති අතර සුහද බැඳීමක් තිබිය යුතු බවට ගවේෂණාත්මක විග්‍රහයක් සිදු කර ඇත. පර්යේෂකයා සේවය කළ ඇමරිකාවේ ''Worcenter'' මහජන පුස්තකාලයට තොරතුරු අපේක්ෂාවෙන් සමාජයේ විවිධ තරාතිරමේ පුද්ගලයන් පැමිණි බවත් ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා විවිධ බවත් පර්යේෂකයාට නිරීක්ෂණය වී ඇත. තොරතුරු සොයා පැමිණෙන පාඨකයන් අතර පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ශිෂ්‍යත්වලාභීන්, පර්යේෂකයින්, කාර්මිකයින්, ගුරුවරුන්, කම්කරුවන්, ගොවීන්, රෝගීන්, නිර්මාණකරුවන්, කුෂන් වැඩකරුවන් වූ බව සඳහන් කර ඇත. එසේම නව නිවසක් ඉදි කිරීමට අවැසි පුද්ගලයින් ද ඒ පිළිබඳව වැඩි විස්තර දැන ගැනීමට පැමිණ ඇත්තේ මහජන පුස්තකාල වෙතයි. මේ ආකාරයට සැමුවෙල් ග්‍රීන් පුස්තකාලය වෙත තොරතුරු අපේක්ෂාවෙන් පැමිණෙන විවිධ පුද්ගල කොට්ඨාශ හා තොරතුරු අවශ්‍යතා අධ්‍යයනය කර පාඨකයාත්, පුස්තකාල නිලධාරියාත් අතර සහයෝගීතාවය වර්ධනය වන ආකාරයේ උපදෙස් මාලාවක් නිකුත් කර ඇත.

ශ්‍රී ලංකාවේ රසායන විද්‍යාඥයින්ගේ තොරතුරු අවශ්‍යතා සහ තොරතුරු ගවේෂණ හැසිරීම පිළිබඳව තිරුඥානසුන්දරම් පර්යේෂණයක් කර ඇත. රසායන විද්‍යාඥයින් 60 ක සාම්පලයක් රාජ්‍ය අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් තොරා ගෙන ඇත. මෙයට අනුව රසායන විද්‍යාඥයින්ගේ තොරතුරු ගවේෂණයේ අරමුණ ලෙස ඔවුන් දැනට කර ගෙන යනු ලබන පර්යේෂණ කටයුතු සඳහා සහ රටේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීම බව තහවුරු වී ඇත. තිරුඥානසුන්දරම් (1994).

ශ්‍රී ලංකාවේ ද විවිධ වෘත්තීන් හා සම්බන්ධව තොරතුරු අවශ්‍යතා විවිධාකාරයෙන් විස්තර කර ඇත. ශ්‍රී ලංකාවේ මුදන්නායක විසින් 1989 දී කෘෂි විද්‍යාඥයින්ගේ තොරතුරු අවශ්‍යතා හා තොරතුරු භාවිතය පිළිබඳ ගවේෂණයක් සිදු කර ඇත. මේ සඳහා කෘෂිකාර්මික විද්‍යාඥයින් 195 දෙනෙකුගෙන් යුත් නියැඳියක් තෝරා ගෙන ඇත. ප්‍රශ්නාවලී මඟින් තොරතුරු රැස් කර ගෙන ඇත. විද්‍යාඥයින්ගේ පර්යේෂණ විෂය ක්ෂේත්‍රය පදනම් කර ගෙන, පර්යේෂණ පථය අවධාරණය කරමින් මූලික හෙළිදරව්ව කර ඇත. මෙම පර්යේෂකයින්ගේ ප්‍රධානම පරමාර්ථය වී ඇත්තේ, ක්ෂේත්‍රය තුළ නව සංවර්ධනය පිළිබඳ ඉගෙනීමටත් ඔවුන්ගේ ප්‍රවර්තන පර්යේෂණ කටයුතු සඳහා තොරතුරු රැස් කිරීමත් ය. මුදන්නායක (1987) ශ්‍රී ලංකාවේ හමුවන මුල්ම විධිමත් තොරතුරු අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනය ලෙස සැලකේ.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතාවයන් සහ ඒ විෂයයන් ඔවුන්ගේ හැසිරීම් රටා පිළිබඳව සෙනෙවිරත්න (2006), දී කළ අධ්‍යයනය ශ්‍රී ලංකාවේ තොරතුරු අවශ්‍යතා පිළිබඳව අධ්‍යයනයන් වෙනස් මඟකට යොමු කිරීමට සමත් වී ඇත. මේ අනුව තොරතුරු අවශ්‍යතා හා ඉතිහාසය පිළිබඳව විමසා බලන විට ශ්‍රී ලංකාවේ ද ප්‍රථමයෙන් ආරම්භ වී ඇත්තේ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ තොරතුරු අවශ්‍යතා අධ්‍යයනයන් වේ.

ඉෆ්ලා / යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රඥප්තිය (1994), දැනුම සඳහා වූ ප්‍රාදේශීය දොරටුවක් වන මහජන පුස්තකාල පෞද්ගලික මෙන්ම සමාජ කණ්ඩායම්වල යාවජීව ඉගෙනුම, ස්වාධීන තීරණ ගැනීම සහ සංස්කෘතිකාංග දියුණුව උදෙසා වූ මූලික පහසුකම් සපයා දෙන ආයතනයක් ලෙස පෙන්වා දෙයි.

පුලිඩෝ (1999) *"Assessment and analysis of genres of imaginative literature in public libraries of*

Autonomous country, නමින් අධ්‍යයනයක් සිදු කර ඇත. මෙහි සඳහන් වන්නේ ස්පාඤ්ඤයේ මහජන පුස්තකාල සඳහා ත්‍රාසජනක හා විද්‍යා ප්‍රබන්ධ තෝරා ගැනීමේ දී පාඨක රුචිකත්වය හා අවශ්‍යතා කෙරෙහි කොතෙක් දුරට සැලකිලිමත් වන ආකාරයයි.

සුෆා (1986) මහජන පුස්තකාල සඳහා කෘෂිකාර්මික තොරතුරු ප්‍රතිග්‍රහණය කිරීම යනුවෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. විශේෂිත වූ පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම අරමුණු කරගෙන මහජන පුස්තකාලයක මූලාශ්‍ර ප්‍රතිග්‍රහණය කළ යුතු බවත්, විශේෂිත වූ පාඨකයන්ට අවශ්‍ය ප්‍රාථමික තොරතුරු පුස්තකාල එකතුවෙන් ලබා ගත හැකි බවත් පර්යේෂකයා පෙන්වා දෙයි.

## දත්ත රැස් කිරීම

මෙම අධ්‍යයනයේ අරමුණු සපුරා ගැනීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත යොදා ගන්නා ලදී. එහිදී දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයන් දෙකක් යොදා ගනු ලැබීය.

- ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය
- ද්විතීයික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය

ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත රැස් කර ගනු ලැබූ අතර තෝරා ගත් මහජන පුස්තකාල වන ආචාර්ය රිචඩ් පතිරණ මහජන පුස්තකාලය - ගාල්ල, මාතර කුමාරතුංග මුනිදාස මහජන පුස්තකාලය, හම්බන්තොට මහජන පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය සහ මඩකලපුව මහජන පුස්තකාලය මුල් කර ගෙන අධ්‍යයනයට අවශ්‍ය දත්ත ලබා ගනු ලැබීය. අවශ්‍ය ප්‍රශ්නාවලී තෝරාගත් පුස්තකාලවල පාඨක ප්‍රජාවට හා පාඨක නොවන නමුත් පුස්තකාලය පරිහරණය කරන ප්‍රජාවට ද ලබා දෙන ලදී.

එමෙන්ම තෝරාගත් මහජන පුස්තකාල පහෙහි පුස්තකාලයාධිපතිවරුන් හමුවී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබා ගන්නා ලදී .

ද්විතීයික දත්ත රැස් කිරීම සඳහා පොත්, වාර සඟරා, පුවත්පත් ලිපි, උපාධි නිබන්ධන, විශ්වකෝෂ, පර්යේෂණ වාර්තා, සම්මන්ත්‍රණ වාර්තා, සංඛ්‍යා ලේඛන වාර්තා උපයෝගී කර ගන්නා ලදී.


දත්ත විශ්ලේෂණය ප්‍රතිශත, සම්මත අපගමනය, මාතය, මධ්‍යස්ථය ආදී සංඛ්‍යා විද්‍යාත්මක ශිල්ප ක්‍රම ඔස්සේ වගු, ප්‍රස්ථාර භාවිත කරමින් SPSS හා MS-Excel ක්‍රමවේද හරහා දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. තොරතුරුවල අවශ්‍යතාවය පාඨක

තොරතුරු අවශ්‍යතා පිළිබඳ ගවේෂණයේ දී පාඨකයන්ට තොරතුරුවල ඇති අවශ්‍යතාවය කුමන මට්ටමක පවතී ද යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. 1 වගුව ඇසුරින් ලබාගත් දත්තයන්ට අනුව එම අවශ්‍යතාවය කෙතරම් වේද යන්න හඳුනා ගත හැකිය. එම දත්තයන්ගෙන් ලද තොරතුරු ඔස්සේ පාඨකයන්ට තොරතුරුවල ඇති අවශ්‍යතාවය කුමන මට්ටමක පවතී ද යන්න පිළිබඳව විග්‍රහයක් කළ හැකි වේ. ඒ අනුව වැඩිම පාඨක පිරිසක් තොරතුරු ඉතාමත් අත්‍යඅවශ්‍යයි, යන ස්ථාවරයේ පිහිටා සිටී. 55 දෙනෙකු මෙයට අයත් වන අතර මෙය ප්‍රතිශතයක් ලෙස ගත් විට 55% කි. 32 දෙනෙකු තොරතුරු අවශ්‍යයි යන මට්ටමේ සිටී. 32% ක ප්‍රතිශතයක් වශයෙන් එය නිරූපිතය. තොරතුරු ඇතැම් විට අවශ්‍යයි ලෙස ප්‍රකාශ කරනු ලබන පිරිස 13 ක් වන අතර එය 13 % ක ප්‍රතිශතයකි. (1 වගුව : තොරතුරුවල අවශ්‍යතාවය) එදිනෙදා අවශ්‍ය තොරතුරු පාඨකයන්ට තොරතුරුවල ඇති අවශ්‍යතා පිළිබඳ ගවේෂණය කිරීමෙන් අනතුරුව පාඨකයාට කුමන තොරතුරු අවශ්‍ය වන්නේ දැයි පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා පරාසය තුළ කුමන තොරතුරු ක්ෂේත්‍රයක් වෙත වැඩි ප්‍රමුඛතාවයක් දක්වන්නේ ද යන්න පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය . එය ඉතා සාර්ථක පුස්තකාල සේවාවක් සැපයීමට මහඟු පිටුවහලකි.

ලබා ගත් දත්තයන්ට අනුව පාඨකයන්ට අවශ්‍ය කරන තොරතුරු මොනවා ද සහ එම තොරතුරු අවශ්‍යතා පරාසය තුළ කුමන තොරතුරු ක්ෂෙත්‍රයක් වෙත වැඩි ප්‍රමුඛතාවයක් දක්වන්නේ ද යන්න පිළිබඳව හඳුනාගත හැකිය. (2 වගුව : එදිනෙදා අවශ්‍ය තොරතුරු )

එම දත්තයන්ගෙන් ලද තොරතුරු ඔස්සේ වැඩිම පාඨක පිරිසකට අවශ්‍ය කරනු ලබන තොරතුරු විශේෂය වනුයේ අධ්‍යාපනික තොරතුරු වන අතර 93 දෙනෙකු මෙයට අයත්ය. ආර්ථික හා සාමාජීය තොරතුරු අවශ්‍ය කරන පිරිස සමාන අගයක් ගනී. එම පිරිස 84 දෙනෙකු වන අතර 15% ක ප්‍රතිශතයක් වශයෙන් එය නිරූපිතය. අනතුරුව පිළිවෙළින් සෞඛ්‍ය තොරතුරු, විනෝදාත්මක තොරතුරු, ආගමික තොරතුරු, දේශපාලනික තොරතුරු වශයෙන් පාඨක තොරතුරු නැඹුරුව දක්වා ඇත. එම ප්‍රතිශතය පහත පරිදි ප්‍රස්තාරයක් තුළින් නිරූපණය කළ හැකිය.

ප්‍රස්ථාරය 1 ප්‍රතිශත ප්‍රස්තාරය : එදිනෙදා අවශ්‍ය තොරතුරු




තොරතුරු ලබා ගන්නා මාධ්‍යය ඉහත තොරතුරු අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී පාඨක ප්‍රජාව විසින් පරිහරණය කරනු ලබන තොරතුරු මාධ්‍යයන් සොයා බැලීම ද වැදගත්ය. එසේ සොයා බලන ලද තොරතුරු 3 වගුවේ වගු ගත කර ඇත. එම දත්තයන්ට අනුව වැඩි පිරිසක් භාවිත කරනු ලබන්නේ පොත්පත් හා පුවත්පත් / සඟරා වේ. 92 දෙනෙකු මෙයට අයත් වෙයි. ප්‍රතිශතයක් ලෙස ගත් විට එය 29% කි. දෙවනුවට වැඩි පිරිසක් භාවිත කරනු ලබන්නේ විද්‍යුත් මාධ්‍ය වේ. 72 දෙනෙකු මෙයට අයත් වෙයි. ප්‍රතිශතයක් ලෙස ගත් විට එය 22% කි. පර්යේෂණ ලිපි 34 දෙනෙක්, ප්‍රතිශතයක් ලෙස 10% ක් ද, අවම ලෙස වෙනත් මාධ්‍යයන් පරිහරණය කරන පිරිස දැක්විය හැකි අතර එහි අගය 31 කි. 10% ක ප්‍රතිශතයක් ඔවුන් නිරූපණය කරයි. (3 වගුව හා ප්‍රස්තාරය 2 : තොරතුරු ලබා ගන්නා මාධ්‍යය) පුස්තකාලයෙන් ලබා ගන්නා සේවා පාඨකයන් විසින් ස්වකීය තොරතුරු අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා විවිධ සේවාවන් පුස්තකාලය තුළින් ලබා ගනී. දත්තයන්ට අනුව පාඨකයන් වැඩිම ප්‍රමාණයක් ලබා ගන්නා සේවාව වනුයේ පුස්තකාලය තුළ කියවීමයි. 89 දෙනෙක් මෙම සේවාව ලබා ගන්නා බවට තොරතුරු ලබා දී ඇති අතර ප්‍රතිශතයක් ලෙස එය 22% කි. 77 දෙනෙක් පත්තර කියවීම ද 72 ක් සඟරා කියවීම ද යන සේවාවන් පුස්තකාලය තුළින් ලබා ගනී. ඔවුන්ගේ ප්‍රතිශත අගයන් පිළිවෙළින් 19% හා 18% වේ. මීට අමතරව 61 දෙනෙක් ප්‍රතිශතයක් ලෙස 15% ක් විනෝදාත්මක දේ කියවීම සඳහා සහ බැහැර ගෙන යාමේ සේවය ලබා ගන්නා පාඨකයන් 53 ක් ද ප්‍රතිශතයක් ලෙස 13% ක් ද වේ. ඉහත වගුවෙහි සඳහන් තොරතුරුවලට අනුව මෙම සේවා අතුරින් අවම පාඨක ප්‍රමාණයක් භුක්ති විඳින සේවාව වනුයේ රැකියා ඇබෑර්තු දැන ගැනීම සඳහා ය. එම පිරිස 61 කි. එනම් 13 %ක ප්‍රතිශතයකි. මෙම සේවාවන්ට අදාළව ප්‍රතිශත අගයන් දැක්වෙන ප්‍රස්තාරය ද දක්වා ඇත.

(4 වගුව හා ප්‍රස්තාරය 3 පුස්තකාලයෙන් ලබා ගන්නා සේවා) පුස්තකාලය තුළ තිබෙන මූලාශ්‍රවල ප්‍රමාණවත්භාවය

තම තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමේ දී පුස්තකාලය තුළ පවතින අන්තර්ගතයන් පාඨක අවශ්‍යතාවන්ට සරිලන අයුරින් පවතින්නේ දැයි හඳුනා ගැනීම ඉතා වැදගත් සාධකයකි. පාඨකයින්ගෙන් ලබා ගන්නා ලද තොරතුරු අනුව එය නිර්ණය කර ගත හැකි අතර එම දත්තයන් 6 වගුවේ වගු ගත කර දක්වා ඇත.

වැඩි පාඨක ප්‍රජාවක් ප්‍රකාශ කර තිබෙන්නේ පුස්තකාලය තුළ පවත්නා අන්තර්ගතයේ පාඨකයන්ට අවශ්‍ය සියලු දේ අන්තර්ගත වන බවයි. පාඨකයන් 62ක් ප්‍රමාණවත් ලෙස ප්‍රකාශ කර ඇති අතර එම අන්තර්ගතය තුළ තම තොරතුරු අවශ්‍යතා සඳහා අවශ්‍ය සියලු දේ අන්තර්ගත නොවන බව 38 දෙනෙක් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ප්‍රමාණවත් නොවන ලෙස ප්‍රකාශ කර ඇති පාඨකයන්ගේ ප්‍රතිශතය ලෙස 55% වශයෙන් දැක්විය හැකිය. මෙසේ ලබා ගනු ලැබූ දත්ත ප්‍රස්තාරය මඟින් ඉදිරිපත් කළ හැකිය. (5 වගුව හා 4 ප්‍රස්තාරය : පුස්තකාලය තුළ තිබෙන මූලාශ්‍රවල ප්‍රමාණවත්භාවය) තොරතුරු අවශ්‍යතාවයට පුස්තකාලය දක්වන සහයෝගය පාඨකයාට පුස්තකාල සේවාව, අභ්‍යයන්තර ක්‍රියාපටිපාටිය ආදිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති නිසා කාර්යය මණ්ඩයේ සහය ඔවුනට අවශ්‍යම වේ. එම නිසා පොත පත පරිශීලනය, අවශ්‍යතාවයට අදාළව නියමිත පොත් තෝරා ගැනීම පිළිබඳ දැනුවත් භාවයක් ඔවුනට ලබා දීම පුස්තකාලයාධිපති ඇතුලු කාර්යය මණ්ඩලයේ වගකීමකි.

මහජන පුස්තකාලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය තොරතුරු අවශ්‍යතා වල දී ලබා දෙන දායකත්වය පිළිබඳ දක්වා ඇති අදහස්වලට අනුව 28 දෙනෙකු එනම් 28% ක ප්‍රතිශතයක් දක්වා ඇත්තේ අවශ්‍යතාවයක් දැක් වූ විට සහයෝගය ලබා දෙන බවයි. මීට අමතරව සාමාන්‍ය මතයක් දරන පිරිස 26 ක් ද, ලබා දෙන සහයෝගය ඉතා ඉහල ලෙස 17 දෙනෙකු ද, 15 දෙනෙක් ලැබෙන සහයෝගය දුර්වල ලෙස ද සහ 14 දෙනෙක් ලැබෙන සහයෝගය ඉහළ ලෙස ද දක්වයි. ඔවුන්ගේ ප්‍රතිශත අගයන් පිළිවෙලින් 26%, 17%, 15% සහ 14% ක් වේ. මෙසේ ලබා ගනු ලැබූ දත්ත පහත ප්‍රස්තාරය 8 හා වගුව 6 මඟින් ඉදිරිපත් කළ හැකිය.

(6 වගුව හා 5 ප්‍රස්තාරය : තොරතුරු අවශ්‍යතාවයට පුස්තකාලය දක්වන සහයෝගය) පුස්තකාලය සම්බන්ධයෙන් පවතින ගැටලු

7 වන වගු සටහනට අනුව වැඩිම පාඨක පිරිසක් දක්වා ඇති ගැටලුව වනුයේ ද්‍රව්‍යමය සම්පත් ප්‍රමාණවත් නොවීමයි. පාඨකයන් 43 දෙනෙකු මෙම ගැටලුව දක්වා ඇති අතර ප්‍රතිශතයක් ලෙස එය 26.5 % කි. දෙවනුවට 23.5% ක් එනම් 38 ක පාඨක ප්‍රමාණයක් නිලධාරීන්ගේ සුහදශිලිත්වය අඩුවීම ප්‍රධාන ගැටලුවක් ලෙස දක්වා ඇත. 35 දෙනෙකු එනම් 21.6% ක ප්‍රතිශතයක් වැඩ

සටහන් අවම වීමේ ගැටලුව ද, 21 දෙනෙකු පුස්තකාලයේ අවුල් සහගත සංවිධානය ද, තවත් 21 දෙනෙකු පුස්තකාලය තුළ කියවීමට උචිත පරිසරයක් නොමැති වීම ද දක්වා ඇත. මෙම දෙපිරිසෙහි ප්‍රතිශත අගය 21% කි. 4 දෙනෙකු මේ පිළිබඳ ව කිසිදු අදහසක් නොදක්වා ඇත. එම පිරිස 4% කි. (වගුව 7 හා ප්‍රස්තාරය 6 පුස්තකාලය සම්බන්ධයෙන් පවතින ගැටලු)

**පුස්තකාලයේ පවතින තොරතුරු මූලාශ්‍ර**

පාඨක තොරතුරු අවශ්‍යතා සාධනයෙහි ලා මහජන පුස්තකාල මඟින් ලැබෙන පිටුවහල පිළිබඳ අධ්‍යයනයේ දී පුස්තකාල තුළ පවතින තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීම ද වැදගත් වේ. මෙම තොරතුරු මූලාශ්‍ර ප්‍රධාන වශයෙන් මුද්‍රිත සහ විද්‍යුත් ලෙස කොටස් දෙකකට වෙන් කර දක්වා ඇත. :8 වගුව ඃ පුස්තකාලයේ පවතින තොරතුරු මූලාශ්‍ර)

**නිගමන හා සාකච්ඡා**

නිරීක්ෂණය තුළින් ලබා ගත් දත්තයන්ට අනුව මෙම පර්යේෂණයේ දී එළඹිය හැකි ප්‍රධානතම නිගමනය වන්නේ පාඨක තොරතුරු අවශ්‍යතාවය මහජන පුස්තකාල තුළින් ප්‍රමාණවත්ව ඉටු නොවන බවයි. මීට අමතරව තවත් නිගමන කිහිපයකට එළඹිය හැකි විය. පාඨක තොරතුරු අවශ්‍යතා අතර ප්‍රධානතම තොරතුරු අවශ්‍යතාවය වනුයේ අධ්‍යාපනික තොරතුරු වීම. පර්යේෂණයට යොදා ගත් පාඨකයින් 100 දෙනාගෙන් 93 දෙනෙකුම අධ්‍යාපනික තොරතුරු අවශ්‍යතාවය දක්වා ඇති අතර මෙම පාඨකයින් 93 දෙනාගෙන් ද පාඨකයින් 69 ක් සිය මූලික තොරතුරු අවශ්‍යතාවය ලෙස දක්වා ඇත්තේ අධ්‍යාපනික තොරතුරු වේ.

වර්තමානය වන විටත් මහජන පුස්තකාල පාඨකයින් තොරතුරු ලබා ගන්නා ප්‍රධාන මාධ්‍ය මුද්‍රිත මාධ්‍ය වීම.

විද්‍යුත් මාධ්‍ය සම්පත් පුස්තකාලය සතුව පැවතිය ද පාඨකයින් වැඩි කැමැත්තක් දක්වනුයේ මුද්‍රිත මාධ්‍ය භාවිත කිරීම සඳහාය. පොත්, පුවත්පත් / සඟරා පරිශීලනය කරන පාඨකයින් විශාල ප්‍රමාණයක් හඳුනා ගත හැකි අතර බොහොමයක් පාඨකයන් මහජන පුස්තකාලයට පැමිණෙණුයේ පුවත්පත් පරිශීලනය කිරීම සඳහාය.

මහජන පුස්තකාලය සේවාවන් අතරින් පාඨකයන් වැඩි පිරිසක් ලබා ගන්නා සේවාව වනුයේ කියවීමේ සේවාවයි.

මහජන පුස්තකාලය විසින් විවිධ සේවාවන් ක්‍රියාත්මක කළ ද පාඨකයින් වැඩි ප්‍රමාණයක් ලබා ගන්නා සේවාව වශයෙන් පුස්තකාලය තුළ කියවීම දැක්විය හැකිය. පොත්පත් බැහැර ගෙන යාමේ සේවාව සඳහා පාඨකයන්

ලබා දී ඇත්තේ අඩු ප්‍රමුඛතාවයකි. ඒ අනුව පත්තර කියවීම, සඟරා කියවීම, විනෝදාත්මක දේ කියවීම, රැකියා ඇබෑර්තු දැන ගැනීම සඳහා පාඨකයින් වැඩි උනන්දුවක් දක්වන බව පැහැදිලි වේ.

මහජන පුස්තකාල සේවා පිළිබඳ පාඨකයා සෑහීමකට පත් නොවීම, සේවා සම්පාදනයේ දී මහජන පුස්තකාලවලින් ලැබෙන මඟ පෙන්වීම ප්‍රමාණවත් නොවීම, මහජන පුස්තකාල මඟින් පාඨකයන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන කාර්යක්ෂම තොරතුරු සේවාවන් ක්‍රියාත්මක නොකිරීම, පුස්තකාලවල සේවා ප්‍රචාරණය, සේවා අලෙවිකරණය සාර්ථකව සිදු නොවීම, ප්‍රාදේශීය අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් මෙම අවශ්‍යතාවයන්ට සරිලන එකතුන්, සේවාවන් හා වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම, පුස්තකාල තුළ මනා තොරතුරු කළමනාකරණයක් ක්‍රියාත්මක නොවීම, පුස්තකාලය මඟින් කාර්යක්ෂමව කාලීන තොරතුරු සැපයීමේ සේවා ක්‍රියාත්මක නොකිරීම, මහජන පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර ප්‍රමාණවත් නොවීම, පුස්තකාල අතර පවතින සහයෝගීතාව දුර්වල මට්ටමක පැවතීම, පුස්තකාල අතර තොරතුරු සම්පත් හුවමාරුවක් සිදු නොවීම ආදී වශයෙන් පුස්තකාල තොරතුරු සේවා සම්බන්ධයෙන් ගැටලු හඳුනා ගත හැකි විය.

පුස්තකාල කාර්ය මණ්ඩලයේ සුහදශීලීත්වය අවමවීම, පුස්තකාල කාර්ය මණ්ඩලයේ අධ්‍යාපන තත්වය මහජන පුස්තකාල සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා අභියෝගයක් වීම, කාර්යමණ්ඩලයේ භාෂාමය හැකියාවන් තොරතුරු සේවා ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රමාණවත් නොවීම, පුස්තකාලයේ නොමැති තොරතුරු මූලාශ්‍ර සොයා එන පාඨකයන් සඳහා විධිමත් ක්‍රියා මාර්ගයක් අනුගමනය නොකිරීම, පුස්තකාල කාර්ය මණ්ඩලයට පාඨක තොරතුරු අවශ්‍යතාවයන් පිළිබඳ අවබෝධයක් නොමැති වීම වශයෙන් කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පවතින ගැටලු අනාවරණය කර ගනු ලැබීය.

පුස්තකාලයේ ද්‍රව්‍යමය සම්පත් ප්‍රමාණවත් නොවීම, පුස්තකාලය සතු පහසුකම් ප්‍රමාණවත් නොවීම, පුස්තකාලය පිළිබඳ පාඨක ආකර්ෂණය ඉතාමත් අවම මට්ටමක පැවතීම, වර්තමානය වන විටත් පුස්තකාල සාම්ප්‍රදායික මුහුණුවරක් ගැනීම ආදී වශයෙන් පුස්තකාලයන් සම්බන්ධයෙන් ගැටලු අනාවරණය කර ගනු ලැබීය.

පාඨකයා හා පුස්තකාල කාර්ය මණ්ඩලය අතර පවතින සන්නිවේදනය දුර්වල වීම, විමර්ශන සේවය පිළිබඳ පාඨකයන් තුළ අවබෝධයක් නොමැති වීම, පුස්තකාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා ජනතා සහභාගීත්වය අවම වීම, පුස්තකාලය තුළ විද්‍යුත් සම්පත් පැවැතිය ද එම මාධ්‍යයන් භාවිතය අවම මට්ටමක පැවතීම ආදී වශයෙන් පාඨක පැතිකඩ සම්බන්ධයෙන් ද ගැටලු අනාවරණය කර ගනු ලැබීය.

**යෝජනා**

1. විද්‍යුත් මාධ්‍ය භාවිතය සඳහා පාඨකයන් දැනුවත් කිරීම හා උනන්දුව ඇති කිරීම.
2. මුද්‍රිත මාධ්‍ය මෙන්ම විද්‍යුත් මාධ්‍ය ද මනා ලෙස කළමනාකරණය කර ගනිමින් පවත්වා ගෙන යාම සඳහා කාර්යමණ්ඩලය යොමු කිරීම.
3. පුස්තකාල සේවා ප්‍රවර්ධනය හා ප්‍රචාරණය කිරීම.
4. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
5. පුස්තකාලය තුළ සාමූහකි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අවකාශ සැලසීම.
6. ප්‍රාදේශීය තොරතුරු අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වෙමින් ඊට අදාළ තොරතුරු සේවා හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. පුස්තකාල සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. පුස්තකාලය තුළ සාර්ථක විමර්ශන සේවාවක් ක්‍රියාත්මක කිරීම හා විමර්ශන සේවාව පිළිබඳ පාඨකයන් දැනුවත් කිරීම.
9. පුස්තකාලය තුළ නොමැති තොරතුරු සොයා එන පාඨකයන් සඳහා විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
10. පුස්තකාලය හා පාඨකයන් අතර මනා සන්නිවේදනයක් පවත්වා ගෙන යාම.
11. ක්‍රියාකාරී පාඨක සමාජයක් පවත්වා ගෙන යාම.
12. කාර්යමණ්ඩලයේ සන්නිවේදන හැකියාව වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. පුස්තකාලයේ දැක්ම, මෙහෙවර, අරමුණු, සේවා සහ වැඩසටහන්, දුරකථන අංක, ලිපිනය සහ අනෙකුත් තොරතුරු ඇතුළත් කරමින් අත් පත්‍රිකාවක් නිර්මාණය කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


කාරියවසම්, බී. ජී. සුනේත්‍රා. (2010). Sri Lanka Library Review : දැයෙහි සංවර්ධනයට උරදෙන මහජන පුස්තකාල හා බැඳි ව්‍යාප්ති සේවා. කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමය.

ගුණසේකර, ධනපාල. (1998). පුස්තකාල සේවාවේ මූලිකාංග. කොළඹ : ගොඩගේ.

ගුණසේකර, ධනපාල. (2007). පාසල් පුස්තකාල සේවාව. විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පුංචි බොරැල්ල.

ජයතිස්ස, එල්. ඒ. (1993), පුස්තකාල කළමනාකරණය, කැලණිය : කර්තෘ.

දොඩාවත්ත, සිරිපාල. (1997). ග්‍රාමීය

මහජන පුස්තකාල හා ප්‍රජා සමූහ රටාව. පුස්තකාල ප්‍රවෘත්ති. මහජන පුස්තකාල පිළිබඳ ප්‍රඥප්තිය (1972). මාගම්මන, ප්‍රේමරත්න (2006), පුස්තකාල හා විශ්ව දැනුම, කොළඹ : ගොඩගේ.

වීරකෝන්, එස්. පී. (2005). ශ්‍රී ලංකාවේ වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපන පුස්තකාලය මගින් පාඨක තොරතුරු අවශ්‍යතා සපුරාලීම පිළිබඳ අධ්‍යනයක්. සමාජීය විද්‍යාපති උපාධි නිබන්ධනය, කැලණිය විශ්වවිද්‍යාලය.

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ. (2001). පුස්තකාල ඉතිහාසය, පුස්තකාල ආරම්භයේ සිට නුතන යුගය දක්වා සංක්ෂිප්ත විවරණයකි. කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ. (2012). පොතපත වතගොත. කර්තෘ, දළුගම.

Aldershort, Ray Prytherch. (1987). Harrold's Librarian Glossary and Reference Book. Gorwer.

Collins English Dictionary-Complete and Unabridged Harper Collins Publishers (and). complete and Unabriged in Collins English Dictonary. Retrieved October 2, 2018, from (2003)[online,2018.10.02] http:// WWW.thefreedictionary.com.mobile¬library

Gupta, Jyotsna (2005), Extension services and Public Relations of Libraries, Kurukshetra

University, Kurukshetra, http:// WWW.foxitsoftware.com

Harrod, L.A. (1997), Harrold' Librarian Glossary.

Paisle, William J. (1986)Information and Uses, Annual Review of information Science and Technology, p.1-30.



NATIONAL LIBRARY OF SRI LANKA

National Library & Documentation Services Board
14, Independence Avenue
Colombo 07
Sri Lanka

ISSN 2357-2973

9 772357 297006